# අන්තරාවලෝකන

## ශාස්ත්‍රීය ග්‍රන්ථ මාලා 01

## මහාචාර්ය සිරිමල් රණවැල්ල උපහාර කලාපය



ප්‍රධාන සංස්කාරක - දේව මයිකල් ද සිල්වා

සහාය සංස්කරණය - එන්. එච්.ටී අනුරුද්ධ
සංජු රංගොඩගේ

# අන්තරාවලෝකන
# ශාස්ත්‍රීය ග්‍රන්ථ මාලා 01

මහාචාර්ය සිරිමල් රණවැල්ල
උපහාර කලාපය

# අන්තරාවලෝකන
# ශාස්ත්‍රීය ග්‍රන්ථ මාලා 01

මහාචාර්ය සිරිමල් රණවැල්ල
උපහාර කලාපය


ප්‍රධාන සංස්කාරක:

**ආචාර්ය දේව මයිකල් ද සිල්වා**

සහාය සංස්කරණය:

**එන්. එච්. ටී. අනුරුද්ධ**

**සංජු රංගොඩගේ**



**සංස්කෘතික කේන්ද්‍රය**

**රුහුණ විශ්වවිද්‍යාලය - මාතර**

ප්‍රථම මුද්‍රණය: 2021
අන්තරාවලෝකන (ශාස්ත්‍රීය ග්‍රන්ථ මාලා 01)
මහාචාර්ය සිරිමල් රණවැල්ල උපහාර කලාපය
© සංස්කෘතික කේන්ද්‍රය රුහුණ විශ්වවිද්‍යාලය
සියලුම හිමිකම් ඇවරිණි
ISBN 978-624-5553-02-0

පිටකවරය :

සංජු රංගොඩගේ

පිටකවරයේ සේයාරුව :

සංඛ ගාල්ලගේ

පරිගණක අක්ෂර සංයෝජනය:

එන්. එච්. ටී. අනුරුද්ධ

පරිගණක පිටු සැකසුම:

ගාමිණී ධම්මික
D2 ග්‍රැෆික්ස්
පාදුක්ක.

ප්‍රකාශනය:

සංස්කෘතික කේන්ද්‍රය
රුහුණ විශ්වවිද්‍යාලය

මුද්‍රණය:

සංස්කෘතික කේන්ද්‍රය
රුහුණ විශ්වවිද්‍යාලය,
මාතර.

# රුහුණ විශ්වවිද්‍යාලයේ කුලපති නාහිමිපාණන්ගේ සුභාශංසනයයි

රුහුණ විශ්ව විද්‍යාලයේ සංස්කෘතික කේන්ද්‍රයේ ප්‍රකාශනයක් ලෙස අන්තරාවලෝකන ග්‍රන්ථ මාලාවේ අංක 01 මහාචාර්ය සිරිමල් රණවැල්ල අනුස්මරණ කලාපය වෙනුවෙන් සුබ පැතුම් පණිවුඩයක් එවනුයේ බලවත් සොම්නසිනි.

මින් වසර 45 කට පෙර කැලණිය විශ්ව විද්‍යාලයේ ප්‍රථම වර්ෂ ශිෂ්‍යයන් සඳහා පදනම් පාඨමාලාවට සහභාගි වෙමින් එහි එක් දේශනයක් සඳහා පැමිණි සිරිමල් රණවැල්ල මහාචාර්යතුමා අපට හොඳින් මතකය. ආර්යාගමනය සම්බන්ධයෙන් එක් ප්‍රබල මතයක් ඉදිරිපත් කළ එතුමා සැකෙවින් එය තහවුරු කළේය. ඉන් පසුව එතුමාගේ දේශනයකට සවන් දීමට විශ්ව විද්‍යාලයේ අපට නොලැබුනේ අප විෂයක් වශයෙන් ඉතිහාසය නොහදාළ බැවිනි. එවකට විශ්ව විද්‍යාල සේවයේ යෙදී සිටි මහාචාර්ය අමරදාස ලියනගමගේ මහාචාර්ය මංගල ඉලංගසිංහ හා එතුමාගේ විශේෂ දේශනයක් තිබුනහොත් නොවරදවා ඒවාට සහභාගී වීමු. ඊට වසර දෙකකට පමණ පසු රුහුණ විශ්ව විද්‍යාල ආයතනය සඳහා ඉතිහාසය අධ්‍යයන අංශයේම සේවය කළ මහාචාර්ය කොතලාවල රුහුණේ මුල්ම අධ්‍යක්ෂවරයා ලෙස පත්ව යාමෙන් අනතුරුව රුහුණ විශ්ව විද්‍යාලයේ ආරම්භක අධ්‍යතනාංශයක් ලෙස ඉතිහාස විෂයද ඇතුළත් විය. එම අධ්‍යයනාංශයේ පළමු අංශ ප්‍රධාන ලෙස මහාචාර්ය සිරිමල් රණවැල්ල මහතා පත්වීම ළදරු අවධියේ පැමිණි රුහුණ විශ්ව විද්‍යාලයට මහත් ශක්තියක් විය. ඉතා අවම පහසුකම් යටතේ සේවය කරන්නට සිදුවීම නිසා බොහෝ ප්‍රවීණ ආචාර්යවරුන් රුහුණට පැමිණීමට කැමැත්තක් දැක්වූයේ නැත. එවකට මහාචාර්යවරයකු ලෙස සේවය කළ රණවැල්ල මහතා ඉතා කුඩා කාමරයක සිටිමින් අංශ ප්‍රධාන, පීඨාධිපති, පමණක් නොව වැඩ

බලන උප කුලපති ලෙසද තමාගේ සේවය ලබා දෙමින් රුහුණ විශ්ව විද්‍යාලයේ අභිවෘද්ධිය වෙනුවෙන් මහත් ඇප කැප වීමෙන් කටයුතු කළේය. විවිධ තනතුරු දැරුවත් ශාස්ත්‍රීය පර්යේෂණ අත් නොහැරී එතුමා පොත්පත් පරිශීලනය සඳහා පුස්තකාලය පමණක් නොව පොත්පත් අප සේවය කළ සිංහල ශබ්දකෝෂ පුස්තකාලය ද, පුරාවිද්‍යා පුස්තකාලය ද පරිහරණය කිරීමට නොයෙක් විට පැමිණි බව අපට මතකය. වැඩි කතා බහක් නැති එතුමා, තමන් පැමිණි කටයුත්ත සාමාන්‍ය පාඨකයකු මෙන් අනතිමානීව සිදු කළ අතර යම්කිසි ගැටලුවක් විමසුව හොත් ඉතා නිරවුල්ව සාධක සහිතව පැහැදිලි කරදීම එතුමාගේ සිරිතයි.

දශක හයකට ආසන්න කාලයක් පුරා අවසන් මොහොත දක්වාම ශාස්ත්‍රීය පර්යේශන වල නියුතු වූ එතුමා ඒ සියල්ල ජාතියට දායාද කොට පසුගියදා පරලෝ සැපත් විය. එතුමාගේ ශාස්ත්‍රීය සේවාව ඇගයුමට ලක් කරමින් ග්‍රන්ථයක් එළි දැක්වීමට කටයුතු කිරීම පිළිබඳ රුහුණ විශ්ව විද්‍යාලයේ සංස්කෘතික කේන්ද්‍රයේ අධ්‍යක්ෂකවරයාට මාගේ ප්‍රශංසාව හිමිවේ.

මෙයට,

ධර්මශාස්ත්‍රෝන්නතිකාමී,

**අකුරටියේ නන්ද නායක මහාථේර**

කුලපති,

රුහුණ විශ්ව විද්‍යාලය.

# රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමාගේ පණිවුඩය

රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රය විසින් දියත් කරනු ලබන වැඩසටහන් අතරට අලුතින්ම හඳුන්වා දෙනු ලබන පිදිය යුත්තන් පිදීමේ උතුම් ගුණාංගය අර්ථවත් කරවන ***"අන්තරාවලෝකන ග්‍රන්ථ මාලා"*** නම් වූ ශාස්ත්‍රීය සංග්‍රහයේ සමාරම්භක පියවරට යොදා ගෙන ඇති මහාචාර්ය සිරිමල් රණවැල්ල කලාපයට රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වශයෙන් සුභපැතුම් පණිවුඩයක් ගෙන එනු ලබනුයේ අපිරිමිත ආශ්වාදයකින් හා ආහ්ලාදායකයින් යුක්තව ය.

රණවැල්ලයන් වර්ෂ 1979 දී රුහුණ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රථම මහචාර්යා බවට ද, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපති ධූරය ද හොබවා වර්ෂ 1989 දී සේවයෙන් විශ්‍රාම ලැබී ය. මා රුහුණ සරසවියේ වෛද්‍ය පීඨ ශිෂ්‍යයෙකු ලෙස 1979 වර්යේ දී ලියාපදිංචිව කොළඹ වෛද්‍ය පීඨයේ මාස 18 ක පමණ කාලයක් අධ්‍යාපන කටයුතුවල නියැළී පෙරලා රුහුණ වෛද්‍ය පීඨයට පැමිණ 1981 සිට 1984 දක්වා අධ්‍යයන කටයුතුවල නිරතව සිටිය දී වරින් වර හමු වූ එතුමා බොහෝ දුරට නිහඬ චරිතයක් වශයෙන් හඳුනාගෙන සිටියෙමි. මෙම නිහඬ පුද්ගලයා වූ කලී ශ්‍රී ලාංකීය ජනතාව මහා ප්‍රාඥයෙකු වශයෙන් පිළිගනු ලැබූ මහාචාර්ය සිරිමල් රණවැල්ලයන් බව දැන ගනු ලැබුවේ තැන තැන සිදු වූ කසු කුසුවලිනි.

සැබැවින්ම මහාචාර්ය සිරිමල් රණවැල්ල යනු අතීතය පිළිබඳව තොරතුරු එළිපෙහෙළි කරමින් ශ්‍රී ලාංකේය ඉතිහාසය ලෝකයා හමුවේ විවර කිරීමට දායකත්වයක් සැපයූ කුෂාග්‍ර පඬිවරයෙකි. ඉතිහාසය විෂය ශික්ෂණයේ ආලෝකය ලබමින් පුරාවිද්‍යාව ජනගත

කිරීම සඳහා අභිලේඛන විද්‍යාව ඔස්සේ, පර්යේෂණයන් මෙහෙයවමින් ඒවායින් අනාවරණය වන සමකාලීන ශ්‍රී ලාංකේය අතීතය පර්යේෂකයන් සහ සාමාන්‍ය ජනතාව අතරට ගෙනයාම සඳහා, සිය දිවියේ අවසන් කාල සීමාව වනතෙක් ම කටයුතු කළේ ය. දක්ෂිණ ශ්‍රී ලංකාවේ කොග්ගල ග්‍රාමයේ උපන් ගාල්ලගේ සිරිමල් රණවැල්ල දකුණට ආවේණික වූ ශ්‍රී ලාංකේය අනන්‍යතාවයෙන් හෙබි විද්වතෙකු වශයෙන් හැඳින්වීම යුක්ති යුක්ත ය. තවද දකුණු ලංකාවෙන් බිහිවී මෙරටට සේවයක් කළ මහැදුරු පරණවිතානයන් හා මුනිදස් කුමාරතුංගයන් ගෙනහැර පෑ අභිනන්දනය රණවැල්ලයන්ට ද එකසේ වලංගු වෙතැයි සිතමි. ඒ අනුව කුමරතුගුවන් දක්වා ලූ ආකාරයට ***"තනතුරු නිසා පරණවිතාන බැබලුනේ නැත. පරණවිතානයන් නිසා තනතුර බැබලුණි"*** යන කියමන රණවැල්ලයන්ට ද වැහැරීම එකසේ යෝග්‍යය වන්නේ ය.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ එහි ගුණාත්මක අන්වේක්ෂණයන් රඳා පවත්නේ සරසවි ඇදුරන් ගේ පර්යේෂණ සම්ප්‍රදාය සහ පාණ්ඩිත්‍ය මතය යන්න අවිවාදයෙන් පිළිගත යුත්තකි. ඒ අනුව රුහුණ සරසවිය ශ්‍රී ලාංකේය දැනුම් සම්ප්‍රදාය විෂයේ අත්‍යාවශ්‍ය ආයතනයක් වන බැව් පසක් කිරීමට රණවැල්ලයන් ගේ ශාස්ත්‍රීය ආවේෂණය ඉතාමත්ම වැදගත් කරුණක් විය. මහාචාර්ය පරණවිතානයන්ගෙන් පසු ශ්‍රී ලාංකේය පුරාවිද්‍යා ක්ෂේත්‍රය තුළ අභිලේඛන විද්‍යාව බිඳී යා නොදී මහත් වූ පරිශ්‍රමයකින් රැකබලාගත්තෝ නම් අනෙකෙකු නොව මහැදුරු සිරිමල් රණවැල්ලයෝම ය. 1983 වර්ෂයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ආරාධනයෙන් ක්‍රි. ව. 8 - 9 සියවස් නියෝජනය කරන ශිලා ලේඛන ඇසුරින් ශ්‍රී ලංකා ශිලා ලේඛන සංග්‍රහයේ පස්වන කාණ්ඩයේ පළමුවන වෙළුම සංස්කරණය කිරීම එතුමා ගේ ශාස්ත්‍රීය ජීවිතයේ මෙන් ම රුහුණ විශ්වවිද්‍යාලය ලද ජයග්‍රණයක් වශයෙන් ද සැළකිය හැකි ය. ඉතිහාසඥයෙකු වශයෙන් පමණක් නොව මහාචාර්ය සිරිමල් රණවැල්ල භාෂාන්තරඥානයෙන් ද හෙබි ඓතිහාසික වාග්විද්‍යාඥයෙකු ගේ ශික්ෂණයෙන් ද පෝෂණයක් ලැබූ වාග්විද්‍යාඥයෙකු වශයෙන් ද සැලකිය හැකියි ප්‍රාචීන ප්‍රතිචීන භාෂා

ප්‍රභේදයන්හි තමන් සතු නිපුණත්වය මැනවින් ප්‍රකට කළ අවස්ථාවක් වශයෙන් ශ්‍රී ලංකාවේ ශිලා ලේඛන සහ අභිලේඛනයන්හි දුරවබෝධ පදමාලාවට අර්ථ සැපයීම පිණිස රචනා කරන ලද සිංහල සෙල්ලිපි වදන් ආකාරාදියත්, එහි ඉංග්‍රීසි කෘතිය වන Dictionary of Sinhala Epigraphical Words යන කෘති ද්විත්වය පෙන්විය හැකි ය. ඒ තුළින් රණවැල්ලයන් අපේක්ෂා කරන ලද්දේ ඉංග්‍රීසි භාෂා ඥානයට පමණක් ආමන්ත්‍රණය කළ ශ්‍රී ලාංකේය ඉතිහාසය ශික්ෂණය පිළිබඳ දැනුවත්භාවය සාමාන්‍ය සිංහල පර්යේෂකයා වෙත ද ප්‍රවේශ කිරීම යි.

පොතපතින් ලබාගත් දැනුමත්, සාමාජීය වශයෙන් උකහාගත් ජීවිත පරිඥානයත් ඔස්සේ සරල චාම් දිවිපෙවෙතක් ගත කළ මහාචාර්ය සිරිමල් රණවැල්ලයෝ සිය ජීවිතය ශාස්ත්‍රීය ශික්ෂණය සහ සාහිත්‍ය පරිඥානය කෙරෙහිම අඛණ්ඩව රඳවා ගැන්මේ සාමාර්ථයක් ඇත්තෙක් විය. ව්‍යාජ අවේක්ෂණයන් ගෙන් වියුක්තව සැබෑ ඉතිහාසයක් පිළිබඳ ශාස්ත්‍රීය සංකතනයක් ගෙනහැර පෑමට රණවැල්ලයෝ නිරන්තරයෙන් උත්සාහවත් විය. අධ්‍යයන ශික්ෂණය ශික්ෂණයට පමණක් සීමා නොකොට මානුෂීයත්වය ද ගරු කළ ඒ මහතා එක් අවස්ථාවෙක රටම වෙළාගත් භීම සමයක දී රුහුණ සරසවියේ වැඩ බලන උපකුලපති ධුරයට පත්ව සරසවියට නායකත්වය දීම තුළ ඔහු සතු මානුෂීයත්වයේ ප්‍රභාව අපි හඳුනාගත්තෙමු, ලෝහිත පිපාසායෙන් පෙළෙන්නන් ඉදිරියේ සරසවි සිසුවා අසරණ නොකොට ඔහු ආරක්ෂා කරනුවස් රණවැල්ලයන්ට ගතහැකි සෑම උත්සාහයකම නිරතවීමට ඔහු වගබලාගෙන තිබුණි.

සිය ජීවිතයේ අවසාන සමය තෙක් ම මහැදුරු රණවැල්ල ඉතිහාස පර්යේෂකරණයේ නිමග්න ව සිටි අතර එහි ආසන්නතම විපාක ඵලය වශයෙන් ඔහු විසින් එළි දක්වන ලද 'පුරාතන ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය' යන කෘතිය ක්ෂේත්‍රය තුළ විද්වත් ජනයා ගේ බුද්ධි ප්‍රභාවය නැංවීමට උපකාරී වන්නක් වශයෙන් ද හඳුන්වාදීමට කැමැත්තෙමි. ඉකුත් වසරේ දෙසැම්බර් 26 වන දී අප අතරින් සමුගත් රුහුණ විශ්වවිද්‍යාලය ගොඩනැගීමෙහිලා අනුපමේය

**මෙහෙයක් ඉටු කළ මහාචාර්ය සිරිමල් රණවැල්ලයන්ගේ කාර්ය සංසිද්ධිය විදහා දැක්වීම සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කේන්ද්‍රයේ *අන්තරාවලෝකන ග්‍රන්ථ මාලා 01*** යොදා ගැනීම පිළිබඳව **සංස්කෘතික කේන්ද්‍රයට මාගේ ස්තුතිය පුද කරන අතරම තව තවදුරටත් මෙම ප්‍රකාශන මාලාව අඛණ්ඩව සාර්ථකව ඉදිරියට ගෙන යාමට අවශ්‍ය ශක්තිය ධෛර්යය නොඅඩුව ප්‍රාර්ථනා කරමි.**

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන**

උපකුලපති

රුහුණ විශ්වවිද්‍යාලය

# රුහුණ විශ්වවිද්‍යාලයේ
# නියෝජ්‍ය උපකුලපතිතුමාගේ පණිවුඩය

රුහුණ විශ්වවිද්‍යාලයේ නොමැකෙන ඉතිහාසය තුළ ජීවමානිත සේවාවන් රැසක් කළ මහාචාර්ය සිරිමල් රණවැල්ල ශ්‍රීමතාණන්ගේ ශාස්ත්‍රීය මෙහෙවර අගයනු වස් රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කේන්ද්‍රයේ නවමු සංකල්පයක් ලෙසින් එළිදක්වනු ලබන "අන්තරාවලෝකන ශාස්ත්‍රීය සංග්‍රහය - පළමු අංකය" ග්‍රන්ථයට සුභාසිංශන පණිවුඩයක් එක්කිරීමට ලැබීම මා ලද මහඟු අවස්ථාවක් ලෙස සලකමි.

1921 කොග්ගල ග්‍රාමයෙහි උපත ලද රණවැල්ල සිරිමතුන් ගාල්ල උණවටුන බෞද්ධ මිශ්‍ර පාසලෙන් අධ්‍යාපනය හදාරා ඉතා විශිෂ්ට ලෙස උසස් පෙළ සමත්ව 1953 දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ මොහු 1957 දී සරසවියෙන් පිටවූයේ ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධියක් ද සහිතව ය. 1964 දී ලන්ඩන් විශ්වවිද්‍යාලයකට ඇතුළත්ව 1966 දී **"A Political History of Ruhuna"** පර්යේෂණාත්මක කෘතිය හරහා ආචාර්ය උපාධිය ලබාගත් පසු නැවත සිය රටට පැමිණ පුරා අවුරුදු 22 ක කාලයක් කැලණිය විශ්වවිද්‍යාලයෙහි ඉගැන්වීම් කටයුතුවල ද නිරතව ඇත.

1979 දී රුහුණ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ ප්‍රථම මහාචාර්යවරයා ලෙසට පත්ව ඉතිහාස අධ්‍යයනාංශයෙහි ප්‍රථම අංශ ප්‍රධානවරයා ලෙස ද 1979 - 1989 කාලසීමාවේ දී මානව ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති ලෙස ද කටයුතු කළ මෙතුමා ඉතා දක්ෂ පරිපාලකයෙකු ලෙස ඉතිහාසගතව ඇත. ශ්‍රී ලංකාව දේශපාලන අධිකාරියෙහි කැළඹවීම්වල ගිලීගිය සමයක රුහුණ විශ්වවිද්‍යාලීය

පරිපාලන ව්‍යුහය ශක්තිමත් කිරීමට කටයුතු කළ රණවැල්ල මහතා 1988. 04. 25 - 1989. 12. 27 දක්වා වැඩබලන උපකුලපති ලෙස කටයුතු කරමින් විශ්වවිද්‍යාල පරිපාලනය තුළ පමණක් නොව ශිෂ්‍ය ප්‍රජාවගේ පවා ප්‍රශංසාවට ගෞරවාදරයට පත්විය.

එලෙස වෘත්තීය වගකීම් සහ අවිවේකී බව ඔහුගේ දැනුම් පිපාසය යටපත් කිරීමට ප්‍රමාණවත් නොවූ අතර ඉතා විශිෂ්ට පර්යේෂණ රාශියක් පුරාවිද්‍යා ඉතිහාසයට දායාද කළ මහා උගතෙකි. ලංකාවේ අභිලේඛන, සෙල්ලිපි පිළිබඳ හැදෑරීමේ දී සිරිමල් රණවැල්ල නාමය පරිශීලනය කළ යුතුම ය. නව්‍ය දෘෂ්ටි කෝණයෙහි ප්‍රවීණත්වය තුළින් සිංහල, පාලි සහ සංස්කෘතික දැනුම යාකරමින් ඉතිහාසය ඒකාබද්ධ කිරීමට ඔහු දැරූ උත්සාහය අප ලැබූ විශාල ජයග්‍රහණයකි. 2000 වර්ෂයේ දී පලකළ "සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය" තුළ රණවැල්ලයන්ගේ දැනුම, වාග් කෞෂල්‍යය මනාව පිළිබිඹු කරන අතර එය ඉතා අනර්ඝ වන්නේ තත් ක්ෂේත්‍රයට ඉන් ලැබෙන පිටුවහල හේතුවෙනි.

මෙතුමාගේ ශාස්ත්‍රීය සේවය අගයනු වස් රුහුණ සරසවියෙන් සම්මානිත මහචාර්ය පදවිය ද, කැලණිය විශ්වවිද්‍යාලයෙන් සාහිත්‍ය සූරි ගෞරවය ද පිරිනමා ඇති මෙවන් වියතෙකුගේ ශාස්ත්‍රීය සේවය ඇගයීමට රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කේන්ද්‍රය දරණ උත්සාහය මා බෙහෙවින් අගය කරමි.

**මහාචාර්ය ඒ. පී. සමන් චන්දන**
නියෝජ්‍ය උපකුලපති
රුහුණ විශ්වවිද්‍යාලය

# මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ පීඨාධිපතිතුමාගේ පණිවුඩය

රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කේන්ද්‍රය විසින් ප්‍රකාශයට පත්කරන ***"අන්තරාවලෝකන ග්‍රන්ථ මාලා" ශාස්ත්‍රීය සංග්‍රහයේ මහැදුරු සිරිමල් රණවැල්ල අංකය*** වෙනුවෙන් සුභාශිංසන පණිවුඩයක් නිකුත් කරනුයේ හදපිරි සතුටිනි.

ශ්‍රී ලාංකේය බුද්ධිමය ප්‍රභාව ඇති කළ විද්වතුන් අතරින් 20 වන සියවසේ දෙවන කාර්තුවේ දී ආරම්භ වූ නව ඉතිහාස ශික්ෂණය තුළ කැපී පෙනෙන විද්වතෙකු වශයෙන් මහාචාර්ය සිරිමල් රණවැල්ලයන් අවිවාදයෙන් හඳුන්වා දිය හැකි ය. ඉතිහාස ශික්ෂණයේ ආලෝකය ලබමින් මහාචාර්ය සෙනරත් පරණවිතානයන්ගෙන් පසු ශිලා ලේඛන ක්ෂේත්‍රයේ ප්‍රභාව ඇති කිරීමට සිරිමල් රණවැල්ලයෝ සමත් වූහ. 1979 වර්ෂයේ දී රුහුණ විශ්වවිද්‍යාලේ ඉතිහාසය අධ්‍යයනාංශයේ ආරම්භක මහාචාර්යවරයා බවට පත් වූ සිරිමල් රණවැල්ලයන් වචනයෙහි පරිසමාප්ත අර්ථයෙන් ම ප්‍රතිභාපූර්ණ විද්වතෙකු විය. කිසිවිටෙකත් සිය දැනුම එක් විෂයක් කෙරෙහි සීමා නොකළ ඔහු ශික්ෂණයන් කිහිපයක් ඔස්සේ ම සිය පර්යේෂණයන් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබුවේ ය. වර්ෂ 1957 දී ප්‍රාචීන ඉතිහාසය පිළිබඳවත්, සංස්කෘත, පාළි සහ සිංහල ආදී ප්‍රාචීන භාෂා ශික්ෂණයන්හි සංවිධිත දැනුමත් සමඟින් සිය උපාධිය හිමි කරගන්නා රණවැල්ලයන් වර්ෂ 1966 දී ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් සිය ආචාර්ය උපාධිය හිමිකරගනු ලබන්නේ 'A Political History of Rohana from 991-1255 AD යන පර්යේෂණය නිබන්ධය සඳහා ය.

පුරාතන අවධියේ සිට මධ්‍යතන අවධිය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළ දේශපාලනික, සමාජ ආර්ථික ඉතිහාසය පිළිබඳව සාම්ප්‍රදායික ඉතිහාසයෙන් ඔබ්බට යමින් අභිලේඛන සාධක ඔස්සේ පර්යේෂණයන් මෙහෙයවීම රණවැල්ලයන්ගේ පර්යේෂණ සම්ප්‍රදායේ මුඛ්‍ය ලක්ෂණය බවට පත් විය. හුදෙක් මේ සඳහා ඔහු ගේ පෙරදිග සහ අපරදිග භාෂා ඥානය වැදගත් විය. වරෙක ඔහු මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් කියැවූ ශිලා ලිපියක අර්ථය නිවැරදිව කියවා පළකරනු ලබ යි. තවත් වරෙක පරණවිතානයන් විවරණය කළ ශිලා ලේඛනාර්ථයන්හි නිරුක්තීන්හි ගැටලු සහගත තැන් පෙන්වා දෙයි. මේ වනාහි සැබෑ වශයෙන් ම ඉතිහාසඥයෙකුගේ තත්ත්වයේ සිට සිදු කළ නොහැකි කාර්යයන් ය. රණවැල්ල නම් වූ චරිතය තුළ ශික්ෂණයන් කිහිපයකට අයත් බුද්ධිමය ප්‍රාභාවන් විය. ඔහු ගේ මේ බුද්ධිමය ප්‍රභාවය නිසා ම ඔහු ගේ සේවය ලද රුහුණ සරසවිය ද නිරන්තරයෙන් කීර්තියට පත් වියී මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා විෂය ක්ෂේත්‍රයන්හි තිබිය යුතු ගුණාත්මක තත්ත්වාරෝපණයන්, පර්යේෂණ ක්‍රමවේදයන්, සම්ප්‍රදායන් සහ එකී විෂයන් තුළ පර්යේෂකයෙකු ගේ හැසිරීම කෙබඳු ද යන්න ආදර්ශයට ගත හැකි චරිතයක් මේ සියවස තුළ දී පෙන්විය හැකි නම් ඒ මහාචාර්ය සිරිමල් රණවැල්ලයන් ම බව පැවසීම සාධාරණයැයි සිතමි. සිය ජීවිතයේ අවසාන කාලය වන තෙක්ම රණවැල්ල මහතා පර්යේෂණ කාර්යයෙහි නිමග්නව සිටියේ ය. පර්යේෂණ කෘති සම්පාදනය කළේ ය.

ඉංග්‍රීසි භාෂාවට පමණක් සීමාවී තිබූ පුරාවිද්‍යාව සාමාන්‍ය ප්‍රජාව වෙත ගෙනයෑම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඇතැම් ශිලා ලේඛනයන් සිංහල භාෂාවට පරිවර්තනය කළේ ය. ක්‍රි. ව. 8 වන සියවසින් පසුව ශ්‍රී ලංකාවේ පළ වූ ශිලා ලේඛනයන් කියවා ප්‍රසිද්ධියට පත් කළ රණවැල්ල මහතා විසින් රචිත පර්යේෂණ ලිපි සංඛ්‍යාව 200 ඉක්මවා සිටී. රුහුණ විශ්වවිද්‍යාලයෙන් විශ්‍රාම යනතෙක් ම රණවැල්ල මහතා විශ්වවිද්‍යාලය තුළ ශාස්ත්‍රීය වශයෙන් මෙන් ම පරිපාලන වශයෙන් ද සිය වගකීම් නොපිරිහෙලා ඉටු

කරනු ලැබුවේ ය. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා ගෙන් පසුව Inscriptions of Ceylon යන ශිලා ලේඛන සංග්‍රහයේ සංස්කාරකවරයා වශයෙන් මහාචාර්ය සිරිමල් රණවැල්ල මහතා මෙරට පුරාවිද්‍යා ක්ෂේත්‍රය වෙනුවෙන් මහත් දායකත්වයක් දැක්වූයේ ය. මේ අග්‍රගණ්‍ය ප්‍රාඥයා ශ්‍රී ලාංකේය ඉතිහාසය සහ පුරාවිද්‍යා ක්ෂේත්‍රයට විශාල හිදැසක් එක් කරමින් පසුගිය වසරේ 26 වන දින අභාවයට පත් විය.

එතුමා විසින් රුහුණ විශ්වවිද්‍යාලයට කරන ලද මාහැඟි සේවය හා පොදුවේ ඉතිහාසය හා පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රයට සංස්කෘතික කේන්ද්‍රය විසින් එළිදක්වනු ලබන ***අන්තරාවලෝකන ග්‍රන්ථමාලා සංග්‍රහයේ ප්‍රථම පියවර*** යොදා ගැනීම සම්බන්ධයෙන් මාගේ ප්‍රණාමය සංස්කෘතික කේන්ද්‍රයට පුද කරනු කැමැත්තෙමි.

**මහාචාර්ය උපාලි පන්නිලගේ**
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය.

# ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශ ප්‍රධානතුමියගේ පණිවුඩය

රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රථම ඉතිහාසය මහාචාර්යවරයා වශයෙන් 1979 දී පත්වීම ලැබුවේ සිරිමල් රණවැල්ල මැතිඳුන් ය. ප්‍රථම ඉතිහාසය මහාචාර්යවරයා පමණක් නොව ඉතිහාසය අධ්‍යයනාංශයයෙහි ප්‍රථම අංශාධිපතිවරයා වූයේ ද රණවැල්ලයෝ ම ය. අප කථානායකයා 1979-1989 කලා හා මානව ශාස්ත්‍ර පීඨයෙහි පීඨාධිපතිවරයා ද විය. ශ්‍රී ලංකාව, දේශපාලන කැලඹීම්වල ගිලී ගිය සමයක රුහුණ විශ්වවිද්‍යාලයේ වැඩබලන උපකුලපතිවරයා ලෙස ඔහු විසින් ඉටු කළ මෙහෙවර කිසිවකුට අමතක කළ නො හැකි ය. විශ්වවිද්‍යාල ඉතිහාසයේ වඩාත්ම කරදරකාරී හා කැලඹිලි සහිත කාලපරිච්ඡේදයක ඉතා ඉක්මණින් ශිෂ්‍යයන්ගෙන්, අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් උපරිම ගෞරවයට පාත්‍ර වෙමින් දූරදර්ශී ව ඉවසීමෙන් කටයුතු කොට රුහුණ විශ්වවිද්‍යාලය ඔසවා තැබීමට අප මහාචාර්යවරයාට හැකි විය. ග්‍රන්ථකරණයෙන් ලැබෙන කීර්ති නාමය විශ්වවිද්‍යාල ආචාර්යවරයා ප්‍රභාස්වර වීමට ප්‍රමුඛ හේතුවක් වේ. අත් නොහළ වීර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් රණවැල්ලයන් විසින් ගුණාත්මක භාවයෙන් විශිෂ්ට, අනර්ඝ පර්යේෂණ ග්‍රන්ථ සහ ලේඛන රාශියක් ඉතිහාසය හා පුරාවිද්‍යා ක්ෂේත්‍රයට දායාදිත ය. මහාචාර්ය සෙනරත් පරණවිතානට පසු, ශ්‍රී ලංකාවේ අභිලේඛන විෂය ක්ෂේත්‍රයට පහළ වූ ප්‍රවීණතම විද්වතා වශයෙන් මහාචාර්ය සිරිමල් රණවැල්ල හඳුන්වාදීම කිසිවකුගේ විරෝධයට හේතුවක් නොවනු ඇත. සිංහල, පාලි සහ සංස්කෘත පිළිබඳ ඔහුගේ දැනුම ඔස්සේ ශිලාලේඛන නැවත අර්ථකථනය කිරීමටත්, දෝෂ නිවැරදි කිරීමට හා මෙතෙක් අපැහැදිලි වී ඇති වාක්‍යය පැහැදිලි කිරීමටත් ඔහුට හැකි විය.

ශාස්ත්‍රීය ලිපි 250කට වැඩි ප්‍රමාණයක් සහ පොත් 15ක් පමණ ඔහු විසින් ප්‍රකාශයට පත් කර තිබේ. ඒ අතර වසර 2000 දී පළ කළ "සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය" ශ්‍රී ලංකාවේ සෙල්ලිපි අධ්‍යයනය කරන්නන්ට සපයන අනුග්‍රහය වචනයෙන් විස්තර කළ නොහැකි තරම් ය.

දරිද්‍රතාවයෙන් පීඩිත පවුලක ඉපිද අතරමග අධ්‍යාපනය අතහැර දමා පොලිස් කොස්තාපල්වරයකු වූ සිරිමල් රණවැල්ල දිවි ගමනින් සමුගන්නා විට මහාචාර්යවරයෙකි, අභිලේඛනඥයෙකි, විශ්‍රාමික උපකුලපතිවරයෙකි, විද්වතෙකි. විද්වතකු ලෙස පමණක් නොව උසස් මානව ගුණාංගයන්ගෙන් හෙබි සත්පුරුෂයකු ලෙස ද ජනහදවත් දිනාගෙන ඒකූනශතවර්ෂයක් ආයු වින්දනය කළ මහැදුරු සිරිමල් රණවැල්ල විද්වතානන්ගේ අපූර්ව ජීවන ගමන අධිෂ්ඨානශීලී සියල්ලන්ට ම අගනා ආදර්ශයකි.

ඉතිහාසය හා පුරාවිද්‍යාව සම්බන්ධ එවන් නව ඥාන සම්පාදකයකු අනුස්මරණය කිරීම වෙනුවෙන් උපහාර කලාපයක් සම්පාදනය සඳහා කටයුතු කිරීම, අපගේ ඉමහත් සතුටට හේතුවකි. මෙවන් උපහාර කලාපයක් සම්පාදනය සඳහා පුරෝගාමීව කටයුතු කරන ප්‍රධාන සංස්කාරක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දේව මයිකල් ද සිල්වා මහතා සහ කර්තෘ මණ්ඩලයට අපගේ කෘතඥතා පූර්වක ස්තුතිය පුදකරනු කැමැත්තෙමි.

**ආචාර්ය ලක්මිණී ගමගේ**
අංශ ප්‍රධාන, ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයන අංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,
රුහුණ විශ්වවිද්‍යාලය.

# රුහුණ විශ්වවිද්‍යාලයීය ආදි විද්‍යාර්ථීන්ගේ කොළඹ සංගමයේ පණිවුඩය

වනාන්තරයක බොහෝ වෘක්ෂයෝ ඇත්තාහ. එහෙත් දැවැන්ත වනස්පතියක් දැක ගත හැක්කේ කලාතුරකිනි. ශාස්ත්‍රීය ලෝකයේ ද විවිධාකාර ශාස්ත්‍රඥයන් දැක ගත හැකි වුව ද ශාස්ත්‍රීය දැවැන්තයෙකු දැක ගත හැක්කේ කලාතුරකිනි. මහාචාර්ය සිරිමල් රණවැල්ල එබඳු ශාස්ත්‍රීය දැවැන්තයෙකු බව කිසිදු පැකිලීමකින් තොරව පැවසිය හැකි යී එබඳු අයෙකුගේ බලපෑම අති විශාල කාල පරාසයක් තුළ විහිදී පැතිරී පවතියි. මුළු මහත් ශාස්ත්‍රීය ලෝකයම මහාචාර්ය සිරිමල් රණවැල්ල එලෙසින් දකිනවාට කිසිදු සැකයක් නොමැත.

එහෙත් රුහුණ සරසවියේ ආදි විද්‍යාර්ථීන් වන අපි එයට අමතරව තවත් මාන කිහිපයකින් රණවැල්ලයන් දෙස බලමු. රුහුණ විශ්වවිද්‍යාලයේ කලල අවධිය වූ රුහුණ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය ඇරඹීමේ මූලික අවස්ථාවේ දී සම්බන්ධීකරණ කටයුතුවල නියැලී කලා පීඨයේ පීඨාධිපතිවරයා බවට පත්වන මහාචාර්ය රණවැල්ල විශ්‍රාම යන තෙක්ම රුහුණ විශ්වවිද්‍යාලයේ කටයුතු කළේ ය. ඒ අනුව ඔහු රුහුණ විශ්වවිද්‍යාලයේ ආරම්භයට පෙර සිටම ඒ හා බැඳුණ ප්‍රධාන චරිතයක් බවට පත්වෙයි.

මහාචාර්ය රණවැල්ල ශිෂ්‍යයන් සමග එතරම් සමීප ඇසුරක් පවත්වා ගෙන නොගියත් ශිෂ්‍යයන්ට ප්‍රශ්නයක් ගැටලුවක් ඇති වූ විට මැදිහත් වීමට කිසිදු මැලිකමක් දැක්වූයේ නැත. විශේෂයෙන්ම පොලීසිය හා සම්බන්ධ කටයුතුවල දී ඔහුගේ නිහඬ මැදිහත් වීම් හේතුවෙන් සිදු විය හැකිව තිබූ මහ විපත් වළක්වා ගත හැකි වූ අවස්ථා බොහෝ ය.

ජ්‍යෙෂ්ඨ ශාස්ත්‍රඥයන් ඇගයීමට ලක් කිරීම ශාස්ත්‍රීය ලෝකයේ වැදගත්ම සාරධර්මයකි. ජ්‍යෙෂ්ඨ ශාස්ත්‍රඥයන් නොතකා හරින්නේ කොතැන ද එතැන සිදු වන්නේ ශාස්ත්‍රීය පරිහාණියයි. රණවැල්ලයන්ට උපහාර දැක්වීම උදෙසා සංස්කෘතික කේන්ද්‍රය විසින් ප්‍රකාශයට පත්කරන ***අන්තරාවලෝකන ග්‍රන්ථ මාලාවේ*** *මංගල කලාපය* එතුමා වෙනුවෙන් වෙන් කරමින් සිදුකරන මෙම සත්කාර්යය අප බෙහෙවින්ම අගයන්නේ මෙම හේතුව නිසා ය.

අවසන් වශයෙන් කිව යුත්තේ රණවැල්ලයන්ට කරන්නා වූ සැබෑ ගෞරවය වන්නේ එබඳු දැවැන්තයන් බිහි වීමට අවශ්‍ය වන්නා වූ ශාස්ත්‍රීය තෝතැන්නත් නිර්මාණය කිරීම බවයි.

රණවැල්ලයන් පිළිබඳව කෙටියෙන් හෝ සටහනක් තැබීමට අවස්ථාවක් ලැබීම රුහුණ විශ්වවිද්‍යාලයීය ආදි විද්‍යාර්ථීන්ගේ කොළඹ සංගමය ලැබූ වරප්‍රසාදයක් ලෙස සලකමු.

**ප්‍රසන්න ද සොයිසා**
රුහුණ විශ්වවිද්‍යාලයීය ආදි විද්‍යාර්ථීන්ගේ
කොළඹ සංගමය.

# රුහුණ විශ්වවිද්‍යාලයීය ආදි විද්‍යාර්ථීන්ගේ ගාල්ල සංගමයේ පණිවුඩය

රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රය මගින් එළි දක්වන ***"අන්තරාවලෝකන ශාස්ත්‍රීය ග්‍රන්ථ මාලා 01"*** මංගල කලාපයෙන් රුහුණ විශ්වවිද්‍යාලයේ හිටපු ප්‍රවීණ මහාචාර්ය සිරිමල් රණවැල්ලයන්ගේ චරිතාපදානය ගෙන හැර දැක්වීමට තීරණය කිරීම පැසසුම් සහගත ය. මේ සඳහා රුහුණ විශ්වවිද්‍යාලයීය ආදි විද්‍යාර්ථීන්ගේ සංගමයේ ගාල්ල ශාඛාව වෙනුවෙන් සටහනක් තැබීමට ලැබීම භාග්‍යයක් කොට සලකමු.

රුහුණ විශ්විද්‍යාලයේ ප්‍රාරම්භක සාමාජිකයෙක් ලෙස සේවයට බැඳී ඇති සිරිමල් රණවැල්ලයන් මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ ඉතිහාස අධ්‍යයනාංශයේ මහාචාර්යවරයෙකු ලෙස විශ්‍රාම දිවියට එළඹෙන විට තම අධ්‍යයනාංශයටත්, පීඨයටත්, පොදුවේ විශ්වවිද්‍යාලයටත් සිදු කළ අමිල සේවය අතිශයින් ඇගයීමට ලක් විය යුතු ය.

විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු ලෙස මෙන්ම ඉතිහාසය හා පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂකයෙකු ලෙස එතුමාණන් දක්වන ලද දායකත්වය සදා අමරණීය වේ.

රට ජාතිය වෙනුවෙන් සුවිසල් මෙහෙවරක් සිදු කළ මහාචාර්ය සිරිමල් රණවැල්ල මහත්මාණන් වැනි උදාර චරිතයක් වෙනුවෙන් මෙම ***'අන්තරාවලෝකන ශාස්ත්‍රීය ග්‍රන්ථ මාලාවේ'*** පළමු අංකය වෙන්කර තිබීම සමස්ත විශ්වවිද්‍යාලයීය වත්මන් ගුරු-සිසු දෙපිරිසටම මහත් ආදර්ශයක් සපයනු ඇති බව මාගේ විශ්වාසයයි.

එතුමාණන්ට උතුම් නිර්වාණ සුවය ප්‍රාර්ථනා කරමු.

**සුදත් ජයසේකර**
සභාපති
රුහුණ විශ්වවිද්‍යාලයීය ආදි විද්‍යාර්ථීන්ගේ
ගාල්ල සංගමය.

# සංස්කෘතික කේන්ද්‍ර සම්බන්ධීකාරකවරයාගේ අදහස

විශ්වවිද්‍යාලය විධිමත් උගැන්වීම්වලට පමණක් සීමාවිය යුතු වූවක් නොවේ. එය මනෝභාවයන් පුහුණු කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන තැනක් විය යුතු ය. එය විසින් සංගීතඥයන්, කලාකරුවන් මෙන්ම ගුරුවරුන් බිහිකළ යුතු ය. රුහුණ විශ්වවිද්‍යාලයට පනස් වසරක් ඇතුළත දී එක් ශ්‍රේෂ්ඨ කවියෙකු, නවකතාකරුවෙකු, කෙටි කතාකරුවෙකු, සිත්තරෙකු, සංගීතඥයෙකු හෝ විශිෂ්ට ගණයේ නාට්‍යයක් අධ්‍යක්ෂණය කොට නිෂ්පාදනය කළ හැකි වේ නම් එය විසින්ම තම පැවැත්ම යුක්ති යුක්ත කළා වන්නේ ය. රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කේන්ද්‍රය එකී ජීව ගුණය පෙන්නුම් කරන සංස්කෘතික දායාදයන් සපයන මධ්‍යස්ථානයක් බවට පත් කරමින් රුහුණට පළමුව පා තබන මානව මානවිකාවන්ට ප්‍රබෝධක ආවේශයෙහි ප්‍රභවයක් සපයන චිත්තාකාර්ෂණීය ස්ථානයක් බවට පත් කිරීම මා ඇතුළු සමස්ත පීඨ සම්බන්ධීකාරක භවතුන්ගේ පරම අභිලාෂය වන බැව් කිව යුතු ය.

මේ උත්තුංග චේතනාවන් මස්තකප්‍රාප්ත කරගනු වස් අතීතයෙන් ඉගෙන අද වෙනුවෙන් ජීවත්වීමටත්, හෙට වෙනුවෙන් බලාපොරොත්තු තබා ගන්නටත් ඇති වැදගත්ම මාර්ගයක් වනුයේ ගවේෂණයයි. ඒ ඔස්සේ අපට විමංශන බුද්ධිය නමැති පළිඟු කණ්ණාඩිය පැළඳගෙන ඉතිහාසයේ සැඟවී තිබෙන බොහෝ සත්‍ය වෘතාන්ත සොයා බැලීමට හැකි වන්නේ ය. එසේම ඉතිහාසය වෙනස් කිරීමට අපට නොහැකි වූවද ඉතිහාසය තුළ ඇගයුමට පිදීමට භාජනය නොවූ ශ්‍රේෂ්ඨතමයන් පිළිබඳව අන්තරාවලෝකනයක යෙදීම අප සතු ප්‍රධාන යුතුකමක් හා වගකීමක් ද වන්නේ ය.

මෙනයින් බලන කළ ***"අන්තරාවලෝකනය"*** (Introspection) යනු කිසියම් පුද්ගලයෙකුගේ ජීවිතයට ආපසු එබිකම් කර බැලීම ය. මෙලෙස කරනු ලබන පුනරාවලෝකනයෙන් ලැබෙන යශෝරාවය මෙතෙකැයි කියා කිව නොහැකි තරම් ය. ඒ අනුව රුහුණ සරසවි ඉතිහාසයේ මෙන්ම දකුණු ශ්‍රී ලංකාවේ එතෙක් මෙතෙක් පහළ වූ ගිහි-පැවිදි උගතුන් බුද්ධිමතුන්ගේ අද්විතිය චරිතයන් හී ආනුභාවිකව පර්යේෂණය කළ නොහැකි ***අදෘශ්‍යමාන*** **(Invisible)** ස්පර්ශ කළ නොහැකි අශ්පර්ශනීය උරුමයන්ට අයත්වන ජීවන පැතිකඩ කියවීමට ඉඩ ප්‍රස්ථා විවර කරදීමේ උදාර අරමුණින් සම්පාදනය කරනු ලබන මෙම ***''අන්තරාවලෝකන'' ශාස්ත්‍රීය ග්‍රන්ථ මාලාවේ අංක 01 මංගල කලාපය*** දිවංගත මහඇදුරු සිරිමල් රණවැල්ලයන් වෙනුවෙන් වෙන්කොට ඔබ දෝතට පිළිගන්වනුයේ ඉමහත් සතුටිනි.

විශේෂයෙන් දකුණු ලංකාවේ අතීතය සහ වර්තමානය අධ්‍යයනය කෙරෙන කේන්ද්‍රීය ආයතනයක් බවට රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රය පත්කිරීමේ ඒකායන අරමුණින් එළිදක්වනු ලබන අන්තරාවලෝකන ශාස්ත්‍රීය ග්‍රන්ථ මාලාවේ ඉදිරි කලාපයන් අනාගත පර්යේෂණ කාර්යයන් හී නිමග්න ශාස්ත්‍රවන්තයන් උදෙසා කදිම තෝතැන්නක් වනු ඇතැයි මා උදක්ම කල්පනා කරමී ඉදිරියේ දී ඒ සඳහා ශාස්ත්‍ර උන්නතිකාමී ඔබගේ නොමසුරු දායකත්වය සැපයීමෙන් ශ්‍රී ලංකා ඉතිහාසයේ දැනුමට සෑහෙන එකතුවක් කළ හැකිවේය යන්න මාගේ අවංක විශ්වාසයයි.

**ආචාර්ය දේව මයිකල් ද සිල්වා**
සම්බන්ධීකාරක
සංස්කෘතික කේන්ද්‍රය
රුහුණ විශ්වවිද්‍යාලය

# උපකාරානුස්මෘතිය

දැනුම යනු ප්‍රකෘතිය හෙවත් තමා අවට පවතින්නා වූ ලෝකය පිළිබඳව මිනිසා සතුව පවතින්නා වූ අවබෝධය වේ. මේ අවබෝධතා ඥානය මිනිසාගේ පංචේන්ද්‍රියන් හරහා ස්නායු පද්ධතිය හා මොළය සම්බන්ධ වී සිදුකරනු ලබන සංකීර්ණ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වන්නේ ය. මේ ඥානය නැතිනම් ප්‍රඥාව යනුවෙන් හැඳින්වෙන දැනුම ලබා ගන්නා විවිධ මාර්ග ඇත්තා සේම එකී දැනුම ලබා ගන්නා ක්‍රම ද වෙනස් වේ. ඒ අතර ඇත්තා වූ අන්තරාවලෝකන ශක්තිය පාවිච්චි කර දැනුම ලබා ගන්නා ක්‍රමයට වැදගත් තැනක් හිමි වේ. මෙනයින් බලන කළ අන්තරාවලෝකනය යනු ඇතුළාන්තය දෙස හැරී බැලීම නම් වේ. මේ ඔස්සේ අතීතයේ දී සුවිශේෂ කාර්යභාරයක් ඉටු කළා වූ පුද්ගලයින්ගේ සිතුම් (Thoughts) හැඟීම් (Feeling) සංවේදන නැතිනම් දැනීම්වලින් (Sensation) යුත් මානසික ක්‍රියාවලිය ඉතා ප්‍රවේශම්කාරීව හා ක්‍රමවත්ව නිරීක්ෂණය කිරීමට හෝ පරීක්ෂාවට භාජනය කිරීමට හැකි වන්නේ ය.

ඒ අනුව රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රය විසින් පළමුවරට සම්පාදනය කරනු ලබන ***"අන්තරාවලෝකන ශාස්ත්‍රීය ග්‍රන්ථ මාලා අංක 1 කලාපය"*** මහඇදුරු සිරිමල් රණවැල්ලයන් වෙනුවෙන් පළකිරීමේ දී අපට නන් අයුරින් උපකාර කළ පිරිසට කෘතවේදීත්වය පිරිනැමීම යුතුකමක් කොට සලකමු. මෙවැනි සත්කාර්යයක් කිරීමේ අවශ්‍යතාවය පළමු කොටම පෙන්වාදෙමින් සුභාශිංසන ලිපි ලබාදුන් රුහුණ විශ්වවිද්‍යාලයේ කුලපති ධුරන්දර පූජ්‍ය පාද ආචාර්ය අකුරටියේ නන්ද නාහිමිපාණන් වහන්සේට සහ රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති තැන්පත් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතාට අපගේ ගෞරව නාමස්කාර පූර්වක ස්තුතිය පුද කරනු කැමැත්තෙමු. එමෙන්ම මෙම මංගල ශාස්ත්‍රීය කර්තව්‍යයේ දී අප දිරිමත් කරමින් සුබපැතුම් පණිවිඩ එක් කළ රුහුණ

විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය ඊ. පී. සමන් චන්දන මහතාටත්, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය උපාලි පන්නිලගේ මහතාටත්, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ අංශාධිපතිනි ආචාර්ය ලක්මිණී ගමගේ මහත්මියටත් අපගේ නොවක් ස්තුතිය පුද කරන අතර රුහුණ විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථයින්ගේ සංගමයේ කොළඹ හා ගාල්ල ශාඛාවන් වෙනුවෙන් මේ උත්කෘෂ්ට කාර්ය ඇගයුමට ලක් කරමින් සුභාසිරි පැතුම් ගෙන එනු ලැබූ නීතිඥ ප්‍රසන්න සොයිසා මහතාට හා සුදත් ජයසේකර මහතාට ප්‍රණාමය පුද කරමු. එසේම මෙම උත්තුංග කාර්යභාරය සාර්ථක කර ගැනීමෙහිලා වටිනා කාලය මිඩංගු කරමින් කෙටි කාලයක් තුළ ශාස්ත්‍රීය ලිපි ලබා දුන් ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය මනෝජ් දර්ශන බණ්ඩාරයන්ට සහ සහකාර කථිකාචාර්ය තරිඳු පිරිස් මහතාටත් මෙම ග්‍රන්ථයට කෞතුක වටිනාකමක් එක් කරමින් මහඇදුරු සිරිමල් රණවැල්ලයන් පිළිබඳ දුර්ලභ ඡායාරූප හා සිහිවටනයන් රැසක් ලබාදුන් එතුමාගේ දියණියක වන වෛද්‍ය ලේඛා රණවැල්ල මහත්මියට සහ පිටකවරය සැකසීමට මහාචාර්ය රණවැල්ලයන්ගේ සේයාරුවක් ලබා දුන් සංඛ ගාල්ලගේ මහතාට හා රුහුණ විශ්වවිද්‍යාලයීය ආදි විද්‍යාර්ථීන්ගේ කොළඹ සංගමයේ නීතිඥ ප්‍රසන්න ද සොයිසා මහතාට අපගේ විශේෂ ගෞරව පූර්වක ස්තුතිය පුද කරනු කැමැත්තෙමු. අවසන් වශයෙන් රුහුණ විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති විමල් හෙට්ටිආරච්චි මහතාට සහ මෙම ග්‍රන්ථයේ කංචුකය නිර්මාණය කළ සංජු රංගොඩගේ මහතා සහ අක්ෂර සංයෝජනයෙහිලා දායක වූ ටී.එන්.එච්. අනුරුද්ධ මහතා මෙන්ම පරිගණක පිටු සැකසුම් කළ D2 ග්‍රැෆික්ස් ආයතනයේ ගාමිණී ධම්මික මහතාට අපගේ අවංක ආදර ස්තුතිය පුද කරනෙමු.

සංස්කාරකවරු

**ආචාර්ය දේව මයිකල් ද සිල්වා**

**එන්. එච්. තරංග අනුරුද්ධ**

**සංජු රංගොඩගේ**

# ලිපි සම්පාදකවරු

**එන්. එච්. ටී. අනුරුද්ධ**
*B.A. (Ruhuna), Dip. Counselling (Ruhuna), Reading MSc (PGIAR) Reading*
*සංවර්ධන නිලධාරී, සංස්කෘතික කේන්ද්‍රය,*
*රුහුණ විශ්වවිද්‍යාලය.*

**දේව මයිකල් ද සිල්වා**
*B. A. (Ruhuna), M.Phil (Ruhuna), Ph.D (Ruhuna)*
*ඉතිහාසය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,*
*ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය,*
*රුහුණ විශ්වවිද්‍යාලය.*

**මනෝජ් දර්ශන බණ්ඩාර**
*B.A. (Colombo), PG. Dip (PGIAR), M.A. (PGIAR), Ph.D (Ruhuna), L.L.B. (OUSL), Attorney at low*
*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,*
*ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය,*
*රුහුණ විශ්වවිද්‍යාලය.*

**තරිඳු පීරිස්**
*B.A. (Kalaniya), PG. Dip. (PGIAR), M.Sc (PGIAR), Reading*
*තාවකාලික සහය කථිකාචාර්ය,*
*ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය,*
*රුහුණ විශ්වවිද්‍යාලය.*

# පෙළගැස්ම


- රුහුණ විශ්වවිද්‍යාලයේ කුලපති නාහිමිපාණන්ගේ සුභාශංසනයයි 5
- රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමාගේ පණිවුඩය 7
- රුහුණ විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපතිතුමාගේ පණිවුඩය 11
- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ පීඨාධිපතිතුමාගේ පණිවුඩය 13
- ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශ ප්‍රධානතුමියගේ පණිවුඩය 16
- රුහුණ විශ්වවිද්‍යාලයීය ආදි විද්‍යාර්ථීන්ගේ කොළඹ සංගමයේ පණිවුඩය 18
- රුහුණ විශ්වවිද්‍යාලයීය ආදි විද්‍යාර්ථීන්ගේ ගාල්ල සංගමයේ පණිවුඩය 20
- සංස්කෘතික කේන්ද්‍ර සම්බන්ධීකාරකවරයාගේ අදහස 21
- උපකාරානුස්මෘතිය 23
- ලිපි සම්පාදකවරු 25
- මහාචාර්ය සිරිමල් රණවැල්ල සිය අත්අකුරින්ම ලියූ ජීවිත කථාවෙන් බිඳක් 29

1. මහඇදුරු සිරිමල් රණවැල්ල 31

   *- තරංග අනුරුද්ධ*

2. රුහුණ විශ්වවිද්‍යාලය සහ මහාචාර්ය සිරිමල් රණවැල්ල භූමිකාව 39

   *- ආචාර්ය දේව මයිකල් ද සිල්වා*

3. රෝහණ දේශයේ ඉතිහාසය ගොඩනැංවීම සහ
භූ භෞතික සීමා ප්‍රතිනිර්මාණය කිරීමෙහිලා
මහාචාර්ය සිරිමල් රණවැල්ලයන්ගෙන් ඉටු වූ
මෙහෙය පිළිබඳව අධ්‍යයනයක් 52


- ***ආචාර්ය මනෝජ් දර්ශන බණ්ඩාර***


4. පුරාවිද්‍යාව මහජනයා වෙත ගෙන ගිය ඉතිහාසඥයා
අභිලේඛනඥයෙකු වශයෙන්
මහාචාර්ය සිරිමල් රණවැල්ලයන්ගේ කාර්යභාරය 75

- ***තරිඳු පීරිස්***

- උපග්‍රන්ථය 88

## මහාචාර්ය සිරිමල් රණවැල්ලයන් සිය අත් අකුරින්ම ලියූ ජීවිත කථාවෙන් බිඳක්...


මගේ ජීවිත කථාව



# 1
# මහඇදුරු සිරිමල් රණවැල්ල

**තරංග අනුරුද්ධ**
*සංස්කෘතික කේන්ද්‍රය,*
*රුහුණ විශ්වවිද්‍යාලය.*

සෙනරත් පරණවිතාණ සූරීන්ගෙන් පසුව විසිවන සියවසේ දෙවන කාර්තුවේ දී දැයේ පිනට උපන් ප්‍රාඥයෙකු වූ සිරිමල් රණවැල්ල විශිෂ්ට ආචාර්යවරයෙකු මෙන්ම විශිෂ්ට පරිපාලනඥයකු ද විය. එතුමා මෙලොව එළිය දුටුවේ 1921 ඔක්තෝබර් මස 16 වැනි දින දක්ෂිණ ලංකාවේ ගාල්ල දිස්ත්‍රික්කයේ කොග්ගල ග්‍රාමයේ දී ය. දරිද්‍රතාවයෙන් මිරිකී ගිය පවුලක උපත ලද සිරිමල් දරුවා හදා වඩා ගැනීමට දෙමාපියන්ට පහසු කටයුත්තක් නොවුණි. සිරිමල්ට වසරක් සපිරෙද්දී ඔහු හදා වඩා ගැනීමට ඉදිරිපත් වූයේ රොසලින් අමරසිංහ නම් නැන්දණිය යි. එදා පටන් ඔහු අම්මා කීවේ ද මේ නැන්දණියට යි. 1927 දී ගාල්ල උණවටුන සිංහල බෞද්ධ මිශ්‍ර පාසලට ඇතුළත්ව 1939 දක්වා සිප්සතර හදාරණු ලැබුව ද පාසල තුළ කැපීපෙනෙන ශිෂ්‍යකු නොවූ හෙතෙම පාසල් අවධියේ දී වේදිකා නාට්‍ය නළුවකු ලෙස පාසල් මිතුරෙකු වූ එඩ්වින් ආරියදාස සමග කටයුතු කර තිබුණේ ය.

නමුත් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය ඉතා හොඳින් සමත් වූ රණවැල්ලයන් ට පවුලේ ආර්ථිකයට දායකත්වයක් සැපයීමට සිදුවූයෙන් වැඩිදුර අධ්‍යාපනයට යොමු වෙනවා වෙනුවට බලංගොඩ ප්‍රදේශයේ ජීවත් වූ මාමා කෙනෙකු වෙත ගොස් ලිපිකරුවෙකු ලෙස ටික කලක් කටයුතු කිරීමට සිදු වී තිබුණේ ය.

අනතුරුව 1944 දී පොලිස් දෙපාර්තමේන්තුවට කොස්තාපල්වරයෙකු ලෙස එක් වී පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණු කාලසීමාවෙන් පසු සිය පළමු පත්වීම ලබා කොළඹ කුරුඳුවත්ත පොලිස් ස්ථානයේ දුරකතන ක්‍රියාකරුවකු ලෙස සේවයට එක් වී තිබුණේ ය.

මේ අයුරින් කුරුඳුවත්ත පොලීසියට අනුයුක්තව රාජකාරි ඉටු කරමින් සිටියදී 1947 වර්ෂයේ දිනෙක ග්‍රෙගරි පාරේ පදිංචිව සිටි සුදු ජාතිකයෙකුගේ පැමිණිල්ලක් විමර්ශනය කිරීමට ඔහුගේ නිවසට යාමට කොස්තාපල් රණවැල්ලයන්ට සිදු වී ඇත. එහි දී තරුණ කොස්තාපල්වරයාට සුදු ජාතිකයා ප්‍රකාශ කර ඇත්තේ පිටුපස දොරටුවෙන් නිවස ඇතුළට පැමිණෙන ලෙසයි. එම අවස්ථාවේ දී ඔහු දන්නා ඉංග්‍රීසියෙන් සුදු ජාතිකයාට පහදා දී තිබුණේ ඔහු පොලිස් නිලධාරියෙක් ලෙස විමර්ශනයක් සිදු කිරීමට පැමිණි නිසා පිටුපස දොරටුවෙන් පැමිණීමට සූදානම් නැති බවයි. මේ සිදුවීමත් සමග ඉංග්‍රීසි දැන සිටියානම් මීටත් වඩා හොඳින් සුදු ජාතිකයාට කදිම පාඩමක් ඉගැන්වීමට තිබූ බව තදින් සිතට ගෙන තවදුරටත් අධ්‍යාපනය ලබා ගැනීම අවශ්‍යය යන ප්‍රබල හැඟීම සිය හදවත තුළ යබොර සේ තැන්පත්වන්නට විය. ඒ අනුව එම අදහස මස්තකප්‍රාප්ත කරගනු වස් රාජකාරි කටයුතු සිදු කරන කාලයේ දී රාත්‍රී ඉංග්‍රීසි පන්තියකට සහභාගී වෙමින් ඉංග්‍රීසි භාෂාව කතා කිරීම සහ ලිවීම පිළිබඳ අභියෝගය සාර්ථකව ජය ගන්නට කැපවිය.

වෘත්තිමය වගකීම් සහ අවිවේකී බව තුළ සිරවී සිටිය ද දැනුම් පිපාසයෙන් පෙළුණ ඔහු කොළඹ විශ්වවිද්‍යාලය අසලින් රාජකාරියට යන අතරමග දී ගමේ පාසලේ පැරණි සගයෙකු වූ එවකට කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබමින් සිටි එඩ්වින් ආරියදාස විටින් විට හමු විය. අතරමග කඩාකප්පල් වූ සිය අධ්‍යාපනය ගැන යළි සිතා බැලීම සඳහා පෙළඹවීමක් ඇති කිරීමට මේ පැරණි අතිජාත පාසල් මිතුරාගේ හමුවීම් ප්‍රයෝජනවත් විය.

ඒ වනවිට කුරුඳුවත්ත පොලීසියේ සේවා කාලය වසර පහක් ගතවී තිබූ අතර ඉන් මසක් ගතවූ තැන සිරිමල් රණවැල්ලට

බම්බලපිටිය පොලිස් ස්ථානයට මාරුවක් ලැබුණි. එහි දී සිරිමල්ට පැවරුණේ පොලිස් ස්ථාන භාර පොලිස් පරීක්ෂකවරයාගේ කාර්යාලයේ ලිපිකරු තනතුර ය. එය කලින් ඉටුකරමින් සිටි දුරකථන ක්‍රියාකරුගේ රාජකාරියට වඩා සැහැල්ලු කටයුත්තක් විය. එයින් උපරිම ප්‍රයෝජන ගත් සිරිමල්, ඉහල නිලධාරින්ගේ අවසරය ඇතිව, එවකට කොළඹ බගතලේ පාරේ පිහිටි හාර්වඩ් පෞද්ගලික විද්‍යාලයට ඇතුළත් වූයේ වර්ෂ 1949 යේ දී ය. එහි දී ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර (SSC) විභාගයට සූදානම් ව 1950 දී එම විභාගයෙන් සමර්ථ විය. විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගය ලෙස සැලකූ උසස් අධ්‍යාපන සහතික පත්‍ර (HSC) විභාගයට පෙනී සිටියේ 1952 දී ය. ඔහු සිංහල, ලංකා ඉතිහාසය, ඉන්දියානු ඉතිහාසය හා දේශපාලන විද්‍යාව යන විෂයයන් ඒ සඳහා තෝරාගෙන තිබුණි. සාමාර්ථ දෙකක් ලබා ගැනීම සාමාන්‍යයෙන් එකල ප්‍රාමාණික ජයග්‍රහණයක් ලෙස සලකනු ලැබූව ද ඔහු විෂයයන් හතරම විශිෂ්ට ලෙස සමත්ව ඇත. එම ප්‍රතිඵල මත 1953 දී පේරාදෙණිය ලංකා විශ්වවිද්‍යාලයට ඇතුළු වීමට ඔහු භාග්‍යය උදා කරගත්තේ ය. ඒ ඔහුට වයස අවුරුදු 32 දී ය.

පළමු වසර අවසාන වන විට ඉතිහාසය ගෞරව උපාධියක් හැදෑරීමට අවශ්‍ය සුදුසුකම් රණවැල්ල සපුරාගෙන තිබුණි. සිරිමල් රණවැල්ල වඩාත් නැඹුරු වූයේ පෙරදිග ඉතිහාසය වෙතයි. ඒ සඳහා සිංහල, සංස්කෘත හා පාලි යන විෂයයන් ඇතුළත් වූ පුළුල් විෂය පථයක් අධ්‍යයනය කිරීම අත්‍යාවශ්‍ය විය. ඔහුගේ සම වයසේ මිතුරන්ට වඩා පරිණත ශිෂ්‍යයෙකු වීමත් දැනුම පිළිබඳ වූ දැඩි පිපාසයත් ඔහු ගැඹුරු ඉතිහාසය අධ්‍යයනය වෙත ගෙනයනු ලැබී ය. ඔහුගේ ගුරුවරුන් ඔහු තෝරාගත් මාවත්වල දී ඔහුට සහයෝගය සහ ධෛර්යය ලබා දුන් බව ඔහු අවස්ථා ගණනක දී ම සිහිපත් කර තිබේ. එවැනි එක් ගුරුවරයෙක් වූයේ මහාචාර්ය කේ. ඩබ්ලිව්. ගුණවර්ධන හෙවත් කාල් ගුණවර්ධනයන් ය. ඔහුගේ ගුරුවරුන් අතර ප්‍රමුඛයා වූයේ, ඉන්දීය ශාස්ත්‍රඥයෙකු වන මහාචාර්ය හේමචන්ද්‍ර රාය මහතා ය. මහාචාර්ය රාය නිතර ම සිරිමල් රණවැල්ල **'ඔහුගේ**

**හොඳම ශිෂ්‍යයා'** ලෙස හැඳින්වී ය. මහාචාර්ය රාය සම්ප්‍රදායන් පවා බිඳ දමා උපාධිය ලබා ගන්නා විට රණවැල්ලට ප්‍රශංසා කළේ ය. සරසවියේ දී සිරිමල් අරුණාචලම් ශාලාවේ සහ රාමනාදන් ශාලාවේ නවාතැන් ගනිමින් විශිෂ්ට ගුරුවරු ඇසුරේ ශික්ෂණය ලබා 1957 වර්ෂයේ දී සරසවියෙන් පිට වූයේ දෙවන පෙළ ඉහළ පංති සාමාර්ථයක් සහිතව ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධියක් දිනා ගනිමිනි.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසාන කළ රණවැල්ලයන්ට අවශ්‍ය වූයේ සහකාර පොලිස් අධිකාරීවරයෙකු (ASP) ලෙස යළිත් පොලිස් දෙපාර්තමේන්තුව සමග එක් වීමටයි. උසස් පොලිස් නිලධාරීන්ගේ විරෝධය හමුවේ එම අවශ්‍යතාව ඉටුකරගැනීමට ඔහුට නොහැකි විය. එම තත්වය මත ගුරු සහායකයෙකු ලෙස මහනුවර ධර්මරාජ විදුහලේ සේවය අරඹන රණවැල්ල 1957 සිට 1958 වසරක පමණ කාලයක් ගුරු වෘත්තියේ නියැලුණි. මහාචාර්ය ඩී. ඒ. හෙට්ටිආරච්චි මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කළ සිංහල විශ්වකෝෂයේ සහාය සංස්කාරක ධුරයක් 1958 දී භාරගත් රණවැල්ල එහි දී ඉතිහාසය විෂයයට අදාළව ලිපි 250 කට වැඩි ප්‍රමාණයක රචකයා බවට පත් වුණි.

ඉනික්බිතිව රණවැල්ලයන් 1959 දී ඔහු එතෙක් දරමින් සිටි විශ්වකෝෂ සහය සංස්කාරක ධුරයට සමුදෙන්නේ අභිනව කැලණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ සහකාර කථිකාචාර්ය ධුරයෙහි වැඩ භාර ගැනීමට යි. කැලණිය විශ්වවිද්‍යාලයේ සේවයේ නිරතව සිටිය දී ස්වකීය පශ්චාත් උපාධි කටයුතු සඳහා 1964 දී ලන්ඩන් විශ්වවිද්‍යාලයට ඇතුළත් විය.

ඔහු 1966 දී **'A Political History of Ruhuna'** යන මාතෘකාව යටතේ ඉදිරිපත් කළ පර්යේෂණ නිබන්ධයට ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව ක්‍රමයෙන් 1971 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධුරයටත් 1977 සහාය මහාචාර්ය ධුරයටත් පත් වී පුරා වසර 21ක් කැලණිය විශ්ව විද්‍යාලයේ ඉතිහාසය අධ්‍යයනාංශයෙහි සේවය කළේ ය.

1978 දී මාතර ඉදි කරන ලද රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රථම ඉතිහාසය මහාචාර්යවරයා වශයෙන් 1979 දී පත්වීම රුහුණ සිසු දරුවන් ලැබූ ඉමහත් භාග්‍යයකි. ප්‍රථම ඉතිහාසය මහාචාර්යවරයා පමණක් නොව ඉතිහාසය අධ්‍යයනාංශයයෙහි ප්‍රථම අංශාධිපතිවරයා වූයේ ද රණවැල්ලයෝ ම ය. 1979-1989 කාල පරිච්ඡේදයේ දී එතුමාණෝ මානව ශාස්ත්‍ර පීඨයෙහි පීඨාධිපතිවරයා බවට පත් වූ දක්ෂතම පරිපාලකවරයකු ලෙස රුහුණු විශ්වවිද්‍යාල ඉතිහාසයේ අමරණීය නාමයක් හිමිකරගෙන ඇත්තේ ය. ශ්‍රී ලංකාව, දේශපාලන කැලඹීම්වල ගිලී ගිය සමයක රුහුණ විශ්ව විද්‍යාලයේ වැඩබලන උපකුලපති වශයෙන් සිදු කළ මෙහෙවර එහි දී කිසිවකුට අමතක කළ නොහැකි ය. මහාචාර්ය ආර්. එච්. විජේනායක මහතා උපකුලපති තනතුරෙන් ඉල්ලා අස් වූ විට පාලක සභාව ඒ සඳහා කැඳවූයේ මහාචාර්ය රණවැල්ල මහතා ය. එම අවස්ථාවේ දී එය කාරුණිකව ප්‍රතික්ෂේප කළ රණවැල්ල මහතා ඒ සඳහා වෛද්‍ය පීඨයේ මහාචාර්ය ජී. පී. සමරවික්‍රම මහතා පත් කරන ලෙස ඉල්ලා සිටියේ ය. ඒ අනුව 1982 නොවැම්බර් මස සිට 1988 අප්‍රේල් දක්වා සමරවික්‍රම මහතා එම තනතුර දැරුවේ ය. එකල රටෙහි භීෂණය පැතිරෙමින් තිබුණු දුර්භාග්‍ය සම්පන්න අවධියකි. එම තත්ත්වය හමුවේ අවසන් දෙවසර තමන් තනතුරෙන් මුදවා සප්ත වාර්ෂික නිවාඩු ලබා දෙන්නැයි මහාචාර්ය සමරවික්‍රම පාලක සභාවෙන් ඉල්ලීමක් කළ විට පාලක සභාව නැවත උපකුලපති තනතුර සඳහා අයදුම්පත් කැඳවූ නමුත් පැවති භීෂණ සමයේ කිසිවෙක් ඊට අයදුම් කළේ නැත. එවිට තමන්ගේ පෙළඹවීමෙන් තනතුර ලබා ගත් සමරවික්‍රම මහතා නිදහස් කරලීම තම යුතුකම යැයි සැලකූ රණවැල්ල මහතා උපකුලපති ධුරය භාර ගැනීමට ඉදිරිපත් වූයේ ය. ඒ අනුව 1988 අප්‍රේල් 25 සිට 1989 දෙසැම්බර් 27 දක්වා කාලය තුළ මහාචාර්ය සිරිමල් රණවැල්ල මහතා රුහුණ විශ්වවිද්‍යාලයේ වැඩබලන උපකුලපතිවරයා ලෙස එකී වගකීම හෙබවීය. එවන් දුෂ්කර අවධියක විශ්වවිද්‍යාලයක පරිපාලනය භාර ගැනීම ම විනාශයට අත වැනීමක් විය. එහෙත් දූරදර්ශීව ඉවසීමෙන් කටයුතු කරමින් රුහුණ

විශ්වවිද්‍යාලය ඔසවා තැබීමට රණවැල්ලයන්ට හැකි විය. විශ්වවිද්‍යාල ඉතිහාසයේ වඩාත්ම කරදරකාරී හා කැලඹිලි සහිත කාලපරිච්ඡේදයක ඔහු ඉතා ඉක්මණින් ශිෂ්‍යයින්ගේත්, අධ්‍යයන කාර්ය මණ්ඩලයේත් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේත් උපරිම ගෞරවයට පාත්‍ර විය. රටේ තත්ත්වය සාමකාමී අතට හැරෙත්ම වෛද්‍ය පීඨයේ මහාචාර්ය නිරිඇල්ලගේ චන්ද්‍රසිරි මහ ඇදුරුතුමන් උපකුලපති තනතුර භාරගත් බැවින් ඔහු 68 වන වියෙහි දී විශ්වවිද්‍යාල සේවයෙන් විශ්‍රාම ලැබී ය.

ගුණාත්මක භාවයෙන් විශිෂ්ට අනර්ඝ පර්යේෂණ රාශියක් රණවැල්ලයන් විසින් ඉතිහාස සහ පුරාවිද්‍යා ක්ෂේත්‍රයට දායාද කර ඇත්තේ ය. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ අභිලේඛන විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ දී රණවැල්ල නාමය අමතක කළ නොහැකි ය. මහාචාර්ය සෙනරත් පරණවිතානයන්ට පසුව ඒ සෙල්ලිපි සම්බන්ධව පහළ වූ ප්‍රවීණතම විද්වතා වශයෙන් අද්විතීය නාමයක් හිමිකරගෙන සිටි නිසා ය.

මේ කාලය තුළ දී ශිලා ලේඛන සම්බන්ධයෙන් දැඩි උනන්දුවකින් පසු වූ රණවැල්ලයන් ඒ වෙත නුඹුරු වීමට අවකාශ සොයමින් සිටිය දී අත්තානි කණු අධ්‍යයනය සඳහා යොමු වන්නට විය. ඒ අනුව 8 වන සහ 10 වන සියවස්වලට අයත් එකී සෙල්ලිපි පිළිබඳ යම් යම් කටයුතු ඒ වන විටත් මහාචාර්ය සෙනරත් පරණවිතාන හා මුලර් විසින් සිදු කර තිබුණි, නමුත් සිරිමල් රණවැල්ල එම ක්ෂේත්‍රය වඩාත් පුළුල්ව කියවීමට උත්සාහ කළේ ය. පළමුවෙන්ම පරිවර්තනය නොකළ සෙල්ලිපිවලින් පටන් ගත් ඔහු, නව්‍ය දෘෂ්ටිකෝණයකින් ඒ දෙස බැලූ අතර සිංහල, පාලි සහ සංස්කෘත පිළිබඳ ඔහුගේ දැනුම සමග ඉතිහාසය ඒකාබද්ධ කිරීමට ඔහුට හැකි වුණි. අසම්පූර්ණ ලෙස ගන්නා ලද ස්ටැම් පේජ් කියවීමට ස්කෑනිං තාක්ෂණය භාවිත කිරීම ඔහු විසින් යොදා ගන්නා ලදි. ඔහුගේ අභිලේඛන සම්බන්ධ කියවීම ඉදිරියට යත්ම පරිවර්තිත සෙල්ලිපි නැවත අර්ථකථනය කිරීමටත්, දෝෂ නිවැරදි කිරීමට හෝ මෙතෙක් අපැහැදිලි වී ඇති වාක්‍යය පැහැදිලි කිරීමටත් ඔහුට හැකි විය.

ඔහු ශිලාලිපි දහස් ගණනක් කියවා ඒවා ඉතා ආයාසයෙන් මුද්‍රණය කරවීමෙන් නොනැවතී ශිලාලිපි ශබ්දකෝෂයක් ද සම්පාදනය කළේ ය. ඔහු ලිපි 250කට වැඩි ප්‍රමාණයක් සහ පොත් 15ක් පමණ ප්‍රකාශයට පත් කර තිබේ. ඒ අතර වසර 2000 දී පළ කළ ***"සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය"*** ලංකාවේ සෙල්ලිපි අධ්‍යයනය කරන්නන්ට සපයන අනුග්‍රහය කිව වචනයෙන් නොහැකි තරම් ය. මෙතුමන් විසින් විසින් රචිත ග්‍රන්ථ අතර ***"රුහුණේ දේශපාලන ඉතිහාසය, රෝහණ රාජ්‍යයේ ඉතිහාසය, ලංකාවේ ශිලාලිපි, මායා රටේ ඉතිහාසය, දුටුගැමුණු රජතුමා"*** යනාදියට වැදගත් තැනක් හිමි වේ. ශ්‍රී ලංකාවේ සෙල්ලිපි පිළිබඳ ව හසල දැනුමින් හෙබි පුරාවිද්‍යාඥයකු නොවූව ද මහාචාර්ය රණවැල්ල මහතා විසින් රචිත පහත සඳහන්

**Inscription of Ceylon, Vol. V, Part I**

**Inscription of Ceylon, Vol. V, Part II**

**Inscription of Ceylon, Vol. V, Part III**

**Inscription of Ceylon, Vol. V, Index**

**Inscription of Ceylon, Vol. VI**

**Inscription of Ceylon, Vol. VII**

**Inscription of Ceylon, Vol. IX**

**Dictionary of Sinhala Epigraphical Words**

**සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය**

යනාදී ග්‍රන්ථයෝ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කොට එළි දක්වා ඇත්තේ තත් ක්ෂේත්‍රයට එයින් ලැබෙන ඉමහත් පිටිවහල හේතුවෙනි.

තවද මහ ඇදුරු සිරිමල් රණවැල්ලයන්ගේ ශාස්ත්‍රකාමීත්වය සහ කැපවීම අගයමින් පිරිනමා ඇති ගෞරව සම්මාන රාශියකි. ඒ අතරින් කැලණිය විශ්වවිද්‍යාලය මගින් 2000 වසරේ දී පිරිනමන

ලද ***''සම්මානිත මහාචාර්ය උපාධියත්''*** ශ්‍රී ලංකාවේ රාජකීය ආසියාතික සංගමය විසින් 2010 පිරිනමන ලද ***''ශ්‍රීමත් එස්.සී. ඔබේසේකර අනුස්මරණ පදක්කමත්''*** ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය 2012 දී පිරිනමන්නට යෙදුණු ***''උරුම ප්‍රසාද ප්‍රණාම සම්මානය''*** ප්‍රධාන වේ.

රණවැල්ලයන් දරිද්‍රතාවයන් මැද්දේ පොලිස් සේවයට බැඳී, තම රාජකාරි ජීවිතය පොලිස් නිළධාරියෙකු ලෙස හමාර කරනවා වෙනුවට ඉගෙනීමේ වටිනාකම පොලිස් නිළධාරින්ටත්, රටටත් පසක් කර දෙමින් වැඩි දුර අධ්‍යාපනය ලබමින් තම ගුරුවරුන්ගේ සිත දිනා ගනිමින් ඔහුගේ ඉදිරි ගමන් මග සකසා ගෙන ඇත. ඒ අනුව පොලිස් කොස්තාපල්වරයකු ලෙස පොලිස් සේවයේ නිරත වූ රණවැල්ලයන් තම රාජකාරි දිවියෙන් විශ්‍රාම ගනු ලැබුවේ රුහුණ විශ්වවිද්‍යාලයේ වැඩබලන උපකුලපති බවට පත්වෙමිනි. එනිසාම එතුමාණෝ තම ජීවිතය සම්බන්ධව මතකයන් අවදි කරන සෑම අවස්ථාවක දී ම ඔහුගේ මුවෙන් ප්‍රකාශකරන ලද්දේ ***"පීසී වීසී"*** වූ බවයි.

සිරිමල් රණවැල්ල සූරීන් අවසන් හුස්ම පොද වාතලයට එකතු කරන අවස්ථාව තෙක් එතුමාගේ ශාස්ත්‍රීය ශික්ෂණය පවත්වාගෙන ගොස් ඇත. ඒ අනුව ඔහු විසින් ලියා ප්‍රකාශයට පත් නොකළ ග්‍රන්ථ සහ ලිපි කිහිපයකි. මෙම ලිපි සහ ග්‍රන්ථ නුදුරු දිනෙක මුද්‍රණය වීමත් සමග සිරිමල් රණවැල්ලයන්ගේ නාමය තවදුරටත් මේ ධරණිය තලයේ රැව්පිළිරැව් නන්වනු ඇත. ශ්‍රී ලාංකේය ඉතිහාස සහ පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අනුපමේය මෙහෙයක් සිදු කළ මහ ඇදුරු තුමණි ඔබගේ සේවය සදා අමරණීයයි.

# 2

# රුහුණ විශ්වවිද්‍යාලය සහ මහාචාර්ය සිරිමල් රණවැල්ල භූමිකාව

**ආචාර්ය දේව මයිකල් ද සිල්වා**
***ඉතිහාසය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය***
***ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය***
***රුහුණ විශ්වවිද්‍යාලය***

රුහුණ විශ්වවිද්‍යාලයේ කුලපති, උපකුලපති හා වැඩබලන කුලපති ධූරයන් හෙබවූ සියලු දෙනා මෙරට කීර්තිමත් පැවිදි යතිවරයාණන් වහන්සේලා හා මහැදුරුතුමන්ලා විය. ඇතැමෙක් ජීවතුන් අතර නැත. මේ අය අතරින් වැඩබලන උපකුලපතිවරයෙකු වූ මහාචාර්ය සිරිමල් රණවැල්ල සූරීන් දැයෙන් සමුගෙන තෙමසක් සපිරෙන අනුස්මරණීය අවස්ථාවේ රුහුණ විශ්වවිද්‍යාලයේ ආරම්භය හා එය ගොඩනැගීමෙහිලා එතුමන්ගෙන් සිදු වූ දායකත්වය පිළිබඳව පුනරාවලෝකනයක යෙදෙන්නට මේ වියමන මගින් අපේක්ෂා කෙරේ. රුහුණ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය හා බැඳි මහඇදුරු රණවැල්ලයන්ගේ කාර්ය සංසිද්ධිය විමසා බැලීමේ දී පූර්විකාවක් වශයෙන් ලංකා විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ආරම්භය පිළිබඳව කෙටියෙන් කරුණු පරික්ෂාකර බැලීම වැදගත් වේ.

ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ආරම්භය දෙස අවධානය යොමු කිරීමේ දී 19 වන සියවසේ අග භාගය වන විට ක්‍රිස්තියානි මිෂනාරි සමිති සංවිධානවල මූලිකත්වයෙන් විශ්වවිද්‍යාල උපාධිවලට හෝ යටත් පිරිසෙයින් මධ්‍ය පරීක්ෂණය (Intermediate)

තෙක් ඉඩප්‍රස්ථා උදාකර දෙන පශ්චාත් මැට්‍රිකියුලේෂන් (Matriculation) හෙවත් විශ්වවිද්‍යාල ප්‍රවේශ පාඨමාලා ආරම්භ කොට පවත්වා ගෙන ගොස් තිබුණේ ය. උසස් අධ්‍යාපන ක්‍රමයේ මෙවැනි පාඨමාලා පවත්වාගෙන ගිය ආයතන ***"විද්‍යාල"*** (Colleges) නමින් එකල හැඳින්වූ අතර ඒවා අතරින් මෙරට රජයේ උසස්ම විද්‍යාලය නැතිනම් අධ්‍යයන කේන්ද්‍රස්ථානය බවට ***"කොළඹ ඇකඩමිය"*** (Colombo Academy) පත්වී තිබුණේ ය. එය 1859 දී කල්කටා විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් බවට පත් කිරීමත් සමග ***"ක්වීන්ස් විද්‍යාලය"*** (Queen's College) නමින් ප්‍රසිද්ධියට පත්වී 1881 දී ***"රාජකීය විද්‍යාලය"*** (Royal College) නමින් හඳුන්වන ලද්දේ ය. මෙමගින් ලන්ඩන් විශ්වවිද්‍යාලයේ බාහිර පරීක්ෂණවලට සිසුන් සූදානම් කළ නිසා එය නවීන විද්‍යාල අධ්‍යාපනයක් ලබා දුන් මුල්ම විද්‍යාලය වශයෙන් ඉතිහාසයට එක් වී ඇත. (ලංකාවේ අධ්‍යාපනය, 1969: 845)

මේ විද්‍යාලවල ඉගෙනගත් අය එවකට වූ රජයේ දෙපාර්තමේන්තු වෙළඳ ආයතන හා පහළම මට්ටමේ රැකියා හැරුණු විට බෙහෙවින් ලිපිකරු රැකියා ලබා ගත්තාහ. මේ රැකියා අවස්ථාවන් ලබාගැනීමට පාඨශාලා සහතිකයක් අවශ්‍යම විය. මේ සඳහා බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාලය මගින් 1880 සිට විසිවන සියවසේ මැද භාගය තෙක් පැවැත්වූ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයීය කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සහ 1881 පළමුවරට ලන්ඩන් විශ්වවිද්‍යාලය මගින් පවත්වන ලද විභාගය උපස්තම්භක විය. බොහෝ කාලයක් ජනප්‍රියව තිබූ මෙම උසස් අධ්‍යාපන ක්‍රමය 1968 1969 ගණන්වල දී නවතා දමන ලදී. ලංකාවේ උසස් අධ්‍යාපනයේ ආරම්භක අවස්ථාවේ සිටම වෛද්‍ය අධ්‍යාපනය වෙනත් උසස් අධ්‍යාපන ආයතනවලට වඩා මැනවින් සංවිධානය වී තිබුණේ ය. උදාහරණයක් වශයෙන් 19 වන සියවසේ සිව්වන දශකයේ මුල් භාගයේ පටන්ම රජය බටහිර ක්‍රමයේ වෛද්‍යවරුන්ගේ උසස් අධ්‍යාපනය සඳහා විදේශ ආයතනවල සහාය බලාපොරොත්තු විය. ඒ අනුව කල්කටාවේ වෛද්‍ය

විද්‍යාලයට පුහුණුව සඳහා සිසුන් යැවීමේ සිරිතක් එකල පැවතිණි. අවුරුදු හතරක කාලයක් පුහුණුව ලැබූ මුල්ම සිසුන් හතර දෙනා 1843 දී වෛද්‍ය සේවයට එක් වී තිබුණි. අනතුරුව ***ශ්‍රීමත් ජෝර්ජ් විලියම් ඇන්ඩර්සන්*** ආණ්ඩුකාරවරයා (George William Anderson, 1791- 1857) විසින් ප්‍රථම වරට 1852 කොළඹ වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීමේ වැදගත්කම පෙන්වා දෙනු ලැබුවේ ය. නමුත් එවකට උතුරු පළාතේ රාජ්‍ය ශල්‍ය වෛද්‍යවරයා වශයෙන් කටයුතු කළ ජේම්ස් ලෝස් (Dr. James Loos) විසින් වාර්තාවක් ඉදිරිපත් කරමින් ලංකාවේ වෛද්‍ය පිළිවෙතක් ඇති කිරීමේ අවශ්‍යතාව කෙරෙහි විශේෂ අවධානය යොමු කරන තෙක් ඒ පිළිබඳ කඩිනම් වැඩපිළිවෙළක් ආරම්භ කර නොතිබිණි. මේ අනුව එකල සිටි ප්‍රධාන වෛද්‍ය නිලධාරී ඩබ්ලිව්. පී. චාර්ස්ලී (Dr. W.P. Charsley) එකී අදහස පිළිගෙන හෛෂජ්‍යය (Medicine) වෛද්‍ය විද්‍යාව (Surgery) හා සූති විද්‍යාව (Obstetrics) පිළිබඳව ප්‍රායෝගිකව උපදෙස් දීම සඳහා ***"මූලික විද්‍යාලයක්"*** (Elemetary College) පිහිටුවීමට යෝජනා කළේ ය. රජය එකී යෝජනාව පිළිගෙන ශල්‍ය වෛද්‍ය ලෝස් මහතා එම විද්‍යාලයේ විද්‍යාලයාධිපති තනතුරට පත් කොට තවත් කථිකාචාර්යවරු දෙපලක් ද සහිතව 1870 දී ***"වෛද්‍ය විද්‍යාලය"*** (Medical College) පිහිටුවන ලදී. මේ අවධියේ දී ම ක්‍රිස්තියානි මිෂනාරි ව්‍යාපාරයට එදිරිව ආරම්භ වූ බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ මහාර්ඝ ඵලයක් වශයෙන් 1873 දී ***විද්‍යෝදය*** පිරිවෙන හා 1875 දී ***විද්‍යාලංකාර*** පිරිවෙන පිහිටුවා තිබුණේ ය.

මේ වෛද්‍ය විද්‍යාලයට ගොඩනැගිලි, උපකරණ, පොත්-පත්, පුස්තකාල පහසුකම් ශිෂ්‍යත්ව හා ත්‍යාග මුල් කාලයේ දී පෞද්ගලික අනුග්‍රාහකයන්ගෙන් නොමසුරුව ලැබී තිබුණේ යි මේ ආධාරවලට සැසඳෙන ආකාරයෙන් බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් ද මුදල් වැය කළ තිබූ බැවින් ඉගැන්වීමේ අංශය දියුණු කිරීමට හැකිවී තිබුණි. නොබෝ කලකින් මේ වෛද්‍ය විද්‍යාලය වෛද්‍ය සහායකයන් සඳහා වූ සාමාන්‍ය ***"මූලික විද්‍යාලයකට"*** වඩා උසස් ආයතනයක් බවට පරිවර්තනය වීමෙන් පසු බ්‍රිතාන්‍ය පොදු වෛද්‍ය

මණ්ඩලය විසින් 1889 දී හෛෂජ්‍යය හා ශල්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා ප්‍රදානය කිරීමට බලයලත් ආයතනයක් වශයෙන් පිළිගනු ලැබී ය. එහි සහතික ලත් අය රාජ්‍ය වෛද්‍ය ලැයිස්තුවේ ලේඛනගත කිරීමෙන් නොනැවතී, මෙය සුදුසුකමින් අගතැන්පත් වෛද්‍යවරයන් පුරුදු-පුහුණු කරන විදුහලක් වශයෙන් ද පිළිගන්නා ලදී. එහෙත් 1905 අංක 3 දරණ පනතට 1905 ජූලි මස 31 වැනි දින ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී, ඉහත කී වෛද්‍ය විද්‍යාල මණ්ඩලය විසින් එය සම්මත කරන තෙක් නිසි බලතල නොලැබුණේ ය. මේ තත්ත්වය තුළ 1924 දක්වා වෛද්‍ය වෘත්තීය හා වෛද්‍ය අධ්‍යාපනය මෙම මණ්ඩලය යටතේ පැවතුණ ද මෙම කටයුතු දෙකෙන් එකක් ***"ලංකා වෛද්‍ය මණ්ඩලයට"*** ද අනෙක ***''වෛද්‍ය විද්‍යාල මණ්ඩලයට"*** ද පවරන ලදී. කෙසේ හෝ වෛද්‍ය විද්‍යාලය මණ්ඩලය 1927 අංක 26 දරන ආඥා පනතින් හා 1930 අංක 5 දරන ආඥා පනත්වලින් යළි සකස් වී පසු කලෙක ඇති වූ ව්‍යවස්ථාවලින් ද සංශෝධනයට භාජනය වූ බව වාර්තා වේ (ලංකාවේ අධ්‍යාපනය, 1969:846).

බටහිර අධ්‍යාපනය 19 වන සියවසේ අගභාගයේ දී ලබා ගෙන ප්‍රභුත්වය හිමිකර ගත් පිරිසක් විසින් රටේ උසස් අධ්‍යාපනය පොදුවේ ව්‍යාප්ත කිරීමට හා විශේෂයෙන් විශ්වවිද්‍යාලයක් පිහිටුවීම සඳහා උද්ඝෝෂණ කළේ ය. මේ අදහස අනුමත කළ ක්‍රිස්තියානි මිෂනාරින්ගේ සහයෝගය ද ඔවුනට නොඅඩුව ලැබෙන්නට විය. ව්‍යස්ථාදායක සභාවේ නිලනොලත් මන්ත්‍රී පොන්නම්බලම් හෙවත් ෆොන්ඩි කුමාරස්වාමි විසින් 1870 දී ලංකාවේ උසස් අධ්‍යාපනය පිළිබඳ තත්ත්වය පරීක්ෂා කර බැලීම සඳහා කමිටුවක් පත් කිරීමේ යෝජනාව ගෙන ඒමත් සමග ඒ සඳහා පත්කළ අනු කමිටුවට ඔහු හා තවත් ලාංකික මන්ත්‍රී මන්ත්‍රීවරයෙක් පත්කර ගන්නා ලදී. (ලංකාවේ අධ්‍යාපනය, 1969:846) මෙම අනු කමිටුව විසින් ***" ප්‍රාථමික අධ්‍යාපනය වුවද දීමට සුදුසු පුද්ගලයන් ඇති කළ හැකි වන්නේ උසස් අධ්‍යාපනය ලබාදීමෙන් පමණක් යැයි"*** යනුවෙන් පෙන්වා දී තිබුණි. මේ අතරතුර ඉන්දියාවේ විශ්වවිද්‍යාලවලට අපේ විද්‍යාල

අනුබද්ධ කිරිමේ ප්‍රතිපත්තිය පිළිබඳව මෙරට උගත් ලාංකිකයන් සැක සංකා පහළ කරමින් අදහස් දැක්වීම හේතු කොට ගෙන කල්කටා විශ්වවිද්‍යාලට මෙරට විද්‍යාල අනුබද්ධ කිරීම අත්හළ යුතු බවට කමිටුව නිර්දේශය කරමින් ඊට විකල්පයක් වශයෙන් එංගලන්තයේ උසස් අධ්‍යාපනය ලබාදීම සඳහා රජය විසින් ශිෂ්‍යත්වයන් ප්‍රදානය කළ යුතු බවට යෝජනා කළේ ය. මේ යෝජනාව පිළිගැනීමත් සමගම විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යාපනය එංගලන්ත විශ්වවිද්‍යාල හා සම්බන්ධ කිරීමේ ප්‍රතිපත්තියක් තහවුරු වූයේ ය.

එහෙත් 20 වන සියවසේ මුල බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාලවල බාහිර පරීක්ෂණ මගින් නියම විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලැබිය නොහැකි බව ලාංකික උගත් ප්‍රභූන්ට වැටහෙන්නට විය. මේ තුළ බටහිර අධ්‍යාපනය ලද ප්‍රභූ සමහර දෙනා 1906දී පොන්නම්බලම් අරුණාචලම්ගේ නායකත්වයෙන් **'ලංකා විශ්වවිද්‍යාලයීය සංගමය'** පිහිටුවනු ලැබී ය. මේ අනුව දේශීය අවශ්‍යතාවයට උචිත විශ්වවිද්‍යාලයක් පිහිටුවීමේ වැදගත්කම තරයේ දක්වන ලදී. මේ ජාති හිතෛෂීන් විසින් ජාතික නව ජීවයක් සඳහා විශ්වවිද්‍යාලයක් අත්‍යාවශ්‍ය බව අවධාරණය කරනු ලැබුවේ ය. එසේ වුවද 1911 වනතෙක් ලංකා විශ්වවිද්‍යාලයක් පිහිටුවීමේ ලා රජය ක්‍රියාත්මක නොවීයි ශ්‍රීමත් හෙන්රි එඩ්වඩ් මැකලම් ආණ්ඩුකාරවරයාගේ (Sir Henry Edward Macallum 1907 – 1913) කාලයේ දී පත්කර ගනු ලැබූ ***"මැක්ලුඩ්"*** කමිටුව හරහා සහ රොබට් චාමර්ස් පේදම් ආණ්ඩුකාරවරයාගේ (Robert Chalmers 1858-1938) කාලයේ දී දේශීය විශ්වවිද්‍යාලයක් ප්‍රතිස්ථාපනය කිරීමේ ප්‍රතිපත්තිය පිළිගනිමින් මුල් අවස්ථාවේ දී ඩිප්ලෝමා ප්‍රදානය කිරීමට සුදුසුකම් ඇති විශ්වවිද්‍යාලයක් පිහිටුවා දෙවනුව එංගලන්ත ඔක්ස්ෆර්ඩ් (Oxford) වැනි විශ්වවිද්‍යාලයකට අනුබද්ධ කර උපාධි පිරිනැමීමට හැකි විශ්වවිද්‍යාලක් බවට පත්කරලීමට අදහස් කර තිබුණේ ය. එනමුදු 1914 සිට 1918 දක්වා ක්‍රියාත්මක වු පළමුවන ලෝක යුද්ධය නිසා විශ්වවිද්‍යාල කොලීජියක් පිහිටුවීමේ අදහස යටපත්ව ගොස් තිබුණද

1920 අධ්‍යාපන අධ්‍යක්ෂ ධුරය හෙබවූ ශ්‍රීමත් එඩ්වඩ් ඩෙන්හැම්ගේ (Sir Edwad Denham, 1876-1938) යෝජනාවක් අනුව 1921 දී ලන්ඩන් විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරන ලද රජයේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල කොලීජිය නිල වශයෙන් ආරම්භ කරන ලදී. මේ අයුරින් 1870 පිහිටුවන ලද ලංකා වෛද්‍ය විද්‍යාලය හා 1921 පිහිටුවන ලද "ලංකා සරසවි විද්‍යාලයත්" (Ceylon University College) එකාබද්ධ කිරීමෙන් "ලංකා විශ්වවිද්‍යාලය" 1942 අප්‍රේල් මස 02 දින රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සම්මත වූ ලංකා විශ්වවිද්‍යාල ආඥාපනත අනුව පිහිටුවන ලද්දේ ය.

කොළඹ විශ්වවිද්‍යාලය 1942 දී පූර්ණ ස්ව පාලන විශ්වවිද්‍යාලයක් බවට උසස් කෙරිණි. ශ්‍රීමත් විලියම් අයිවර් ජෙනිංස් (Sir William Ivor Jennings 1903 - 1965) එහි පළමු උපකුලපතිවරයා වියි මේ විශ්වවිද්‍යාලය පේරාදෙණියට මාරු කිරීමට කැමති වූ ජෙනිංස් 1942 දී ප්‍රකාශ කර ඇත්තේ ***"විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ස්ථානයක් විය යුතු ය. එය විභාග සමත් කිරීමට තිබෙන ස්ථානයක් නොවිය යුතු ය. නේවාසික විශ්වවිද්‍යාලය වඩා හොඳ ශිෂ්‍ය ජීවිතයකට මග පාදනු ලබන්නක් විය යුතුය"*** යනුවෙනි. (ශ්‍රීමත් අයිවෝ ජෙනිංස්, 1980:21) සැබවින්ම ජෙනිංස්ගේ මෙකී සිහින විශ්වවිද්‍යාලය බවට පත්වූයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයයි. එසේම ඔහුට අවශ්‍යව තිබුණේ එංගලන්තයේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය ආකාරයේ විශ්වවිද්‍යාලයක් ලංකාව තුළ ගොඩනැගීමට ය. ඒ මන්ද කියතොත් හෙතෙම මීට පෙර ලන්ඩන් විශ්වවිද්‍යාල ආකෘතියට කොළඹ විශ්වවිද්‍යාලය ගොඩනගා තිබු නිසා ය. ඒ අනුව මෙරට පළමු නේවාසික විශ්වවිද්‍යාලය 1952 දී ජෙනිංස් විසින් පේරාදෙණියේ දී ආරම්භ කරන ලදී. ඔහු එහි පළමු උපකුලපතිවරයා වශයෙන් 1955 දක්වා සේවය කළේ ය.

මේ අන්දමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලය බිහිවීමෙන් පසු 1958 දෙසැම්බර් 19 වන දින ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබූ විද්‍යෝදය සහ විද්‍යාලංකාර පනත අනුව හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමියන් (1827 - 1911) විසින් 1873 දී ආරම්භ කෙරුණු

මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනත්, රත්මලානේ ශ්‍රී ධර්මාරාම මාහිමියන් (1853 - 1918) විසින් 1875 දී පිහිටුවනු ලැබූ පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනත් විශ්වවිද්‍යාල තත්ත්වයට පත් කරනු ලැබී ය. මෙපරිද්දෙන් ලංකාවේ 1965 වනවිට පැවතියේ විශ්වවිද්‍යාල තුනක් පමණි. පේරාදෙණිය ලංකා විශ්වවිද්‍යාලයට අනුබද්ධව කොළඹ විශ්වවිද්‍යාලය හැරුණුවිට ලංකාවේ සීමිත විශ්වවිද්‍යාල මණ්ඩප කිහිපයක් විය. මේ මණ්ඩප උසස් පෙළ සමත් සැමට උසස් අධ්‍යාපනය ලබාදීමට ප්‍රමාණවත් නොවූයෙන් නව මණ්ඩප පිහිටුවීම කෙරෙහි 1970 දශකයේ අග රජයේ අවධානය යොමුවන්නට වූයේ ය.

මෙම වාතාවරණය තුළ ගිහි-පැවිදි විද්වතුන්, දේශපාලනඥයන්, මාධ්‍යවේදීන් ඇතුළු උගතුන් රැසක් රුහුණට විශ්වවිද්‍යාලයක් ඉල්ලා හිතකාමී ශාස්ත්‍රීය උද්ඝෝෂණයක නියැලි සිටියේ ය. එම මා හැඟි අදහස 1977 මහා මැතිවරණ සමයේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයන් හී තිබූ ජනතා පොරොන්දු පත්‍රයන්ට ඇතුළත් වී තිබුණි. මේ අනුව 1977 බලයට පත්වූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් සිය මැතිවරණ පොරොන්දුවක් ඉෂ්ට කරනු වස් දෙවිනුවර පාර්ලිමේන්තු මන්ත්‍රීවර සහ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය රොනී ද මෙල් විසින් රුහුණ විශ්වවිද්‍යාලය ලබාදීම පිළිබඳ යෝජනාව නව රජයට ඉදිරිපත් කළේ ය. එම සත් යෝජනාව පිළිගෙන 1977 ඔක්තොම්බර් සිට ක්‍රියාත්මක වන රජය ඒ පිළිබඳව වැඩිදුරටත් කරුණු සොයා බලා වාර්තා කිරීමට මහාචාර්ය ඇම්. බී. ආරියපාලගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් පත් කරනු ලැබුවේ ය. එවකට අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ නිශ්ශංක විජයරත්නගේ උපදේශය වූයේ යෝජිත රුහුණ මණ්ඩපයේ අධ්‍යාපන පීඨයන් විවිධ ස්ථානවල පිහිටුවාලීම කාලීන අවශ්‍යතාවයක් වී ඇති බවයි. පළමුකොටම 1977 නොවැම්බර් මස 12 දින රැස්වෙන මහාචාර්ය ඇම්. බී. ආරියපාල කමිටුව විසින් දකුණු පළාත නියෝජනය කරනු ලබන මන්ත්‍රීන් සම්මුඛ වී අදහස් විමසීමට තීරණය කරන ලදී.

දෙවනුව 1977 නොවැම්බර් 19 සිට 22 දින දක්වා වූ දින තුනක් තිස්සේ රුහුණු මණ්ඩපයේ අධ්‍යාපන පීඨ පිහිටුවිය යුතු බවට යෝජනා කරන ලද ගාල්ල දිස්ත්‍රික්කයේ කරාපිටිය, මාතර දිස්ත්‍රික්කයේ වැල්ලමඩම පිහිටි එළියකන්ද ගුරු අභ්‍යාස විද්‍යාලය, වෙලේගොඩ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානය, ශාන්ත සර්වේෂස් මහා විදුහල, ශාන්ත මරියා කන්‍යාරාමය, දික්වැල්ල විජිත මහා විද්‍යාලය හා හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණුකොළපැලැස්ස යන ස්ථාන පරීක්ෂාවට ලක් කරනු ලැබුවේ ය.

මේ අයුරු සියලු කරුණු සොයා බලා 1978 ජනවාරි 04 වන දින ඇම්. බී. ආරියපාල කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලදී. එකී වාර්තාවේ ප්‍රධාන නිර්දේශය වී තිබුණේ සියලු පීඨ කේන්ද්‍රගත නොවුණ ආයතනයක මධ්‍යස්ථානය මාතර විය යුතු බව ය. මීට අමතරව ආරම්භයේ පීඨ හතරක් පැවතිය යුතු බවත්, ඒ අනුව ශාස්ත්‍ර පීඨය සහ විද්‍යා පීඨය මාතර වැල්ලමඩමේත්, කෘෂි විද්‍යා පීඨය රට ලංකා වත්ත ද ඇතුළු මාපලාන රජයේ ගොවිපලේත්, වෛද්‍ය පීඨය ගාල්ල කරාපිටිය නව රෝහල ඉදිරිපිට වූ අක්කර 8 ක් පමණ වූ ඉඩමකත්, ඉංජිනේරු පීඨය පසුව වෙනත් සුදුසු ස්ථානයක ඉදි කිරීමට කටයුතු කළ යුතු බව ය. අනතුරුව ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය පී.පී.පී.එල්. සිරිවර්ධන විසින් විද්‍යාලංකාර මණ්ඩපයේ ඉතිහාස අධ්‍යයනාංශයේ අධිපතිවරයාණන් වශයෙන් කටයුතු කරනු ලැබූ මහඇදුරු සිරිමල් රණවැල්ලයන් රුහුණ විශ්වවිද්‍යාලය පිහිටුවීම පිළිබඳ සම්බන්ධීකරණ නිලධාරීවරයා වශයෙන් පත්කරනු ලැබුවේ ය.

මහඇදුරු රණවැල්ලයන්ට මෙයින් පැවරුණු අතිශය භාරදූර වගකීම නොපිරිහෙලා ඉටු කිරීමේ පරම පවිත්‍ර චේතනාවෙන් යුතුව රුහුණ විශ්වවිද්‍යාලය ගොඩනැගීම සඳහා 1978 මැයි මස මාතර එළියකන්දේ පිහිටවනු ලැබූ කාර්යාලය, වේලාවක් අවේලාවක් නොමැතිව දිවා රාත්‍රී ගත කරන නිවස්නයක් බවට පත්කර ගෙන තිබුණේ ය. ඉංජිනේරුවරුන්ට එහා ගිය දැනුමැත්තෙකු ලෙස ඉදිකිරීම් කටයුතු භාරව තිබූ නෙදර්ලන්තයේ බැලස්ට් නීඩම් (Ballast Nedam)

සමාගමේ ප්‍රධානීන්ට හැකි සෑම අවස්ථාවකදීම කාර්යය හොඳින් කරවා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීමට තරම් අපේ මහඇදුරුතුමාණෝ එඩිතර වී තිබුණේ ය. තමාට රුහුණ විශ්වවිද්‍යාලය ගොඩනැගීම සඳහා පවරා තිබූ සම්බන්ධීකරණ කාර්ය දේවකාරියක් සේ සලකා කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1978 අගෝස්තු මස 27වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ජේ. ආර්. ජයවර්ධනට ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ මාතර මණ්ඩපය ඉතා ඉක්මනින් විවෘත කිරීමට මඟ පැදී තිබිණි. මෙහි ප්‍රථම මණ්ඩපාධිපතිවරයා වූ මහාචාර්ය තේනබඳු සූරීන් සමග උරෙනුර ගැටෙමින් ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායම 1978/1979 අධ්‍යයනය වර්ෂය තුළ බඳවා ගැනීමට සුවිශාල වැඩ කොටසක් ඉටු කරනු ලැබී ය. ආරම්භක අවස්ථාවේ ශාස්ත්‍ර පීඨයට 124 ක්, විද්‍යා පිඨයට 48 ක්, කෘෂි පීඨයට 16 ක් හා වෛද්‍ය පීඨයට 96 දෙනෙකු වශයෙන් සිසු සිසුවියන් 284 දෙනෙකු බඳවා ගැනීමට ක්‍රියාකිරීමේ දී යෝධ බලවේගයක් ලෙස මහඇදුරු රණවැල්ලයන් විශාල පිටුබලයක් සපයා තිබිණි. ශාස්ත්‍ර පීඨය කොළඹ මණ්ඩපයටත්, විද්‍යා පීඨය විද්‍යාලංකාර මණ්ඩපයටත්, කෘෂි පීඨය පේරාදෙණි මණ්ඩපයටත් වෛද්‍ය පීඨය කොළඹ හා පේරාදෙණි මණ්ඩපවලට අනුයුක්ත කරමින් අධ්‍යාපන කටයුතු සක්‍රීයව කරගෙන යෑම සඳහා අනුපමේය වූ සේවාවන් මහඇදුරු රණවැල්ලයන් ඉටු කොට තිබුණේ පුදුමාකාර වූ කැපවීමකින් හා පරිත්‍යාගයකිනි.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාලයීය පනතින් ප්‍රතිව්‍යුහගතකරණයකට ලක් කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවක් පිහිටුවන ලදි. ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව විශ්වවිද්‍යාල සැලසුම් කිරීම හෝ සම්බන්ධීකරණය කිරීම විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යභාරයක් බවට පත්විය. නව පනත ක්‍රියාත්මක වීමත් සමග මාතර හැර එතෙක් වූ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ සියලුම මණ්ඩප පූර්ණ බලතල සහිත විශ්වවිද්‍යාල බවට පත්විය. මේ තත්ත්වය තුළ මාතර මණ්ඩපය විශ්වවිද්‍යාල තත්ත්වයට වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ඉටු කරවා

ගැනීමට කිසිදු දේශපාලනයක් නොතිබූ මහඇදුරු රණවැල්ලයන්ට දේශපාලනඥයන් පසුපස පවා යන්නට සිදුවී තිබුණේ ය. කෙසේ නමුත් 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව 1978 දෙසැම්බර් 29 වන දින අංක 16/16 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව 1979 ජනවාරි මස 01 වන දින සිට ලංකා විශ්වවිද්‍යාලයේ මාතර මණ්ඩපය ''රුහුණු විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය'' ලෙස උසස් කරනු ලැබුවේ ය. විද්‍යායතන තත්ත්වයට පත්ව කෙටි කලක් තුළ අධ්‍යයන කටයුතුවල සාර්ථක ප්‍රගතියක් අත්පත් කර ගැනීමට සමර්ථ වෛද්‍ය පීඨ සංකීර්ණ ඉදිකිරීම් කටයුතු ද බොහෝදුරට නිමවෙමින් පැවතිණි. මේ අතරතුර මහඇදුරු රණවැල්ලයන් අධ්‍යයන රාජකාරී දිවියේ සේවය හරිහැටි ඉටු කරන අතරතුර රුහුණ විශ්වවිද්‍යාලයීය ආයතනයට පූර්ණ විශ්වවිද්‍යාල තත්ත්වය ලබාදෙන ලෙස ශාස්ත්‍රීය කමිටුව හා එක්වෙමින් කිහිප අවස්ථාවක දී ම ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1984 ජනවාරි 24 වන දින අති විශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කරමින් 1984 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රුහුණ විශ්වවිද්‍යාලයීය විද්‍යාතනය පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීමේ කාර්යභාරයේ කොටස්කරුවෙකු ද වී තිබුණේ ය.

මෙලෙස බිහිවූ රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රථම කුලපතිවරයා වශයෙන් අතිපූජ්‍ය පරවාහැර පඤ්ඤානන්ද නාහිමියන් පත්වෙද්දී පළමු උපකුලපතිවරයා ලෙස වෛද්‍ය පීඨයේ මහාචාර්ය පී.පී. සමරවික්‍රමයන් පත්වෙන විට ඉතිහාස අධ්‍යයනාංශයේ අංශාධිපති වූ මහාචාර්ය සිරිමල් රණවැල්ලයන් මානව ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති තනතුරට පත් වූයේ ය. සත්පුරුෂයෙකු වූ ආත්මානුකම්පාවෙන්, දයාර්ද්‍රභාවයෙන් රුහුණ සරසවි සිසු දරුවන්ගේ සිත් පුරවන ක්‍රියාමාර්ග ගත් එතුමා විශ්වවිද්‍යාල පරිපාලකයන් හා ඇදුරන් අතර වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම දූවැන්තයෙක් වී සිටියේ ය. ඉතා අඩු පහසුකම් මධ්‍යයේ එළියකන්ද ගුරු අභ්‍යාස විද්‍යාල ගොඩනැගිලි පරිශ්‍රයේ පවත්වාගෙන ගිය මානව ශාස්ත්‍ර පීඨයට භෞතික සම්පත් 1983 /1984 වනවිට නොතිබුණ තරම් ය. එවැනි පරිසරයක් තුළ

සිසුන් අතර වූ අඩදබර හා ගැටුම්වල ද අඩුවක් නොවීය. එක් අවස්ථාවක දී සිසුන් දෙපාර්ශවයක් අතර ගැටුමක් ඇති වී උච්චතම අවස්ථාවකට පැමිණ තිබූ මොහොතේ ගැටුමට නායකත්වය දෙමින් සිටි ශිෂ්‍යයා තරයේ අතින් අල්ලාගෙන රණවැල්ලයන්ගේ කුඩා කාමරයට දමා දොර වසා ගොස් අපූරු ගැටුම් නිරාකරණයක් පිළිබඳ පාඩමක් කියා දී තිබිණි. එමෙන්ම තවත් අවස්ථාවක දී බරපතල ගැටුමකට සම්බන්ධ වූ ශිෂ්‍ය කණ්ඩායම් දෙකකට විරුද්ධව පුළුල් විනය පරීක්ෂණයක් විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන ගොස් තිබුණේ ය. එම විනය පරීක්ෂණයේ මූලික සාක්ෂි විභාගයෙන් අනතුරුව එවකට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා වූ මහාචාර්ය ස්ටැන්ලි කල්පගේ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමකට ගැටුමට මුල් වූ දෙපාර්ශවය කැඳවා තිබුණහ. මහඇදුරු කල්පගේ ළඟින්ම පීඨාධිපතිවරයා ලෙස රණවැල්ලයන් අසුන් ගෙන සිටියදී සිසුන් දෙපාර්ශ්වය ශබ්ද නඟා එකිනෙකාට චෝදනා එල්ල කර ගැනීම ආරම්භ කරනවාත් සමගම එතෙක් මෙතෙක් සිල්වත්, ගුණවත්, ශික්ෂාකාමී ගුරු පියෙකු ලෙස ප්‍රසිද්ධියට පත්ව සිටි මහඇදුරුතුමාගේ මහත්මා චරිතය පරයා සේනාධිනායකයකු සේ සිසුන් අමතා ''ප්‍රසිද්ධියේ කුණු සෝදන්නට ලෑස්තිවෙන්නට එපා'' යන තරවටුව කරනු ලැබුවේ ය. ඒ සමගම සියලු වැරදි පිළිගෙන සුවච කීකරු ගෝලයන් ලෙස සිසුන් සමගියෙන් කටයුතු කරන බවට ප්‍රතිඥා දී පිටත්ව ගිය විලාසය ශිෂ්‍ය ප්‍රශ්න විසඳන ආකාරය පිළිබඳව කදිම පාඩමක් කියා දෙන්නකි.

ඉහත සඳහන් කරන ලද අවස්ථාව හැර එතුමා විශ්‍රාම යන තෙක්ම රුහුණ විශ්වවිද්‍යාලයේ කිසිම සිසුවකු හෝ සිසුවියක්, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කිසිවෙක් එතුමා කෝප වී සිටිනවා දැක තිබුණේ නැත. බෝසත් පියෙකු බඳු වූ මහඇදුරු රණවැල්ලයන් ද්වේශ සහගතව කිසිඳා අන්සැම හෙළා දකිමින් කිසිම අවස්ථාවක නොගැලපෙන ආකාරයෙන් කතාබහ කළ බවක් ද දැනගන්නට නැත. එළියකන්ද ශාස්ත්‍ර පීඨ පරිශ්‍රයේ දී අධ්‍යාපනය ලැබූ රුහුණේ ආදිතම විද්‍යාර්ථීන්ට අනුව නිහඬවම දේශන

කාමරයට වන එතුමාණෝ දේශනය අරඹා සුළු මොහොතකින් අඩවන් දෙනෙතින් යුතුව නළල් තලය පිරිමදිමින් ගැඹුරු කාල්පනික ලෝකයකට පිවිස දිගටම දෙසුම පවත්වාගෙන යාමට ද පුරුදුව සිටියේ ය. මහැදුරුතුමාගේ කාල්පනික ලෝකය මොනතරම් පෘථුල ද කිවහොත් අවශ්‍ය නම් ඕනෑම සිසුවෙකුට රණවැල්ල ඇදුරුතුමන්ට නොදැනීම දේශන කාමරයෙන් පිටවී යාමට හැකිව තිබුණේ ය. බොහෝ සිසුන් තමනට වද දෙන ප්‍රශ්නයක් ආ විට සිරිමල් රණවැල්ල ඇදුරුතුමන් හමුවට යාමට ද පුරුදුව සිටියේ ය. ඒ අන් කිසිවක් නිසා නොව සෑම ප්‍රශ්නයකටම, ගැටලුවකටම විසඳුමක් ඇත්තේය යන දාර්ශනික ආස්ථානය තුළ පිහිටා කටයුතු කිරීමට හෙතෙම වග බලා ගෙන තිබූ නිසා ය. එකළ රුහුණ විශ්වවිද්‍යාලට බොහෝ දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවලින් පැමිණි විද්‍යාර්ථීන්ගේ ඉංග්‍රීසි දැනුම ඉතාම පහළ මට්ටමක පැවතියේ ය. මේ තත්ත්වය තුළ එකී සිසුන් දෙතුන් වතාවක් ඉංග්‍රීසි විභාගයට පෙනී සිටිය ද අසමත් වූ අය ද ඒ අතර විය. ඉංග්‍රීසි සමත් නොවී උපාධිය ලබා නොදෙන නිසා බරපතල අභියෝගයකට මුහුණ දී සිටි සිසුන් පිරිසක් ඉංග්‍රීසි විෂය සමත් කර ගැනීම සඳහා සහනයන් ලබා ගැනීමට වරක් ඉංග්‍රීසි දෙපාර්තමේන්තුවේ ප්‍රබල ප්‍රකට චරිතයක් වූ බ්‍රෙන්ඩා නම් වූ ගුරුතුමිය සමග සාකච්ඡාවක නිරත වී සිටියහ. එම සිසුන් ඇයගෙන් ඊට කිසිදු සහනයක් නොලැබුණු තැන රණවැල්ලයන් හමුවට ගොස් තම අසරණභාවය ඉදිරිපත් කර සිටියේ ය. ඒ සමගම රණවැල්ලයන් මේ පිළිබඳව ගුරුතුමිය සමග කළ කතාබහේ දී ඉංග්‍රීසි ඉගෙනීමට පැය 2 ක් එකී සිසුන්ට වෙන් කර තිබුණ ද ඔවුන් නොපැමිණෙන බවට චෝදනා ස්වරයෙන් කරුණු ඉදිරිපත් කළ විටදී ***"තේ කපන විදියට නොවෙයි රබර් කපන්නේ"*** යන පිළිතුර දී සිනාමුසු මුහුණින් පිටව ගොස් තිබුණේ ය. මෙයින් පෙනී යනුයේ අප මහා ඇදුරුතුමාණෝ ඕනෑම ප්‍රශ්නයක් ගැටලුවක් විසඳීමෙහිලා ගැඹුරු මෘදු වදන් දාර්ශනිකව යොදාගත් ආකාරයයි.

තවද රුහුණේ ආදී විද්‍යාර්ථ මානවිකාවන්ට අනුව රණවැල්ල මහැදුරුතුමා ඔවුන් දෙස හෙලනු ලැබූ බැල්ම තුළ පවා ශික්ෂිත

ශීලාචාර නිකලැල් පිවිතුරු දයාබරත්වයක් ගැබ්ව තිබුණේ ය. එවැනි දූවැන්ත චරිතයකට හිමිකම් කියූ මහා ගුරු උතුමෙකුගේ දයාබර සිසු දරුවන් වීමට යමෙකු ලැබුවේ නම් එය කෙතරම් වටිනේද යන්න ගැන අටුවා ටීකා ටිප්පනි ලිවිය යුතු නොවේ.

මේ අයුරු ආදරණීය සිරිමල් රණවැල්ල මහා ඇදුරුතුමන්ගේ භූමිකාව පිළිබඳ සමස්ත රුහුණුවිශ්වවිද්‍යාලයීය ප්‍රජාවට ඇත්තේ ගුරුවරයෙකුට, පරිපාලකයකුට එහා ගිය අති ගෞරවනීය හැඟීමකි. අවසාන වශයෙන් රුහුණු විශ්වවිද්‍යාල ඉතිහාසය මහ සයුරක් නම් තවමත් එහි පෙරමුණේම සිටින උදම් රළ එතුමාණන්ම වන්නේ ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. ***අයිවෝ ජෙනිංස්*** (1980), කොළඹ: නීතිය හා සමාජීය භාරකාර මණ්ඩලය.
2. උස්වත්තේ ආරච්චි සහ සුසිල් සිරිවර්ධන (2009) ***සංස්කෘති විශ්වවිද්‍යාල අංකය,*** 12 කලාපය, විශේෂ අංක 04, බොරලැස්ගමුව: සංස්කෘති ප්‍රකාශන.
3. ***ලංකාවේ අධ්‍යාපනය (ක්‍රි. පූ. ස-වැනි සියවසේ සිට අද දක්වා) සියවස ප්‍රකාශනය (1969), ''විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ආරම්භය'',*** ජී. පී. මලලසේකර: 859 - 878'', කොළඹ: ලංකාවේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය.

# 3

# රෝහණ දේශයේ ඉතිහාසය ගොඩනැංවීම සහ භූ භෞතික සීමා ප්‍රතිනිර්මාණය කිරීමෙහිලා මහාචාර්ය සිරිමල් රණවැල්ලයන්ගෙන් ඉටුවූ මෙහෙය පිළිබඳව අධ්‍යයනයක්

**ආචාර්ය මනෝජ් දර්ශන බණ්ඩාර**

*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,*

*ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය,*

*රුහුණ විශ්වවිද්‍යාලය.*

## 01. හැඳින්වීම

දීර්ඝ කාල පරිච්ඡේදයක් එක්තරා ප්‍රමාණයකට කේන්ද්‍රගත වූ පාලන අධිකාරයක් හා සංස්කෘතික අංශයේ දිස් වූ මහා පරිමාණ වාස්තු විද්‍යාත්මක ස්මාරක ස්වලක්ෂණ කොට ගෙන ස්ථාවර අඩියක පැවැති රජරට ශිෂ්ටාචාරයේ එක් පැතිකඩක් රෝහණ දේශයෙන් නිරූපණය වේ. අගනුවර කේන්ද්‍ර කරගෙන බිහි වූ දිවයිනේ ප්‍රමුඛ සාහිත්‍ය මූලාශ්‍ර අගනගරවලට ලබා දෙන අවධානය රෝහණ දේශයට ලබා දී නොමැත. ජාතික ඉතිහාසයෙන් බැහැර වී ඇති ප්‍රාදේශීය ඉතිහාසයට අදාළ බොහෝ කරුණු අභිලේඛන මූලාශ්‍රවලින් හඳුනා ගත හැකි වේ. ශ්‍රී ලංකාවේ ඉතිහාසයෙහි රෝහණ දේශය වැඩි වශයෙන් ඉස්මතු වන්නේ උප රාජ්‍යයක් ලෙසිනි. ඇතැම් විටක රෝහණය ස්වාධීන රාජ්‍යයක් ලෙස ද තවත් විටක ප්‍රධාන රාජධානියක් ලෙස ද ශ්‍රී ලාංකීය දේශපාලන ඉතිහාසයෙහි උද්දීපනය වූ බව ඓතිහාසික මූලාශ්‍ර අධ්‍යයනයේ දී පැහැදිලි වේ. දේශපාලනික, සාමාජීය හා සංස්කෘතික ආදී සෑම අංශයකින් ම රෝහණයේ ඓතිහාසික කාර්ය සාඵල්‍යය මඟින් ශ්‍රී ලාංකේය අනන්‍යතාව සඳහා ලැබුණ දායකත්වය අතිමහත් ය.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ උප රාජධානිය වූ රෝහණ දේශය පිළිබඳව ප්‍රමාණවත් පර්යේෂණ නිදහසින් පසු යුගයේ මෙරට දක්නට නොලැබුණි. රුහුණ යන භූගෝලීය ඒකකය මෙරට ඉතිහාසයට වැදගත් වන්නේ කෙසේද ගැටලුව විසඳන ලද්දේ ඉතිහාසඥයන්ගේ මැදිහත්වීමෙනි. රුහුණ පිළිබඳව පර්යේෂකයන් කිහිපදෙනෙක්ම නිදහසින් පසු යුගයේ අවධානය යොමු කළ බව හඳුනාගත හැකි ය. රෝහණ රාජධානියේ ඉතිහාසය පිළිබඳව පර්යේෂණ කරන ලද වියතුන් අතර ප්‍රමුඛස්ථානය ගනු ලබන්නේ මහාචාර්ය සිරිමල් රණවැල්ලයන් වේ. ලන්ඩන් විශ්වවිද්‍යාලයට 1967 දී **'A History of Ruhuna'** නම් වූ අධ්‍යයනය ඔහු විසින් තම ආචාර්ය උපාධිය සඳහා සිදුකර ඇත. මෙම අධ්‍යයනය ආශ්‍රයෙන් 2003 වසරේ දී රුහුණ විශ්වවිද්‍යාලය මගින් ***'රෝහණ රාජ්‍යයේ ඉතිහාසය'*** නමැති රණවැල්ලයන්ගේ මාහැඟි ග්‍රන්ථය ප්‍රකාශයට පත්කර ඇත. ශ්‍රී ලංකා ඉතිහාසයේ රුහුණු රාජ්‍යය උප රාජ්‍යයක් ලෙස ඉටු කළ මෙහෙය හඳුනාගැනීම සඳහා ඇති වැදගත්ම අධ්‍යයනයන් පසුකාලීන පරම්පරාවට දායාද කරන ලද්දේ මහාචාර්ය රණවැල්ලයන්ගේ මෙම පර්යේෂණ මගිනි. රුහුණු රට නැමැති භූගෝලීය ඒකකය ඉතිහාස විෂය තුළ ස්ථාන ගත කිරීමට රණවැල්ලයන්ගෙන් ඉටු වූ මෙහෙය මෙමගින් සාකච්ඡාවට ලක්වේ.

## 02. අධ්‍යයනයේ අරමුණු

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ උප රාජධානිය වූ රෝහණ දේශය පිළිබඳව සමකාලීන සෙල්ලිපි හා සාහිත්‍ය මූලාශ්‍රවලින් බොහෝ තොරතුරු හඳුනාගත හැකි ය. ශ්‍රී ලංකාවේ රජරට රාජධානි සමයෙහි උප රාජධානිය වූ රෝහණ දේශයේ ඉතිහාසය ගොඩනැංවීම සහ භූ භෞතික සීමා ප්‍රතිනිර්මාණය කිරීමෙහිලා මහාචාර්ය සිරිමල් රණවැල්ලයන්ගෙන් ඉටුවූ මෙහෙය පිළිබඳව විග්‍රහ කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වේ. ඉතිහාසඥයාගේ කාර්යය කුමක්ද? යන පැනයට මෑතක් වන තුරුම පැවති අදහස වූයේ ***"එය සැබැවින් කෙසේ වී ද?*** (Wie es eigentlich gewesen)" යන අදහස වේ (කාර්,

1973 : 17). ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ උප රාජධානිය වූ රෝහණ දේශය බිහිවූයේ කෙසේ ද? රෝහණ දේශයේ ඉතිහාසය ගොඩනැංවීමේ ක්‍රියාවලිය කුමක්ද? රුහුණු දේශයේ භූ භෞතික සීමාවන් තීරණය කිරීමෙහිලා මහාචාර්ය රණවැල්ල ඉටුකළ මෙහෙය කුමක්ද? යන කරුණු පිළිබඳව සොයා බැලීම සහ භූ භෞතික සීමා ප්‍රතිනිර්මාණය වැනි තොරතුරු විග්‍රහ කිරීම මෙම අධ්‍යයනයේ අරමුණු වේ. එකී අවශ්‍යතාවය මෙම අධ්‍යයනය සඳහා අප පොළඹවන ලද ප්‍රධාන අරමුණක් වේ. ඉතිහාසය, වර්තමානය ද අතීතය ද අතර නිමක් නැති සංවාදයකි (කාර්, 1973 : 41). මහාචාර්ය රණවැල්ලයන් රෝහණ දේශයේ ඉතිහාසය ගොඩනැංවීමට සහ එය නගාසිටුවීමට ඉටුකළ මෙහෙය අතීතය වර්තමානය මෙන්ම අනාගතයේ ද එක ලෙස වැදගත් වනු ඇතැයි සිතිය හැකි ය.

## 03. පර්යේෂණ ක්‍රමවේදය

ශ්‍රී ලංකාවේ රෝහණ දේශයේ ඉතිහාසය පිළිබඳව යුග මෙහෙවරක් ඉටු කරන ලද මහාචාර්ය සිරිමල් රණවැල්ලයන්ගේ ඉතිහාස රචනා සම්ප්‍රදාය සහ රෝහණ දේශය පිළිබඳ අදහස් නැවත කියවීම මෙම අධ්‍යයනයෙන් සිදු වේ. අප කියවන ඉතිහාසය කරුණු උඩ පදනම් වුවත් නියත වශයෙන් කියතොත් කිසිසේත් ම කරුණු වාචික ඉතිහාසයක් නොව පිළිගත් විනිශ්චය මාලාවක් පමණි (Barraclaugh, 1955 : 14). මහාචාර්ය සිරිමල් රණවැල්ලයන්ගේ ඉතිහාස රචනා සම්ප්‍රදාය සහ රෝහණ දේශය පිළිබඳ අදහස් හඳුනාගැනීමේ දී දත්ත රැස්කිරීම සඳහා ඔහු විසින් ලියන ලද කෘති අපගේ අධ්‍යයනයට පාත්‍රවිය. විශේෂයෙන්ම රෝහණ රාජ්‍යයේ ඉතිහාසය පිළිබඳව ඔහු විසින් 2003 වර්ෂයේ දී ලියන ලද කෘතිය විශේෂයෙන්ම විමර්ශනයට ලක්විය. පුස්තකාල විමර්ශන ක්‍රමවේදය මගින් රෝහණ දේශය පිළිබඳව සාහිත්‍ය මූලාශ්‍රය සංසන්දනාත්මකව අධ්‍යනය කරමින් දත්ත ඒකරාශී කර ගන්නා ලදී. සාහිත්‍ය මූලාශ්‍ර සාක්ෂි උපයෝගී කරගෙන රෝහණ දේශයේ ඉතිහාසය ප්‍රතිනිර්මාණය සහ භූ භෞතික සීමා ස්ථාපනය

පිළිබඳ මහාචාර්ය රණාවැල්ලයන්ගේ මෙහෙය හඳුනා ගැනීම සිදුවිය. එහිදී මූලාශ්‍ර විවරණය කිරීම සඳහා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය භාවිතා කරන ලදී.

## 04. විමර්ශනය

මහාචාර්ය සිරිමල් රණාවැල්ල රෝහණ දේශයේ ප්‍රාදේශීය ඉතිහාසය ගොඩ නැංවීම සඳහා පර්යේෂණ සිදුකරන ලද ප්‍රධාන පර්යේෂකයකු ලෙස හඳුනාගත හැකි ය. ඔහු රෝහණ රාජ්‍යයේ ඉතිහාසය ගොඩනැංවීම සඳහා සිදු කරන ලද මෙහෙය විමසීමේ දී ප්‍රධාන වශයෙන් රෝහණයේ ප්‍රතිනිර්මාණය කිරීම සඳහා ඉටුකළ මෙහෙය හඳුනාගැනීම වැදගත් වේ. රෝහණය නැමැති ප්‍රාදේශීය රාජධානිය ඓතිහාසික සම්ප්‍රදාය තුළ ඉස්මතු වන ආකාරය ගැඹුරු අධ්‍යයනවලින් ලොවම වඩාත් නිවැරදි ලෙස පැහැදිලි කර ඇත්තේ මහාචාර්ය රණාවැල්ලයන් වේ. භූගෝලීය සීමාවන් හඳුනාගනිමින් මූලාශ්‍රවල කාලීන වෙනස්කම් පිළිබඳව විචාද සම්පන්න අදහස් සහ නව මතවාද රැගෙන ඒම මහාචාර්ය රණාවැල්ලයන්ගේ ඉතිහාසකරණ සම්ප්‍රදායේ ප්‍රධාන ලක්ෂණය වේ. ඔහු ඉදිරිපත් කරන අදහස් මූලාශ්‍ර මගින් සනාථ කිරීම කෙරෙහි විශේෂ අවධානයක් ලබා දී ඇත. එමෙන්ම රෝහණ රාජ්‍යය බිහිවීම, දේශපාලන බල ව්‍යාප්තිය, මුල්කාලීන රාජකීය පරම්පරා, අනුරාධපුර රාජ්‍යය සමඟ පැවති සම්බන්ධතා, රෝහණයේ ප්‍රාදේශීය පරිපාලන රටාව, දේශපාලන ව්‍යාප්තිය, ආරක්ෂක මධ්‍යස්ථානයක් ලෙස රුහුණු රාජධානියේ මෙහෙවර, නිලධාරී මණ්ඩලය, ආදායම් පාලනය, අධිකරණ බලය, ආගමික පසුබිම, සෙල්ලිපි මගින් හෙළිවන රෝහණ දේශයේ නව ඉතිහාසය වැනි බොහෝ කරුණු පිළිබඳව තම අවධානය යොමු කරන මහාචාර්ය රණාවැල්ල රෝහණ රාජ්‍යයේ ඉතිහාසය ප්‍රතිනිර්මාණය කිරීමට අවශ්‍ය ශක්තිය නිබඳව ලබා දී ඇත. මෙම අධ්‍යයනයේ දී මහාචාර්ය රණාවැල්ල විසින් රෝහණ රාජ්‍යය මූලාශ්‍ර මගින් හඳුනා ගැනීම, රෝහණ රාජ්‍යයට අයිති ප්‍රදේශ සහ රුහුණේ දේශ සීමා පිළිබඳව දක්වන ලද ඉතිහාස තොරතුරු අපගේ අවධානයට ලක් වේ.

## 4.1. රෝහණ දේශය මූලාශ්‍ර මගින් හඳුනා ගැනීම

මූලාශ්‍රගත සාක්ෂි අනුව අනුරාධපුර යුගයේ ශ්‍රී ලංකාවේ පැවති ප්‍රධාන පාලන ප්‍රදේශ අතරින් රෝහණයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. "රෝහණ" නමින් දිවයිනේ ජනපදයක් ආරම්භ කිරීම පිළිබඳ ඉතිහාසය වංසකථාගත තොරතුරු අනුව ක්‍රි. පූ. 5 වන ශතවර්ෂය තරම් ඈතට දිව යයි. මහාවංශයේ දැක්වෙන පරිදි මෙරටට මුලින් ම පැමිණි ආර්ය කණ්ඩායම් අතරට ගැනෙන භද්දකච්චායනා කුමරිය සමඟ ලංකාවට පැමිණි ඇගේ සොහොයුරන්ගෙන් කෙනෙකු වූ රෝහණ නැමැත්තා විසින් බිහි කරන ලද ජනපදය රෝහණය නමින් හැඳින් වේ.

"තථා විජිත දීඝායූ රෝහණානං නිවාසිකා
විජිත ගාමෝ දීඝායූ රෝහණන්ති ඛ මුච්චරේ"
(මහාවංසය, 9 පරිः 6, 10, 11 ගාථා)

මහාවංසයෙන් පැහැදිලි වන අන්දමට උපරාජ මහානාග අනුරාධපුර රජ වාසලෙන් සිදුවන රාජකීය කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් ලෙසට රෝහණයට පළා එන අතර ඉන් පසු ඔහු "රෝහණයේ ඊශ්වර" බවට පත්ව මාගම, උඩකඳුර ආදී විහාර කරවමින් රෝහණයේ ස්වාධීන පාලකයා ලෙස ජීවත් වූ බව පෙනෙයි (මහාවංසය, 22 පරිः 6, 7 ගාථා).

මහාවංසයේ දැක්වෙන රෝහණ යන නාමය රුහුණු රාජධානිය හැඳින්වීමට යොදාගත් ආකාරය පැහැදිලි කරන මහාචාර්ය රණවැල්ල ඒ පිළිබඳව බොහෝ මූලාශ්‍ර ඇසුරින් රෝහණයේ ඓතිහාසික පැවැත්ම නිවැරදිව හඳුනාගෙන ඇත (රණවැල්ල, 2003). මහාචාර්ය රණවැල්ල හඳුනාගත් තොරතුරු ඇසුරින් පසුකාලීන වියතුන් මේ පිළිබඳව තොරතුරු උපුටා දක්වන බව සඳහන් කළ හැකි ය. මුල්වරට රෝහණය අනිකුත් වංශ කථා සමග සංසන්දනය කොට ගැඹුරු මූලාශ්‍ර හරහා හඳුනාගන්නා ලද්දේ මහාචාර්ය සිරිමල් රණවැල්ල ය. රුහුණ පිළිබඳ පහත විස්තර සඳහා දක්වන උපුටා ගැනීම් සමග රණවැල්ලයන්ගේ කෘතියේ පිළිබඳව දැක්වෙන උපුටන ද දක්වා ඇත.

උක්ත මූලාශ්‍ර ගත පාඨයට අනුව ''රෝහණ" යන නාමය මහාවංසයේ මුල් යුගයේ සිට දැක්වෙන බව සඳහන් කළ හැකි ය. (මහාවංසය, 22 පරි: 5-8 ගාථා, 23 පරි: 13 ගාථා, 85 පරි: 27, 29, 67 ගාථා). මහාවංසයේ සඳහන් ''රෝහණ'' යන්න වෙනුවට **"රෝහණ ජනපදය"** යන නාමය සිහළවත්ථුප්පකරණ, සහස්සවත්ථුප්පකරණ හා වංසත්ථප්පකාසිනී යන ග්‍රන්ථවල සඳහන් දැක්වේ (සිහළවත්ථුප්පකරණය, 1959: 10, 37, 50, 52, 85, 105, 107; සහස්සවත්ථුප්පකරණය, 1959: 49, 50, 53, 62, 67, 69, 93, 113, 114; වංසත්ථප්පකාසිනිය, 1994: 317, 336, 345, 351, 355). (රණවැල්ල, 2003:11)

එමෙන් ම මේ ප්‍රදේශය හැඳින්වීම සඳහා **"රුහුණු රට, රුහුණු ප්‍රදේශ, රෝහණ දේශය, රෝහණ දිශා"** යන පද වංසත්ථප්පකාසිනිය තුළ යොදා ගෙන ඇති අතර (වංසත්ථප්පකාසිනි, 1994:317,382,) **"රෝහණ පස්ස"** යන පදය එක් වරක් පමණක් සිහළවත්ථුප්පකරණය භාවිත කොට ඇති බව හඳුනාගත හැකි ය (සිහළවත්ථුප්පකරණ, 1954: 34). (රණවැල්ල, 2003:11)

චූලවංසය ලෙසින් ගයිගර් හඳුන්වන මහාවංසයේ දෙවන භාගය රෝහණ දේශය හැඳින්වීම පිණිස **"රෝහණ දේශ, රෝහණ රට්ඨ, රෝහණ මණ්ඩල"** යන පද භාවිත කරයි (චූලවංසය, 43 පරි: 4-8 ගාථා). සාහිත්‍යය මූලාශ්‍රයන්ගේ මෙන් ම ශිලා ලේඛනවල ද රෝහණය යන්නට "රුහුණු දනව්, රුණු රාජ්‍ය" යන වදන් යොදා ගෙන ඇති බව පෙනෙයි (EZ, Vol 1: 20,11, 121, 67, 111, 273, 239). (රණවැල්ල, 2003:11)

***''රෝහණ බොජක''*** යන පදවි නාමය දරණ අමාත්‍යවරයෙකු ගැන තිස්සමහාරාමයෙන් හමු වූ සෙල්ලිපියක දැක් වේ. සඳගිරි ලිපියෙහි ''රෝහණික ගමණි අභය'' යනුවෙන් සඳහනක් ද වේ (වාච්චගේ, 2005: 268).

රෝහණ රාජ්‍යය, නිශ්ශංක මල්ල රජුගේ රම්බා විහාර පුවරු ලිපියෙහි හා එම රජුගේ ම ගාවුත ටැම්ලිපි රාශියක ම හඳුන්වා

ඇත්තේ ***"රුහුණු රට"*** යන නමිනි (E.Z.vol.iv: 165). සද්ධර්මලංකාරය තුළ මෙන් ම කඩයිම් පොත්වල ද රෝහණය හඳුන්වා ඇත්තේ ***"රුහුණු රට"*** යන පෙර කී නාමයෙනි (අභයවර්ධන 1996: 207). ''රෝහණ'' යන නාමය රෝහණ නම් නක්ෂත්‍ර යෝගයේ නාමයක් ගත් බවට ද ජනප්‍රවාදයේ එයි. රෝහණ පිළිබඳ මූලාශ්‍රගත තොරතුරුවලින් දැක්වෙන නාමයන් පහත පරිදි ගෙනහැර දැක්විය හැකි ය.

| **මූලාශ්‍රය** | **රෝහණය දක්වා ඇති නාමය** |
|---|---|
| මහාවංසය | රෝහණ |
| සිහළවත්ථුප්පකරණ | රෝහණ ජනපදය, රෝහණ පස්ස |
| සහස්සවත්ථුප්පකරණ | රෝහණ ජනපදය |
| වංසත්ථප්පකාසිනි | රෝහණ ජනපදය, රුහුණු රට, රුහුණු පෙදෙස, රෝහණ දේශ, රෝහණ දිසා, |
| චූලවංසය | රෝහණ දේශ, රෝහණ රට්ඨ, රෝහණ මණ්ඩල |
| නිශ්ශංකමල්ල රජුගේ රම්බා විහාර ලිපිවල | රුහුණු රට |
| සද්ධර්මලංකාරය | රුහුණු රට |
| ශ්‍රී ලංකා කඩයිම් සංග්‍රහය | රුහුණු රට |

වගුව 3.1: රෝහණය සඳහා භාවිත කල නාම (රණවැල්ල, 2003)

උක්ත කරුණු අනුව රෝහණ දේශය පිළිබඳව මූලාශ්‍ර සාක්ෂි ඇසුරෙන් විධිමත් ඉතිහාසකරණ රටාවක් ගොඩනැංවීමට දායකත්වය සපයන ලද විද්වතුන් අතරින් මහාචාර්ය සිරිමල් රණවැල්ලයන්ට ප්‍රමුඛස්ථානයක් ලැබෙන බව මනාව පැහැදිලි වේ. ඔහු විසින් හඳුනාගන්නා ලද තොරතුරු ඇසුරින් රෝහණ දේශය හැඳින්වීම පසුකාලීන පර්යේෂණවල දැකිය හැකි බව ඉතා පැහැදිලි වේ.

## 4.2. රෝහණ රාජධානියට අයත් ප්‍රධාන භූ කලාප

රෝහණ රාජධානියට අයත් භූගෝලීය සීමාවන් මොනවාද යන්න හඳුනා ගැනීම අතින් ද මහාචාර්ය රණවැල්ලයන්ගේ මෙහෙය කැපී පෙනේ. ඔහු විසින් රෝහණ දේශයේ බල ව්‍යාප්තිය සලකා බලා ශ්‍රී ලංකාවේ හරි අඩකට වඩා වැඩි ප්‍රමාණයක් භූගෝලීය වශයෙන් මුහුණ ට අයත් වූ බව පෙන්වා දී ඇත. රෝහණ දේශයේ ඉතිහාසය පිළිබඳව අධ්‍යනය කරන බොහෝ වියතුන් රුහුණේ භූ ඒකක ලෙස සලකනු ලබන්නේ මහාචාර්ය රණවැල්ල පෙන්වාදුන් භූගෝලීය සීමාවන් ය.

උතුරින් මහවැලි ගඟ ද බටහිරින් කළුගඟ ද දකුණින් හා නැගෙනහිරින් සමුද්‍ර ද රෝහණයේ පාරම්පරික දේශසීමාවන් ලෙසට සැළකෙන අතර එකී ප්‍රදේශයට අයත් ප්‍රධාන භූ කලාපයන් හයක් හඳුනා ගත හැකි ය.

01. පහතරට තෙත් කලාපය

02. සබරගමු කඳුකර කලාපය

03. මධ්‍යම කඳුකර කලාපය

04. හම්බන්තොට වියළි කලාපය

05. තලාව බිම්

06. නැගෙනහිර තැනිතලාව හෙවත් ගිනිකොනදිග තැන්න (රණවැල්ල, 2003: 11).

මෙම භූ කලාපයන් පිළිබඳ ව වෙන් වෙන් ව කරුණු අධ්‍යයනය කිරීම මඟින් රෝහණයට අයත්ව පැවති ප්‍රදේශ පිළිබඳ ව දළ අවබෝධයක් ලබා ගත හැකි වේ.

### 4.2.1. පහතරට තෙත් කලාපය

උතුරින් කළු ගඟින් හා සබරගමුව කඳුකර ප්‍රදේශයෙන් ද දකුණින් හා බටහිරින් ඉන්දියන් සාගරයෙන් ද නැගෙනහිරින් කිරිඳි ඔයෙන් ද මායිම් වන කළු ගඟේ මෝය අසළ සිට දික්වැල්ල දක්වා

වූ මුහුදු ප්‍රදේශය පහතරට තෙත් කලාපයට අයත් භූමි ප්‍රදේශය ලෙස හඳුනාගත හැකි ය. මුහුදු මට්ටමේ සිට අඩි 600 ක් දක්වා ක්‍රමයෙන් උස්වෙමින් දිවෙන භූමි භාගයකින් යුක්ත වීම මෙම ප්‍රදේශයේ ප්‍රධාන භූවිෂමතා ලක්ෂණය ලෙස හඳුනාගත හැකි ය. මෙහි කලාපයේ මුහුදු මට්ටමට ආසන්නව වගුරු බිම් රාශියක් පිහිටන අතර අතීතයේ දී පවා එවැනි ම භූ ලක්ෂණ දක්නට ලැබුණු බව දොළොස් වන සියවසේ දී පස්යොදුන්රට එනම් කළු ගඟට ආසන්න ප්‍රදේශය වගුරු බිමක් වූ බවට මහාවංසයේ සඳහන් තොරතුරුවලින් පැහැදිලි ය (මහාවංසය, 68 පරිඃ 51, 52 ගාථා). වාර්ෂික වර්ෂාපතනය අඟල් 75 ත් 100 දක්වා වන අතර එම වර්ෂාපතනය මෙම ප්‍රදේශයට ලැබෙනුයේ නිරිතදිග මෝසම මගිනි. මෙම කලාපයේ මුහුදට ආසන්න ව පිහිටි ප්‍රදේශ රාශියක්ම නිරන්තර ජල ගැලීම්වලට ගොදුරු වන්නේ ගංගාවන් කිහිපයක් ම එහි පිහිටා තිබෙන නිසාවෙනි. කළුගඟ බෙම් ගඟ ගිං ගඟ හා නිල්වලා ගඟ යන ගංගා ගලා බසිනුයේ පහතරට තෙත් කලාපයේ රුහුණට අයත් ප්‍රදේශයන් හරහා ය. (රණවැල්ල, 2003ඃ12) මෙම කලාපයට අයත් නූතන ගාල්ල, මාතර දිස්ත්‍රික්ක ලංකා ඉතිහාසයේ වඩාත් ඉස්මතු වන්නේ යටත් විජිත පාලන සමයේ ය. ස්වභාවික වරායයන්ගෙන් හෙබි මෙම භූ කලාපයේ ඓතිහාසික වශයෙන් වැදගත් සිදුවීම් රාශියකට මුහුණදුන් බවට මූලාශ්‍ර ග්‍රන්ථවලින් සනාථ වේ.

### 4.2.2. සබරගමු කඳුකර කලාපය

පහතරට තෙත් කලාපයට හා ගිනිකොනදිග වියළි කලාපයට මැදි ව උතුරින් මධ්‍යයම කඳුකරයට මායිම් ව සබරගමු කඳුකර කලාපය පිහිටා ඇත. මෙය නිම්න හා සානුවලින් යුක්ත උස් භූමි කලාපයක් වන අතර දෙණියාය රක්වාන අතර පිහිටි ප්‍රදේශය එහි ඉතා ම උසින් පිහිටි භූ කලාපය වේ. අඩි 1000 කට වඩා උස් වූ රක්වාන කඳුවැටිය හෙවත් බුලුතොට හෙල් පද්ධතිය රෝහණයට ස්වභාවිකවම ලැබුණු ආරක්ෂක පවුරක් ලෙස හඳුන්වා දිය හැකි ය. රක්වාන කඳුවැටියෙන් පටන්ගෙන සමාන්තර වැටි වශයෙන් විහිදී

ගොස් ඇති තවත් හෙල් වැටි කිහිපයක් ද මේ කලාපයේ දක්නට ලැබේ. ඉන් එකක් මොරවක දෙණියාය දෙසට බරව ද අනෙක වයඹ දෙසින් රත්නපුර දිස්ත්‍රික්කය දක්වා ද විහි දී යයි. අතීතයේ දී මෙහි වූ භූමි ප්‍රමාණයෙන් වැඩි කොටසක් කැලෑවෙන් වැසී පැවති අතර නිම්න ප්‍රදේශ වී වගාව සිදු කළ බවට සාක්ෂි වේ. එසේ වුව ද මේ කලාපයේ වැඩි ජනගහනයක් ජීවත් වූ බවට ලැබෙන සාක්ෂි අල්ප ය. කෙසේ වුව ද මෙම භූ කලාපය රෝහණ රාජධානියෙහි වැදගත් ආරක්ෂිත කලාපයක් වශයෙන් හඳුනා ගත හැකි අතර ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වශයෙන් පමණක් නොව ස්වභාවික හා ජෛව විද්‍යාත්මක වශයෙන් ද අතීතයේ සිට ම මේ කලාපයට හිමි වී ඇත්තේ සුවිශේෂී ස්ථානයකි.

### 4.2.3. මධ්‍යම කඳුකරය

පහතරට තෙත් කලාපයට, ගිනිකොන දිග වියළි කලාපයට සහ සබරගමුව තෙත් කලාපයට උතුරින් මෙම ප්‍රදේශය පිහිටා ඇති අතර අතීතයේ දී "මලය රට" හෙවත් "මහමලය රට" යන නම්වලින් හඳුන්වා තිබේ. මෙම භූමි කලාපය සාමාන්‍යයෙන් අඩි දහසකට වඩා උස්වන අතර එහි ඉතාම උස් ප්‍රදේශය අඩි 5000 සිට 7000 දක්වා අතර වේ. වර්තමානයේ මෙන් ම අතීතයේ දී ද එතරම් ජනගහනයක් එම ප්‍රදේශවල විසූ බවට සාක්ෂි දක්නට නොලැබේ. නමුත් ක්‍රි. පූ. දෙවන සියවස තරම් අතීතයේ දී මෙම ප්‍රදේශයේ ජනාවාස ව පැවැති බවට එකී ප්‍රදේශයේ ස්ථාන කිහිපයකින් හමුවන ලෙන් ලිපි සාක්ෂි සපයනු ලබයි. දිවයිනේ පිහිටි ප්‍රධාන කඳු වැටි අතරින් වඩාත්ම උස් වූ කඳු වැටි එනම්, පිදුරුතලාගල (8292), කිරිගල් පොත්ත (7857), තොටපොළ (7741), සමනළ කන්ද (7360), නමුණුකුල ආදි කඳුවැටි පිහිටා ඇත්තේ ද මේ කලාපයේ ය. එමෙන් ම මේ කඳුවැටිවලින් ආරම්භ වන මහවැලි ගඟ (206), වලවේ ගඟ (83), මැණික් ගඟ (811), කිරිඳි ඔය (73), හා කුඹුක්කන් ඔය (70) ආදී වූ ගංගාවලට ජලය ලැබෙන්නේ ද මෙම ප්‍රදේශයෙනි (රණවැල්ල, 2003: 12). රෝහණ දේශයේ ආරක්ෂිත භූමි ප්‍රදේශයක් මෙන් ම

ගිරිදුර්ග හා ජල දුර්ගවලින් ගහණ ප්‍රදේශයක් ලෙස මෙම ප්‍රදේශය වැදගත් වේ.

### 4.2.4. හම්බන්තොට වියළි කලාපය

මෙම කලාපය පිහිටා ඇත්තේ කඳුකර ප්‍රදේශයට දකුණිනි. එය මුහුදුබඩ තීරුව ඔස්සේ බටහිරින් තංගල්ලේ සිට ගිනිකොනදිග පොතුවිල් දක්වා විහිදේ. මෙම කලාපයේ විශාල ප්‍රදේශයක් වියළි වනාන්තර හා කටු පඳුරුවලින් වැසී පවතින අතර එහි උතුරු කොටසෙහි දැව සඳහා යොදා ගැනෙන කළුවර, බුරුත, හල්මිල්ල, පලු ආදී වූ වෘක්ෂවලින් ගහණ ව පවතී. වලවේ ගඟ (83), මැණික් ගඟ (87), කිරිඳි ඔය (73), හා කුඹුක්කන් ඔය (70) ආදී වූ ගංගා කිහිපයක් ම මෙම කලාපය ඔස්සේ ගලා බසී. (රණවැල්ල, 2003:12) ප්‍රදේශයේ ඇති ගංගා ඇතුරින් වළවේ ගඟ හැර අන් සියලු ගංගාවකම ජලය ඉඩෝර කාලයේ දී සිඳී යයි. රෝහණ රාජ්‍යයට අයත්ව පැවති ප්‍රධාන නාගරික ප්‍රදේශ ගණනාවක් සහ ආගමික සිද්ධස්ථාන විශාල ප්‍රමාණයක් මෙම කලාපයේ ස්ථානගත වී ඇත. ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක රාශියක් මේ ප්‍රදේශයේ දැකිය හැකි අතර තවමත් නිසි අවධානයට ලක් නොවූ පුරාවිද්‍යාත්මක භූමි භාග රාශියක් මේ ප්‍රදේශයේ විසිරී පවතී.

### 4.2.5. නැගෙණහිර තැනිතලාව හෙවත් ගිනිකොන දිග තැන්න

වළවේ ගඟින් හා මහවැලි ගඟින් ද කඳුරටින් හා මුහුදින් ද වට වූ ප්‍රදේශය මෙම කලාපයට අයත් වේ. මෙහි ඉතාම උස් වූ ප්‍රදේශය වන්නේ කඳුරට පාමුල පිහිටි අඩි 500-1000 දක්වා උස් වූ පර්වත වේදිකාවක් වන අතර එය උතුරේ දී හා දකුණේ දී පටු ව යන නමුත් මධ්‍යයේ දී පළල් ව නැගෙනහිර අතට විහිදේ. එමෙන් ම ගිනිකොන හරහා ගලා බසින මාදුරු ඔය, ගල් ඔය, හා හැඩ ඔය ආදි වූ ගංගාවල් ආරම්භ වන්නේ මෙම යට කී වේදිකාවෙනි. මෙම ප්‍රදේශයේ ඇති මහවැලි, වළවේ හා කිරිඳි යන ගංගා නිම්නයන්හි නුවරගල් කන්ද, කීරගම කන්ද, ගෝවින්ද හෙළ, ගංදෙණිය, (ගංගා ද්‍රෝණි) ආදි වූ ගිරි දුර්ග කිහිපයක් ම පිහිටා ඇත.

මෙම ගිරි දුර්ග ඇතැම් රජවරු පරසතුරු ආක්‍රමණවලින් මිදීම සිදහා බලකොටු වශයෙන් භාවිත කොට ඇති බවට ඉතිහාසයේ එන තොරතුරුවලින් හඳුනාගත හැකි ය. ගිනිකොන දිග තැනිතලා ප්‍රදේශයෙහි වෙරළ තීරය ද මඩකලපුව, ආරුගම්, පොතුවිල්, ආදි වූ කලපුවලින් යුක්ත වීම සුවිශේෂි වේ (රණවැල්ල, 2003:13).

## 4.2.6. තලාව

තලාව බිම් ප්‍රදේශය උතුරින් මධ්‍යම කඳුකරයට ද දකුණින් හම්බන්තොට වියළි කලාපයට ද බටහිරින් කඳු රටේ කොටසකට ද නැගෙනහිරින් නැගෙනහිර තැන්නට ද මායිම්ව පිහිටා ඇත. බොහෝ දුරට හුදකලාව පැවැති ප්‍රදේශයක් වන මෙහි නැගෙනහිර හා දකුණු බිම් තීරුව ජන ශූන්‍යව පැවැතුණි. හුදකලාව පිහිටි නිල්ගල, මාවරගල හා කොකාගල ආදි වූ කඳු කිහිපයකට අමතරව කුඩා කඳු වැටි විශාල ප්‍රමාණයක් මේ කලාපයේ දක්නට ලැබේ. මෙම ප්‍රදේශයෙහි ක්‍රි. පූ. 3 හා 2 වන සියවස්වල සිට ජනාවාස පැවැති බවට හෙන්නානේගල, මාවරලගල, බමුණුගල, පන්නල, මැටිගහතැන්න හා බෝගොඩ ආදි ස්ථානවල පිහිටා ඇති ලිපි මගින් හෙළි වේ (රණවැල්ල, 2003:13).

රෝහණ රාජධානියට අයත්ව පැවති භූගෝලීය ප්‍රදේශ පිළිබඳව නිවැරදි වෙන්කිරීමක් සහිතව කරුණු ඉදිරිපත් කිරීමේ ගෞරවය ඉහත දැක් වූ ආකාරයට මහාචාර්ය රණවැල්ලයන්ට හිමි වේ. ඔහු විසින් හඳුන්වා දෙන ලද භූගෝලීය ප්‍රදේශ පිළිබඳ අදහස් ඉතිහාසඥයින් වර්තමානයේ ද භාවිතා කරයි. සියවස් 15ක් පමණ වූ දීර්ඝ කාලපරිච්ඡේදයක් මුළුල්ලෙහි වෙනම ප්‍රාදේශීය රාජ්‍යයක් වශයෙන් පැවතීමටත්, තම රාජ්‍යයේ ස්වාධීනතාවය හා අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීමටත් හැකියාව ලැබුණේ රෝහණ දේශයටම අනන්‍ය වූ භූවිෂමතා ලක්ෂණවලින් මෙම ප්‍රදේශය සංයුක්ත වූ නිසාවෙනි.

## 4.3. රෝහණ දේශයේ දේශසීමාවන්

මහාචාර්ය සිරිමල් රණවැල්ලයන්ගේ දායකත්වය ලැබුණු තවත් එක් ක්ෂේත්‍රයක් ලෙස රෝහණ දේශයේ දේශ සීමා හඳුනා ගැනීම සඳහන් කළ හැකි ය. නමුත් එතුමන් විසින් සමහර ස්ථාන හඳුනා ගැනීම පිළිබඳ විවාද මතු වී ඇත. කෙසේ වෙතත් මූලාශ්‍ර සාක්ෂි උපයෝගී කරගෙන රෝහණයේ දේශ සීමාවන් ව්‍යාප්ත වූ අන්දම සහ ඒවා කාලානුරූපීව වෙනස් වූ අන්දම පිළිබඳ ඉතිහාස දැනුම ගොඩවීමට අමිල මෙහෙවරක් සිදුකර ඇත්තේ මහාචාර්ය රණවැල්ල බව සඳහන් කළ හැකි ය.

රෝහණ රාජධානියට අයත් දේශසීමා හඳුනා ගැනීමේ දී මූලිකව රෝහණයට අයත් ප්‍රදේශ කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ. දිවයිනේ ප්‍රධාන පාලන ඒකක අතුරින් එකක් ලෙස සාහිත්‍යය මූලාශ්‍ර ගණනාවකම රෝහණය දැක්වේ. 13 වන සියවසේ රචිත යැයි සැළකෙන පූජාවලියෙහි පළමුවන විජයබාහු ද්‍රවිඩයන් මරා තුන් රාජ්‍යය එක්කළ බව කීමෙන් ලංකාවේ තුන් රාජ්‍යය ගැන පළමු වරට දැක්වෙන මූලාශ්‍රය බවට පූජාවලිය පත් වේ (වාච්චගේ, 2005: 266-268). එමෙන් ම පොළොන්නරු යුගයේ දී නිශ්ශංකමල්ල අභිලේඛනවල ද තුන් රාජ්‍යයක් ගැන කියවෙන අතර ඉන් එකක් රෝහණය විය (E.Z.Vol iii: 328, 329, 330).

මේ අනුව "රෝහණික" හෙවත් රෝහණය පිළිබඳ ව එහි සඳහන් වේ. තුන් රාජ්‍යය ගැන ප්‍රථමයෙන් සඳහන් වන නිශ්ශංකමල්ල අභිලේඛන අනුව එය 12 වන සියවසට පෙර භාවිත වූ බවත්, පූජාවලියේ පළමු වන විජයබාහු තුන් රාජ්‍යය ඒකාග්‍ර කළ බව කීමෙන් එය 11 වන සියවසේ දී මෙලෙස භාවිත කරන්නට ඇති බවත් හඳුනාගත හැකි ය. මේ සියලු කරුණු අනුව පොළොන්නරු යුගයේ ආරම්භයට පෙර සිටම මේ දිවයින රුහුණු, පිහිටි, මායා යන තුන් රාජ්‍යයෙන් සමන්විත වූ බව ද එය ත්‍රී සිංහලය යනුවෙන් ව්‍යවහාර කරන්නට ඇති බව ස්ථිර ලෙස ම නිගමනය කළ හැකි බව මහාචාර්ය සුමනසිරි වාච්චගේ දක්වයි (වාච්චගේ, 2005: 266,

267). රෝහණ රාජධානියේ දේශ සීමාවන් පිළිබඳ ව අධ්‍යනයේ දී ප්‍රධාන කරුණු 03ක් අපට හඳුනා ගත හැකි ය.

1. රෝහණ රාජධානියට අයත් ප්‍රදේශ පිළිබඳ ව විද්වතුන් අතර විවිධ මතවාද පවතින නමුත් ඒ පිළිබඳ ව නිශ්චිත එකඟතාවයක් නොමැති වීම.
2. රෝහණ රාජධානියේ දේශ සීමා එහි බලයේ උච්චාවචනයට සමාන්තරව විවිධ වෙනස්කම්වලට ලක් වීම.
3. රෝහණ රාජධානියට අයත් ප්‍රදේශ අතුරින් පහත් බිම් ප්‍රදේශවලට වැඩි අවධානයක් මූලාශ්‍රවල යොමු වී නමුත් එහි කඳුකර ප්‍රදේශ කෙරෙහි අඩු වීම.

රුහුණු, මායා, පිහිටි යන තුන් රට පිළිබඳ ව 14 වන සියවසේ රචිත සිරිලක් කඩඉම් පොතෙහි ද සඳහන් වේ (සිරිලක් කඩඉම් පොත, 1961: 21, 24). මේ අනුව පොළොන්නරු යුගය වන විට ලංකාවේ තුන් රාජ්‍යයක් පැවැති බවත් ඉන් එක් රාජ්‍යයක් රෝහණය වූ බවත් ඉතා මැනවින් පැහැදිලි ය. රෝහණය නම් වූ මෙකී සුවිසල් ප්‍රදේශයේ දේශ සීමා මායිම් පිළිබඳ ව ශ්‍රී ලංකාද්වීපයේ කඩඉම් පොතෙහි සඳහන් වේ. ඒ අනුව කළු ගඟ පටන් කොත්මලය රටත් එතැන් සිට මහවැලි ගඟ මුහුදට වැටෙන තැන මහවටුවාවත් රුහුණේ මායිම් ලෙස දක්වයි (ශ්‍රී ලංකාද්වීපයේ කඩඉම් සංග්‍රහය, 1986: 207, 208). මහවැලි ගඟ සිට කළු ගඟ දක්වා ඉතිරි මායිම් සඳහන් කොට නොමැති අතර එම මායිම් ඉන්දියන් සාගරය වූ බව අනුමාන කළ හැකි ය. මේ අනුව උතුරින් මහාවැලි ගඟෙන් ද, බටහිරින් කළු ගඟෙන් ද, දකුණින් හා නැගෙනහිරින් සමුද්‍රයෙන් ද, රෝහණය මායිම් වූ බව පැහැදිලිව හඳුනා ගත හැකිවේ (සිරිලක් කඩඉම් පොත, 1961: 21, 24, කඩඉම් පොත් විමර්ශනය, 1961: 111-112).

යථෝක්ත මූලාශ්‍ර සාක්ෂි ක්‍රි. ව. අනුව 16 වන සියවසේ කඩඉම් පොත රචනා වන සමයේ කළුතර මුවදොර සිට සමනොළ කන්ද දක්වාත්, එතැන් සිට මහවැලි ගඟ මුවදොර දක්වාත් දිවෙන

ප්‍රදේශයෙන් දකුණු පස රෝහණ රාජ්‍යයට අයත්ව පැවති බව හඳුනාගත හැකි ය.

ශ්‍රී ලංකාද්වීපයේ කඩඉම් පොතේ රුහුණු රටට අයත්ව පැවති රටවල් 42 ක් දක්වා ඇත (ශ්‍රී ලංකාද්වීපයේ කඩඉම් සංග්‍රහය, 1996: 112, 113). එනම්,

1. කොත්මලේ රටමතුරට
2. ගොඩරට
3. පස්ගමරට
4. සගම රට
5. කටුවුළුරට
6. වෙරමිනිවෙනම්රට
7. සොරබොපගරගම්මන රට
8. කොටසර රට
9. ඌව රට
10. බදුල්ලය
11. රිටිගල් දනව්වය
12. දෙගාල් දනව්වය
13. කොක්කාගල් රට
14. මහාවැල් රට
15. කළුවැල් රට
16. කිණිහිරිරට
17. මාගම් රට
18. මී වෙල් රට
19. එරාවුළු රට
20. මිනිගල් රට

21. රුහුණුගල් රට
22. දිගාමඩුළු රට
23. මල්වතු මඩුළුරට
24. ගල්බෝරට
25. කොට ගල් රට
26. සබරගමු රට
27. රිටිගමු රට
28. කතරගම රට
29. මාගම්මඩුළුරට
30. ඇඹලවය
31. සඳගිරි රට
32. සිවයනම් රට
33. ගිරිවායනම් රට
34. කුඹුක්කන්දෙගොඩ නම් රට
35. වැලිගම්දහස්ගව් රට
36. දොළොස්දහස්නම් රට
37. උග්ගල් රට
38. නැදුන්ගල් රට
39. සපුගලු රට
40. බදරට
41. මාතොට
42. දෙවිනුවර

යනා දී වශයෙනි (ශ්‍රී ලංකාද්වීපයේ කඩඉම් සංග්‍රහය, 1996: 207, 208).

රුහුණු රටෙහි ''නුවරවල'' නම් ස්ථානයක් ද උක්ත මූලාශ්‍රයේ සඳහන් කොට ඇත. එමෙන් ම රුහුණු ගම්වල නම් සත්ලක්ෂ දොළොස්දහස් පන්සියයක් වන බව ද දක්වයි (කඩඉම් පොත් විමර්ශනය, 1996: 213, 214). ශ්‍රී සිංහලයේ කඩඉම් පොතේ රුහුණු ප්‍රදේශයට අයත් ප්‍රදේශ, නගර, පත්තු, කෝරල දැක්වෙන ස්ථාන නාම 45 ක් ගැන සඳහන් වේ (කඩඉම් පොත් විමර්ශනය, 1996: 112). එකී ග්‍රන්ථයෙහි රුහුණේ සීමාව බෙන්තර ගඟේ සිට රේටුනු ඇල්ල හරහා කොරවක් ගඟ හා රත්නෙලු ගඟ දෙකිඳ දක්වා පැතිර තිබුණු බවට සඳහන් කොට ඇත. නමුත් එහි රුහුණු, මායා දෙරටට ආසන්න රටවල් දක්වා නොමැති වීම නිසා මෙම කොටසෙහි රුහුණු රටෙහි මායිම් පැහැදිළි ලෙසටම නිර්ණය කර දැක්විය නො හැකි වේ.

රෝහණ දේශයට අයත් ප්‍රදේශය ලෙස සාමාන්‍යයෙන් පිළිගනු ලබන්නේ මහවැලි ගඟේ සිට කළු ගඟ දක්වා වූ භූමි ප්‍රදේශයයි. එසේ වුව ද සිරිමල් රණවැල්ලයන්ගේ අදහස වන්නේ කලා ඔය සහ කවුඩුලු ඔය රෝහණයේ දේශ සීමා වන බව යි (2003: 23). රණවැල්ලයන් විසින් රචිත "රෝහණ රාජ්‍යයේ ඉතිහාසය" නම් කෘතියේ ඓතිහාසික මූලාශ්‍ර සාධක උපයෝගී කරගෙන මාගම රාජධානිය පවා පිහිටියේ ඇළහැර ප්‍රදේශයේ බවට කරුණු ඉදිරිපත් කරමින් රෝහණයට විශාල භූමි භාගයක් හිමිව පැවති බව තහවුරු කිරීමට උත්සාහ දරා ඇත (2003: 23-53). රෝහණ රාජධානිය දේශ සීමා පිළිබඳව රණවැල්ල මහාචාර්යතුමා දක්වන ලද අදහස් මූලාශ්‍ර සාධක මත පදනම් වී ඉදිරිපත් කොට ඇත. සාහිත්‍ය මූලාශ්‍ර සහ සෙල්ලිපි මූලාශ්‍ර වලින් හෙළිවන තොරතුරු ඇසුරින් එතුමන් විවාද සම්පන්න අදහස් ඉදිරිපත් කොට ඇත. (රණවැල්ල, 2003: 23-53) මූලාශ්‍රවල පවතින නම් වලින් හෙළිවන ස්ථාන නිශ්චිතවම එක ම ස්ථානය ලෙස සැලකීමත්, එම නිසා නම් දෙකකින් හැඳින්වූ ස්ථාන දෙකක් ලෙස නොසලකා අදාළ ස්ථාන නිශ්චය කිරීමට යෑම හේතුවෙන් මහාචාර්ය රණවැල්ල සූරීන් ඉදිරිපත් කරන ඇතැම් අදහස් මෙලෙස විවේචනය වී ඇත.

නමුත් මෙම අදහස මුල් යුගයේ සිට ම විවිධ මතවාදවලට පාත්‍ර වූ අතර රෝහණයට එතරම් විශාල ප්‍රදේශයක් අයත් නොවන බවට අදහස් ද පවතී (ගුණසිංහ, 1968: 13). මූලාශ්‍ර ගත තොරතුරු අනුව රුහුණ සහ රජරට අතර දේශ සීමාව කළුතර සිට කළු ගඟ දිගේ ශ්‍රීපාදය කන්ද දක්වා ද, එතැන් සිට කටුගස්තොට ඔස්සේ මහියංගනයට සහ එතැන සිට මහවැලි ගඟ ඔස්සේ මුහුද තෙක් ද විහිදුනි (ගුණසිංහ, 1968: 12). රෝහණය සතු දේශ සීමාවන් එහි දේශපාලන ශක්තිය මත රඳා පැවති බව හඳුනාගත හැකි ය.

යථෝක්ත සාකච්ඡාව අනුව රෝහණයේ දේශ සීමා යම් යම් හේතු සාධක අනුව කාලයෙන් කාලයට වෙනස්කම්වලට ලක්ව පැවති බව මූලාශ්‍ර ගත කරුණු අනුව පැහැදිලි වේ. මූලාශ්‍ර පිළිබඳව ගැඹුරු අධ්‍යනයක් සිදුකරන ලද මහාචාර්ය රණවැල්ලයන්ගේ තොරතුරු ඇසුරින් රෝහණයේ දේශසීමා ව්‍යාප්තිය ප්‍රතිනිර්මාණය කළ හැකි ය. රෝහණ රාජධානියේ දේශසීමා පිළිබඳ පහත දැක්වෙන මූලාශ්‍ර මගින් ද එකී අදහස පිළිගැනීමට අපට උපකාර වේ.

I. ක්‍රි. පූ. තුන්වන වන සියවසේ රුහුණේ රජකළ ගෝඨාභය රජු කතරගම ක්ෂත්‍රියයන් ඝාතනය කර, එහි පව් ගෙවීම පිණිස මහවැලි ගඟේ එගොඩ මෙගොඩ විහාර 500 බැගින් කරවූ බවට ධාතුවංසයේ දැක්වෙන සඳහන අනුව ආරම්භක යුගයේ රෝහණ දේශ සීමාවේ උතුරු මායිම මහවැලි ගඟ ද පසු කළ බව පෙන්නුම් කරයි (ධාතුවංසය, 1890: 23).

*II.* ක්‍රි. ව. හය වන සියවසින් පසු ව රෝහණයේ බටහිර මායිම කළු ගඟ ප්‍රදේශය බවට පත් වූ අන්දම මූලාශ්‍ර අනුව පැහැදිලි වේ. ක්‍රි. ව. හය වන සියවසේ සිලාකාල රජු දවස දක්ඛිණ දේශයේ දකුණු මායිම රුහුණ ආරම්භ වන කළු ගඟ විය (මහාවංසය, 41 පරි: 36 ගාථා).

III. ක්‍රි. ව. අටවන සියවසේ අනුරාධපුරයේ රජ කළ දෙවන මහින්දට (ක්‍රි. ව. 777-797) එරෙහිව රුහුණේ පාලක දප්පුල කුමරුගේ කැරැල්ලෙන් පසු ව රෝහණයේ නැගෙනහිර සීමාව ගල් ඔය නදිය දක්වා විතැන් වූ බව පෙනී යයි (මහාවංසය, 48 පරි: 131-133 ගාථා).

IV. "රෝහණ ජනපදේ මාතලේ විහාරේ" ක්‍රි. ව. 10 වන සියවසේ රචිත සහස්සවත්ථුප්පකරණ සඳහන අනුව අනුරාධපුර යුගයේ අවසන් භාගයේ මාතලේ ප්‍රදේශය රුහුණට අයත් ව පවතී (සහස්සවත්ථුප්පකරණ, 1959: 113-114).

V. මාතලේ දිස්ත්‍රික්කයටම අයත් කොට්ඨසර හා මිණිපේ ප්‍රදේශ රුහුණට අයත්ව පැවති බවත් (ධාතුවංසය, 1890: 78-79), අදාළ ප්‍රදේශයේ ම හත්තොටුව ද (හත්තොට්ඨ ජනපදය) රුහුණට අයත් බවට (සද්ධර්මාලංකාරය, 1934: 497) දැක්වෙන මූලාශ්‍ර සාධකය අනුව ද මධ්‍ය කඳුකරයේ උතුරු බෑවුම දක්වා රුහුණ ව්‍යාප්තව පැවති බව පෙනී යයි.

VI. චෝළයන් විසින් ක්‍රි. ව. 970 දී පමණ පස් වන මිහිඳු අල්ලා ගැනීමෙන් අනතුරුව පොළොන්නරුව අගනගරය බවට පත් කර ගැනීමත් සමඟ රෝහණය හා රජරට අතර මහවැලි ගඟ මායිම ලෙස පැවතීමේ යුගය අවසන් වී රෝහණයට අයත් භූමි දකුණට විතැන් වීම සිදු විය.

VII. පළමුවැනි විජයබාහුගේ මරණින් පසු රෝහණය දොළොස් දහස් රට හා අට දහස් රට යනුවෙන් පාලන ඒකක දෙකකට බෙදී ඇත (මහාවංසය, 60 පරි: 86-90 ගාථා, 61 පරි:1-2, 8-11 ගාථා). බෙම් ගඟේ සිට වලවේ ගඟ දක්වා දොළොස් දහස් රට ද, වලවේ ගඟේ සිට මහවැලි ගඟ දක්වා නැගෙනහිරින් ඉන්දියන් සාගරය දක්වා විහිදි ප්‍රදේශය අටදහස් රට යනුවෙන් ද හැඳින්වීය. දක්ඛිණ දේශ පාලක පළමුවැනි මානාභරණ කුමරුගේ මරණින් පසු රෝහණය නැවත තනි ඒකකයක් බවට පත් වූ අතර පොළොන්නරු යුගයේ අවසානය දක්වා මානාවුලුපුරය එහි අගනුවර බවට පත් විය.

VIII. පොළොන්නරුවේ පළමු වැනි පරාක්‍රමබාහු රජු 12 වන සියවසේ දී දක්ඛිණ දේශයේ පාලකයාව සිටි අවධියේ දී කළු ගඟ හා බෙම් ගඟ අතර පස් යොදුන් කෝරළය සංවර්ධනය කර ඇත (මහාවංසය, 68 පරි: 51-55 ගාථා). ඒ අනුව රෝහණයේ බටහිර සීමාව බෙන්තර ගඟ දක්වා දකුණට විතැන් වූ බව හඳුනා ගත හැකි ය.

IX. දඹදෙණි යුගයේ දෙවැනි පරාක්‍රමබාහු රජු (ක්‍රි. ව. 1236-1271) විසින් නූතන ගාලු දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශවල කළ බෞද්ධාගමික ඉදිකිරීම් (මහාවංසය, 63 පරිː 1-4 ගාථා) හා මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර දේවාල වැඩිදියුණු කිරීම් (මහාවංසය, 85 පරිː 85-87 ගාථා) මඟින් පැහැදිලි වන්නේ දඹදෙණි රාජ්‍යයට රෝහණයේ දොළොස් දහස් රට අයත්ව පැවති බව යි. දඹදෙණි සමය වන විට රෝහණයේ බටහිර ප්‍රදේශ කළු ගඟේ සිට වලවේ ගඟ දක්වා විතැන් ව ගොස් භූමි ප්‍රදේශය කුඩා වූ බව පෙනී යයි.

X. දහතුන් වන සියවසේ අගභාගයට අයත් මඩකලපු දිස්ත්‍රික්කයේ පානම් පත්තුවේ මඟුල් මහා විහාරය නම් ස්ථානයෙන් හමු වූ ලිපියක "සොලී සේනාව මැඩෑ රුණු රට රජ කරන පැරකුම් දෙබෑ රජ දරු කෙනෙකුන්..." රණවැල්ල, 2003) යන සඳහනින් ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය සොලී ආක්‍රමණයට ලක් වූ අවස්ථාවේ ස්වාධීනව රුහුණේ කුඩා ප්‍රදේශයක පැවති රාජධානියක් පිළිබඳ ව තොරතුරු හෙළි වේ.

යථෝක්ත සාක්ෂි සළකා බලන විට රෝහණ දේශයේ දේශසීමාවන් වරින් වර වෙනසකට ලක් වූ බව හඳුනාගත හැකි ය. දිවයිනේ විශාල භූමි භාගයක පැතිර පැවති රෝහණය ක්‍රමයෙන් කුඩා භූමි භාගයකට සීමා වූ අන්දම ඉහත කරුණු අනුව පැහැදිලි වේ.

IX සහ X යන ප්‍රකාශයන් දෙකෙන් ම පැහැදිලි වන්නේ රෝහණ රාජ්‍යයේ දේශසීමා විතැන්වීමක ට වඩා රෝහණ දේශයේ ඇතැම් ප්‍රදේශ දඹදෙණි සහ ගම්පොළ රාජධානියට අයත් වූ බව යී මින් පැහැදිලි වනුයේ 12-13 සියවස් වෙන විට රෝහණය රාජධානියක් ලෙස පැවතුණා නොව ලක්දිව එවකට පැවති රාජධානිවල ප්‍රාන්තයක් ලෙස පැවති බව ය.

පැරණි රෝහණය සම්බන්ධයෙන් මූලාශ්‍රයන්හි සඳහන් උක්ත කරුණු අනුව එකී සුවිසල් ප්‍රදේශයට ලංකාවේ දකුණ, ගිනිකොන හා නැගෙනහිර ප්‍රදේශ අයත් වන අතර ඉන්දීය සාගරයට මායිම්

වන වෙරළ තීරයේ සිට රට තුළට ගමන් කොට මධ්‍යම කඳුකරයේ දකුණ හා නැගෙනහිර සීමාව තෙක් වූ විශාල භූමි ප්‍රමාණයක් පෞරාණික රෝහණයට අයත්ව පැවැති බව පැහැදිලි වේ. මෙකී භූමි ප්‍රමාණය දළ වශයෙන් ගතහොත් එය සමස්ත ශ්‍රී ලංකා භූමියෙන් හරි අඩකට ආසන්න ප්‍රමාණයක් ගනී. මෙතරම් විශාල ප්‍රදේශයක පැතිර ඓතිහාසික රෝහණය වර්තමානයේ ගාල්ල, මාතර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කයන්ට පමණක් සීමා වී ඇති බව පෙනෙයි.

## සමාලෝචනය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම උප රාජධානියක් වන රෝහණ දේශය මෙරට ඉතිහාසය පෝෂණය කිරීම සඳහා දායක වූ ඓතිහාසික භූමියක් ලෙස හැඳින්විය හැකි ය. රෝහණ රාජධානිය පිළිබඳව පර්යේෂණ පැවැත්වූ ප්‍රමුඛ පෙළේ විද්වතකු ලෙස මහාචාර්ය සිරිමල් රණවැල්ලයන් හැඳින්විය හැකි ය. රෝහණ රාජධානිය පිළිබඳ ව ගැඹුරු මූලාශ්‍රය පරිශීලනය කරමින් විධිමත් දැනුමක් සහිත ඉතිහාසකරණ සම්ප්‍රදායක් බිහිකිරීමේ පුරෝගාමියකු ලෙස එතුමා ඉතිහාසගත වේ. රෝහණ යන නාමය විවිධ මූලාශ්‍ර භාවිතා කරමින් හඳුනා ගැනීම ඉතා වැදගත් ය. සාහිත්‍ය මෙන්ම අභිලේඛන මූලාශ්‍ර ඇසුරින් රෝහණ රාජධානියේ ඉතිහාසය ඉස්මතු කිරීමත්, රෝහණයට අයත් නිශ්චිත භූගෝලීය ඒකක හඳුනා ගැනීමත් රණවැල්ලයන් අතින් ඉටු වූ වැදගත් මෙහෙවරකි. විවාද සම්පන්න අදහස් සමග රෝහණ රාජධානියට අයත් දේශ සීමා පිළිබඳ නව අදහස් ඉදිරිපත් කිරීම ද මෙහිලා වැදගත් වේ. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ උප රාජධානියක් වූ රෝහණ දේශය මෙරට ඉතිහාසයේ වැදගත් වූ අන්දම පිළිබඳව නිශ්චිත සාධක සහිතව ගැඹුරින් අධ්‍යනයකොට ඒ පිළිබඳ විධිමත් දැනුම් සම්භාරයක් නිෂ්පාදනය කිරීම මහාචාර්ය රණවැල්ලයන්ගේ මෙහෙවරෙහි වැදගත්ම අංගයකි. රෝහණ රාජධානියේ ඉතිහාසය එහි ආරම්භක යුගයේ සිටම පිළිවෙලින් ගොඩනැංවීම අතින් ද, රාජධානියක් ලෙස රෝහණයේ දේශපාලන

වර්ධනය සහ බල ව්‍යාප්තිය මෙන්ම රෝහණ රාජධානියේ අතීත සභ්‍යත්වය පිළිබඳ වැදගත් තොරතුරු රටට දායාද කිරීම අතින්ද මහාචාර්ය සිරිමල් රණවැල්ල යන නාමය ශ්‍රී ලංකාවේ රෝහණ රාජධානියේ ඉතිහාස සලකුණ බවට පත්ව ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. ***මහාවංශය,*** (සංස්: දේවරක්ෂිත බටුවන්තුඩාවේ සහ ශ්‍රී සුමංගල හිමි) 1959, කොළඹ, සීමාසහිත රත්නාකර යන්ත්‍රාලය.
2. ***වංසත්ථප්පකාසිනි,*** (සංස් : අකුරැටියේ අමරවංශ, හේමචන්ද්‍ර දිසානායක), 2005. කොළඹ : එස් ගොඩගේ සහ සහෝදරයෝ.
3. ***ධාතුවංශය,*** (1924), දඹගස්ආරේ ශ්‍රී සුමේධංකර හිමි සංස්කරණය, කොළඹ : රත්නාකර යන්ත්‍රාලය.
4. ***පූජාවලිය,*** (1976), බෙන්තොට සද්ධාතිස්ස හිමි සංස්කරණය, කොළඹ : එස් ගොඩගේ සහ සහෝදරයෝ.
5. ***රසවාහිනී,*** (1961), කිරිඇල්ලේ ඥාණවිමල හිමි සංස්කරණය, කොළඹ : එස් ගොඩගේ සහ සහෝදරයෝ.
6. ***සද්ධර්මාලංකාරය,*** (1929), ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම් සංස්කරණය : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ප්‍රථම මුද්‍රණය.
7. ***සහස්සවත්ථුප්පකරණය,*** (1959), පොල්වත්තේ බුද්ධදත්ත හිමි, සංස්කරණය : කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
8. ***සීහළවත්ථුප්පකරණය,*** (1959), පොල්වත්තේ බුද්ධදත්ත හිමි, සංස්කරණය, කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
9. Barraclaugh, G, (1955) ***History in a Changing world,*** London : Oxford University press.
10. **Epigraphia Zeylanica,** Vol. I (1912) Ed. Wickramasingha Don Martiono de Silva, London

11. **Epigraphia Zeylanica,** Vol. II (1928) Ed. Wickramasingha Don Martiono de Silva,London.

12. **Epigraphia Zeylanica,** Vol. III (1933) Wickramasingha Don Martiono de Silva, London.

13. **Epigraphia Zeylanica,** Vol. IV (1943) Wickramasingha Don Martiono de Silva, London.

14. **Epigraphia Zeylanica,** Vol. V, Part I (1955) Ed. Paranavitana, S. Department of Archaeology, Colombo.

15. Paranavithana S., **Inscription of Ceylon,** 1970, Department of Archeology. Colombo.

16. අභයවර්ධන එස්. යූ., (1978), ***කඩයිම් පොත් විමර්ශනය,*** කොළඹ: රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුව.

17. කාර්, ඊ. එච්. (1973), (පරි. චරිතා විජේරත්න) ***ඉතිහාසය යනු කුමක්ද?,*** කොළඹ : ජාත්‍යන්තර ප්‍රකාශකයෝ.

18. රණවැල්ල සිරිමල්, (2003), ***රෝහණ රාජ්‍යයේ ඉතිහාසය,*** මාතර: රුහුණ විශ්වවිද්‍යාලය.

19. වාච්චගේ එස්, (2004), ***"රෝහණය එදා සහ අද"*** ආරිය රාජකරුණා උපහාර ලිපි සංග්‍රහය, මාතර : රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රයේ ප්‍රකාශනය.

20. වාච්චගේ එස්, (2005), ***දුට්ඨගාමිණී අභය මහරජ,*** කර්තෘ ප්‍රකාශනයකි.

21. ගුණවර්ධන, රණවීර, (2005), ***ඉතිහාසයේ අතීතය,*** කොළඹ : ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

22. සිරිවීර, ඉන්ද්‍රකීර්ති, 2001. ***රජරට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානි,*** කොළඹ : දයාවංශ ජයකොඩි සහ සමාගම.

# 4

# පුරාවිද්‍යාව මහජනයා වෙත ගෙන ගිය ඉතිහාසඥයා

## අභිලේඛනඥයෙකු වශයෙන් මහාචාර්ය සිරිමල් රණවැල්ලයන්ගේ කාර්යභාරය

**තරිඳු පීරිස්**
තාවකාලික සහාය කථිකාචාර්ය,
ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය,
රුහුණ විශ්වවිද්‍යාලය.

''ඉතිහාසඥයෙකුට පැවරෙන කර්තව්‍යයන් රාශියක් වෙයි. මේ අතුරෙන් වැදගත් කටයුතු දෙකක් ඔබට හඳුන්වා දෙනු කැමැත්තෙමි. පළමුවැන්න අපවාද ප්‍රචාරය නොකිරීමයි. දෙවැන්න නීරස දේ නොකීමයි. පළමුවැනි කර්තව්‍ය පැහැර හැරීම ගැන මම ඔබට සමාව දෙමි. වැඩි දෙනෙකු ඔබ ලියූ දෙය නොකියවන හෙයිනි...'' - වෝල්ටෙයාර් (Bronowski & Mazlish 1963: 299).

මේ පර්යතය තුළ දී කතා නායකයා සැබවින් ම පුරාවිද්‍යාඥයෙකු නොවේ. ඔහු වනාහි ඉතිහාසඥයෙකි. නමුදු ඉතිහාසඥයෙකු වශයෙන් ඔහු ගේ ආවේෂණය වනාහි ඓතිහාසික පුරාවිද්‍යා ශික්ෂණය යටතේ සංවිධානය වූ වෙනස් ම ආකෘතියකින් යුක්ත වූවකි. මේ කතා නායකයා වනාහි අනෙකකු නොව මහැදුරු පරණවිතානයන්, ආචාර්ය ජී. සී. මෙන්ඩිස් වැනි අග්‍රගණයේ පඬිවරුන් ගේ ආභාසය ලද ගාල්ලගේ සිරිමල් රණවැල්ල නොහොත් මහාචාර්ය සිරිමල් රණවැල්ලයන් ය. වර්ෂ 1921 ඔක්තෝම්බර් මස

18 වන දින ගාල්ලේ කොග්ගල දී උපන් මේ අද්විතීය ප්‍රාඥයා සිය බුද්ධිමය ප්‍රභායෙන් ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රය දීපනය කොට වර්ෂ 2020 දෙසැම්බර් මස 26 වනදා මෙරට දැනුම් සම්ප්‍රදායට හිදැසක් එක් කරමින් සමුගන්නා ලදී.

සිය ශාස්ත්‍රීය දිවියේ උසස් අධ්‍යාපනය සඳහා මහාචාර්ය රණවැල්ල අත්පොත් තබන ලද්දේ එවක ලංකා විශ්වවිද්‍යාලය නමින් හඳුන්වන ලද පේරාදෙණිය සරසවියෙනි. එහි දී ඔහු වඩාත් නැඹුරුවක් දක්වන ලද්දේ, ප්‍රාචීන ඉතිහාසය කෙරෙහි ය. ප්‍රාචීන ඉතිහාසය අධ්‍යයනයේ දී ඉතිහාසය පිළිබඳ දැනුම්වත්භාය කෙරෙහි පමණක් අවධානය යොමු නොකළ රණවැල්ලයන් පාළි, සංස්කෘත ආදී ප්‍රාචීන භාෂාවන් ද ප්‍රගුණ කිරීම නිසා ප්‍රාචීන ඉතිහාසය පිළිබඳ ව නිවැරදි තලයක කටයුතු කිරීමට ද ඔහුට හැකියාවක් ලැබුණි. සත්‍ය වශයෙන් ම පරණවිතානගෙන් පසුව ශ්‍රී ලංකා ඉතිහාසයේ අභිලේඛන විද්‍යාව පිළිබඳ ප්‍රාමාණිකයෙකු වීමට ඔහු ගේ මේ ප්‍රාචීන භාෂා පරිඥාන විශාල පිටුබලයක් විය. අභිලේඛන විද්‍යාඥයෙක් වීම හේතුවෙන් මහාචාර්ය රණවැල්ල තුලනාත්මක ඉතිහාස අධ්‍යයන සම්ප්‍රදායක් යටතේ තම පර්යේෂණයන් පර්‍යීතගත කිරීමටත්, පුරාවිද්‍යාත්මක ආවේෂණය තුළ පරේය්ෂණයන් මෙහෙයවීම කෙරෙහිත් හැකියාවක් ගොඩනගාගනු ලැබී ය. තම විෂයීය ශික්ෂණය ඉතිහාසය වුවත් ඓතිහාසික පුරාවිද්‍යාත්මක දාෂ්ඨීය යටතේ ඔහු විසින් මෙරට පුරාවිද්‍යාත්මක ශික්ෂණය තුළ වඩාත් ප්‍රමුඛ භූමිකාවක් නිරූපණය කරන ලදී.

රණවැල්ලයන් පුරාතන ශ්‍රී ලංකාවේ ඉතිහාසය කෙරෙහි වඩාත් නම්‍යතාවක් දැක්වීම නිසා ඔහුව විෂයීය ශික්ෂණයේ දී ඉතිහාසඥයෙකු වශයෙන් හඳුන්වා දෙනු ලැබුව ද, ඔහු විසින් අභිලේඛ පාදක කොටගනිමින් සිදු කරන ලද අධ්‍යයනයන් හේතුවෙන් පුරාවිද්‍යාඥයෙකු ගේ දෘෂ්ඨියෙන් ද හඳුන්වාදීමේ හැකියාවක් ඇත. මේ පර්‍යීතයේ දී, මහාචාර්ය රණවැල්ල පිළිබඳව වඩාත් අධ්‍යයනයට හසු කිරීමට උත්සාහවත් වන්නේ සාමාන්‍ය ජනයා වෙත පුරාවිද්‍යාව ප්‍රවේශ කරවීමට කැප වූ ඉතිහාසඥයෙකු

වශයෙනි. 1966 වර්ෂයේ දී ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් සිය රෝහණයේ දේශපාලන ඉතිහාස යන පර්යේෂණ නිබන්ධය සඳහා ආචාර්ය උපාධිය හිමිකරගත් රණවැල්ල සිය අධ්‍යයන සීමාව ශ්‍රී ලංකාවේ අභිලේඛන ක්ෂේත්‍රය කෙරෙහි ද යොමු කරන ලදී. ඉහතින් සඳහන් කළ ආකාරයට සිය විශ්වවිද්‍යාල අධ්‍යයනය සඳහා ප්‍රාචීන භාෂාවන් හැදෑරීම නිසා අභිලේඛනඥයෙකු ගේ අවේෂණය තුළ පහසුවෙන් ගමන් කිරීමේ හැකියාව රණවැල්ල මහතාට හිමි විය. විශේෂයෙන් ම 1979 වර්ෂයේ දී රුහුණු විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ මහාචාර්යවරයා බවට පත්වීමෙන් පසුව ඔහු විසින් වඩාත් අවධානය යොමු කරන ලද්දේ ක්‍රි. ව. 8 වන සියවසට පමණ අයත් අත්තාණි ශිලා ලේඛන නමින් හඳුන්වනු ලැබූ ශිලා ලේඛන විශේෂය පිළිබඳව ය. එහි දී ඔහුට පූර්වයෙන් මේ සම්බන්ධයෙන් කියැවීම කළ සෙනරත් පරණවිතාන සහ එඩ්වඩ් මියුලර් ගේ කියැවීම් නැවත කියවා අදහස් පළ කිරීමට ද ආචාර්ය රණවැල්ලට සිදු විය. මෙහි දී දෙපාර්තමේන්තුව විසින් පිටපත් කරන ලද ඉහත සියවස් නියෝජනය කළ ශිලා ලේඛනයන්හි ස්පර්ශිත ලාංඡනයන් (estampages) 71 නැවත කියවා රණවැල්ල මහතා විසින් නැවත කියවා ප්‍රකාශයට පත් කරන ලදී. එම ප්‍රකාශනය Inscriptions of Ceylon Volume V, part I වශයෙන් ප්‍රකාශයට පත් විය. එම ශිලා ලේඛන අතුරෙන් ලිපි 51 යොදාගනිමින් 1999 වර්ෂයේ දී ඔහු විසින් The Inscriptions of Äp Kitagbo and Kings Sena I, Sena II and Udaya II යන විචාරාත්මක ග්‍රන්ථය ප්‍රකාශයට පත් කළේ ය. මෙතැන් සිට ශ්‍රී ලංකාවේ ශිලා ලේඛන සංග්‍රහයේ ප්‍රධාන සංස්කාරවරයා වශයෙන් සේවය කළ මහාචාර්ය සිරිමල් රණවැල්ල සැබෑ වශයෙන් ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාව සාමාන්‍ය ජනයා වෙත ප්‍රවේශ කිරීමේ කාර්යයේ ආරම්භකයා වශයෙන් හඳුන්වා දිය හැකි ය.

ඉතිහාසය සහ පුරාවිද්‍යාව යන විෂයීය ශික්ෂණයන් ද්විත්වය මානව අතීතය අධ්‍යයනය කරන්නා වූ විෂයීය ශික්ෂණයන් වශයෙන් හඳුන්වනු ලැබුවත් එහිදී භාවිතයට ගනු ලබන්නේ එකිනෙකට

වෙනස් වූ ක්‍රමවේදයන් ද්විත්වයකි. සරල වශයෙන් හැඳින්වුව හොත් පුරාවිද්‍යාව තුළ මූලික වශයෙන් සිදු කරනු ලබන්නේ, අතීත මානව සමාජයන්ට අයත් ද්‍රව්‍යමය සාධකයන් ඇසුරින් පුරාතනය අධ්‍යයනයට හසු කිරීම යි. 1960 වන තෙක් ම ලෝක පුරාවිද්‍යා තුළ පැවතියේ ඓතිහාසික සංස්කෘතික ප්‍රවේශය ඔස්සේ අතීත මානව සමාජ අධ්‍යයනයට හසු කිරීම සහ අර්ථනිරූපණය කිරීම යි. පරණවිතාන මහතා විසින් සිදු කරනු ලැබුවේ ද, මේ ඓතිහාසික සංස්කෘතික දෘෂ්ඨිකෝණය ඔස්සේ මානව අතීතය පිළිබඳව අධ්‍යයනයට ලක් කිරීම යි. එහි දී ඔහු පුරාතන ශ්‍රී ලාංකේය සමාජය අධ්‍යයනය කිරීමේ දී ශිලා ලේඛන සාධක බහුල වශයෙන් ම උපයෝගී කරගත් අතර, එහි දී ලාංකේය ඉතිහාසයේ ඇතැම් තොරතුරු වඩාත් සනාත වීම, තහවුරුවීම සහ සාහිත්‍ය මූලාශ්‍රයේ සඳහන් ඇතැම් තොරතුරු වෙනස්වීම ද සිදු විය (කිරිබමුණේ 1972: 147). නමුත් පරණවිතාන මහතා ගේ අවධානය පුරාතන ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජීය තත්ත්වය වශයෙන් යොමු නොවුණු අතර රණවැල්ල ගේ අවධානය බහුල වශයෙන් ම යොමු වූ විෂය ක්ෂේත්‍රයක් වශයෙන්, පුරාතන ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජීය තත්ත්වය වැදගත් වේ. ඔහු විසින් තම ඓතිහාසික පර්යේෂණය තුළ දී සමකාලීන පැරණි ඉතිහාසය රචනා කිරීමේ දී, ශිලා ලේඛනයන්හි අංඩංගු තොරතුරු උපයෝගී කරගත් අතර, පෙර කියවා තිබූ ඇතැම් ලේඛනයන් වඩාත් නිවැරදි ආකාරයේ කියවා අර්ථ විවරණය කිරීම ද සිදු කරන ලදී. මේ ව්‍යායාමයේ දී වඩාත් වැදගත් ම පර්යේෂණයක් වශයෙන් ඔහු විසින් ලන්ඩන් විශ්වවිද්‍යාලයට ආචාර්ය උපාධිය පණිස ඉදිරිපත් කළ **A Political History of Rohana** යන උපාධි නිබන්ධ ඇසුරින් රචිත රෝහණ රාජ්‍යයේ ඉතිහාසය යන ග්‍රන්ථය ප්‍රමුඛතම සාධකය වශයෙන් වැදගත් වේ. එහි දී ඔහු විසින් සාහිත්‍ය මූලාශ්‍රයේ සඳහන් තොරතුරුවල ආලෝකය ලබාගනිමින් ශිලාලේඛන සාධක ඔස්සේ වඩාත් විචක්ෂණශීලීව සහ විචාරශීලීව පුරාතන රෝහණයේ ඉතිහාසය අධ්‍යයනයට හසු කරන ලදී. එහි දී අභිලේඛනඥයෙකු වශයෙන් ඔහු ගේ කාර්යාවලිය මැනවින් විශදකොට තිබේ. රෝහණයේ දේශපාලනික තත්ත්වය පිළිබඳව ආරම්භක අවධියේ සිට ශිලා ලේඛන ඇසුරින් ඔහු විසින් වඩාත් විශ්වසනීයව මෙහිදී ගෙනහැර දක්වා තිබේ. එමෙන් ම, රෝහණයේ

රාජ්‍යයට අයත් මූල බ්‍රාහ්මීය ශිලා ලේඛනයන්හි සඳහන් පුද්ගල නාමයන් ඇසුරින් දසමහා යෝධයන් පිළිබඳව ඔහු විසින් සිදු කරනු ලබන විග්‍රහයේ දී සාහිත්‍ය මූලාශ්‍රයේ දැක්වෙන අතිශෝක්තීන් සුමට වශයෙන් උපහාසය ලක් කිරීමත්, ඒ පුවත්හි යථා තත්ත්වය පිළිබඳව විචාරයට ලක් කිරීමට ද පර්යේෂකයන්ට අවස්ථාවක් ලබාදී තිබේ (රණවැල්ල 2016: 7). වංසකතා සාධකයන්ට පමණක් අවධානය යොමු නොකොට රණවැල්ල විසින් ශිලා ලේඛන උපයුක්ත කොට සිදු රචිත මේ පර්යේෂණයේ දී වඩාත් ආත්ම විශ්වාසයකින් සහ ව්‍යක්ත භාවයකින් යුක්තව කරුණු ඉදිරිපත් කිරීමේ ස්වාභාවය ද මෙහි දී හඳුනාගත හැකි වේ. ඒ රණවැල්ල මහතා අභිලේඛනඥයෙකු වීම හේතුවෙනි.

පුරාතන සහ මධ්‍යකාලීන ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය පර්යේෂණගත කිරීමේ දී, රණවැල්ල තරම් විශාරදත්වයක් හෝ ව්‍යක්ත ස්වරූපයක් සිය ලේඛනයන්හි දක්වා නොතිබීම ද හඳුනාගත හැකි තවත් සුවිශේෂී ලක්ෂණයකි. සංස්කෘත, පාළි සහ සිංහල භාෂාවන්හි නිපුණත්ව පරණවිතානට සේම රණවැල්ලන්ට ද එක හා සමාන අයුරින් පැවතීම නිසා පැරණි සාහිත්‍ය මූලාශ්‍රය පිළිබඳ ප්‍රාමාණික දැනුම්වත්භාවයක් රණවැල්ලට ලැබුණි. මේ නිසාම පුරාතන ශ්‍රී ලංකාවේ ශිලා ලේඛන සහ අභිලේඛන අධ්‍යයනයන්හි දී භාෂා නිරුක්තීන් ද වඩාත් පහසුවෙන් ගෙනහැර පෑමේ සහජ හැකියාවක් රණවැල්ල සතුවි ය.

ශිලා ලේඛන සහ අභිලේඛන අධ්‍යයනයේ දී ප්‍රාමාණිකයන් ගේ සහ දුහුනන් ගේ පහසුව පිණිස ඔහු විසින් මූල බ්‍රහ්මී, පශ්චාත් බ්‍රහ්මී සහ මධ්‍යකාලීන ශිලා ලේඛනයන්හි ඇති වචන විග්‍රහ කරගැනීම සඳහා ශිලා ලේඛන ශබ්දකෝෂයක් සිංහල සහ ඉංග්‍රීසි භාශාද්වයෙන් සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය සහ Dictionary of Sinhala Epigraphical Words යනුවෙන් ප්‍රකාශයට පත් කරන ලදී. මේ කෘති ද්වීත්වය පිළිබඳව තවදුරටත් විග්‍රහයක යෙදීමේ දී හඳුනාගත හැකි මූලික ලක්ෂණයන් පිළිබඳව සිංහල සෙල්ලිපි වදන් අකාරාදියට පෙරවදනක් සපයමින් විනී විතාරණයන් සඳහන් කරනුයේ මෙවැනි ව්‍යායාමක් සිදු කිරීමට නම් ඓතිහාසික වාග්විද්‍යාව පිළිබඳ අවබෝධයක් පැවතීම ඉතාමත් අත්‍යාවශ්‍ය බව යි (සිංහල සෙල්ලිපි

වදන් අකාරාදිය 2004 : VII). අභිලේඛනඥයෙකු ගේ කාර්යභාරය වන විවිධ කාලයන්ට අයත් ශිලා ලේඛන අක්ෂරයන් කියවීම හා හඳුනාගැනීම යන මූලික කාර්යෙන් ඔබ්බට යමින් මහාචාර්ය රණවැල්ල විසින් ඓතිහාසික වාග්විද්‍යාඥයෙකු ගේ කාර්යාවලිය ද සිදුකොට තිබේ.

ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ආරම්භක අවධියේ සිට ම සිදු කරන ලද පුරාවිද්‍යාත්මක පර්යේෂණයන්හි ප්‍රතිඵල ඉංග්‍රීසි භාෂා මාධ්‍යය උපයෝගී කරගනිමින් ප්‍රකාශයට පත් කිරීම නිසා ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ හැකියාව ඉංග්‍රීසි නොදත් සාමාන්‍ය ශ්‍රී ලාංකේය ජනයාට අහිමි වූ අතර, ඒ හේතුවෙන් ඔවුන් දිවයිනේ පැරණි ශිලා ලේඛන පිළිබඳ අධ්‍යයනය කිරීමේ හැකියාවක් ද නොවී ය. විශේෂයෙන් ම, සිංහල මාධ්‍යයෙන් ජාතික විශ්වවිද්‍යාලයන්හි පුරාවිද්‍යාව හදාළ විශ්වවිද්‍යාල සිසුන් මෙ හේතුවෙන් යම් ගැටලුකාරී තත්ත්වයකට ද මුහුණ දෙනු ලැබී ය. නමුත් සිරිමල් රණවැල්ල විසින් සමාන්‍ය සිංහල භාෂාව ව්‍යවහාර කරන ජනතාව වෙත ප්‍රවේශ කරවීම සඳහා මහත් පරිශ්‍රමයක් දරනු ලැබී ය. පරණවිතාන ආදීන් විසින් ඉංග්‍රීසි භාෂාවෙන් රචනා කරන ලද ශිලා ලේඛන ග්‍රන්ථ රැසක් සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද අතර ඇතැම් ග්‍රන්ථයන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පවා පත්කොට නොමැත. රණවැල්ල ගේ මේ උත්සාහයේ වැදගත් ප්‍රතිඵලයක් වශයෙන් සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය[1] හඳුන්වාදිය හැකි ය. ඒ අනුව ඉංග්‍රීසි

1. රණවැල්ල මහතා ගේ ම හැඳින්වීමකින් මේ පිළිබඳව සඳහන් කළහොත්, ''අප රටේ මෙතෙක් ප්‍රකාශයට පත් වී ඇති පැරණි සිංහල සෙල්ලිපි සියල්ලක්ම පාහේ පළවී ඇත්තේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. ඒ බැවින් ඒ ලේඛනයන්හි දැක්වෙන පැරණි සිංහල වදන්වලට අර්ථ සපයා ඇත්තේ ඉංග්‍රීසියෙනි. ඒ අනුව මෙම ප්‍රකාශනවලින් ප්‍රයෝජන ගත හැකිවන්නේ ඉංග්‍රීසිය උගත් පාඨකයන්ට පමණි. පුරාණ සිංහල සෙල්ලිපි අධ්‍යයනය කිරීමට කැමති වැඩි ඉංග්‍රීසි දැනුමක් නැති විද්වතුන් ගේ ප්‍රයෝජනය සඳහා අර්ථ සහිත අංග සම්පූර්ණ සිංහල සෙල්ලිපි වදන් අකාරාදියක් නොමැති වීම මෙතෙක් පැවති බලවත් අඩුපාඩුවකී.'' (සිංහල සෙල්ලිපි වදන් ආකාරාදිය 2004: ප්‍රස්ථාවනාව)

භාෂාව නොදත් සිංහල භාෂාවෙන් අධ්‍යයනය සිදු කරන පර්යේෂකයන් සඳහා ද මේ කෘතියෙන් මනා පිටුබලයක් ලැබුණි.

පුරාවිද්‍යාවේ ප්‍රතිඵලයන් මුදා හරිනු ලබන්නේ ප්‍රජාව වෙත ය. නමුත් ප්‍රජාව වනාහි සිංහල භාෂාව මූලික කරගනිමින් පවතින ශ්‍රී ලංකාව තුළ සාමාන්‍ය ප්‍රජාවට මේ දත්තයන් හෝ ප්‍රතිඵලයන් තේරුම්ගැනීම හැකියාවක් නොවී ය. නමුත් රණවැල්ල මහතා විසින් සිංහල භාෂා මාධ්‍යයෙන් මේ රචනාවන් පරිවර්තනය කිරීම හේතුවෙන් සාමාන්‍ය ජනතාව වෙත පුරාවිද්‍යාව පිළිබඳ අවබෝධයක් ඇති විය. වර්තමාන පුරාවිද්‍යාත්මක සංකල්පය තුළ දී, ප්‍රජාව මූලික කරගනිමින් පුරාවිද්‍යාත්මක දැනුම ප්‍රවේශ කරවීම සඳහා මහජන/ ප්‍රජාමූලික පුරාවිද්‍යාව යනුවෙන් හඳුන්වනු ලබන නව ප්‍රවේශයක් පවතී. මේ කාර්ය මූලික වශයෙන් ආරම්භ කිරීම සිදු කරනු ලැබුවේ ඉතිහාසඥයෙකු වශයෙන් සැලකෙන මහචාර්ය රණවැල්ලයන් විසිනි. ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාව හුදෙක් කේන්ද්‍රගතවී තිබුණේ ඉංග්‍රීසි උගත් ඉහළ පංතියක් යටතේ ය. මේ පංතිය රදළ වලව් පන්තිය වශයෙන් ද හඳුන්වාදිය හැකි අතර, වලව් බසින් පුරාවිද්‍යාව සාමාන්‍ය ප්‍රජාව වෙත ප්‍රවේශ කිරීමේ මහඟු කාර්යේ ආරම්භකයා සිරිමල් රණවැල්ල නම් වූ ඉතිහාසඥයා වශයෙන් හඳුන්වා දීම මෙහි දී වැදගත් වේ. බහුතර ප්‍රජාවක් හෝ විද්‍යාර්ථීන් විසින් හඳුනා නොගත් යථාර්ථය වන්නේ ද එය යි. ඒ අනුව පුරාවිද්‍යාත්මක අර්ථයෙන් ගත හොත් සිරිමල් රණවැල්ල වනාහි වචනයේ පරිසමාප්ථාර්යෙන් ම ශ්‍රී ලංකාවේ පළමු මහජන නැතිනම් ප්‍රජාමූලික පුරාවිද්‍යාඥයා ය.

අභිලේඛනඥයෙකු වශයෙන් සිය කාර්යාවලිය තුළ දී රණවැල්ලයන් නියෝජනය කරනු ලැබුවේ හුදු අභිලේඛනඥයෙකු ගේ රාමුව තුළ සිට නොවේ. මෙරට බොහෝමයක් ශිලා ලේඛනයන් කියවා පළ කොට ඇත්තේ මහාචාර්ය සෙනරත් පරණවිතාන විසිනි. නමුත් එහිදී බොහෝවිට ඒවායේ අර්ථකථනයන් ද පරණවිතානයන් මහතා විසින් ම සිදු කරනු ලැබූ ඒවා ය. නමුත් ඒවායේ පවතින අඩුලුහුඬුකම් සහ පරණවිතානයන් නොදුටු ආවේශනයන් රණවැල්ල විසින් විචක්ෂණශීලීව විවරණය කිරීමටත් නැවතත් යථා පරිද්දෙන්

අර්ථදැක්වීමත් සිදු කොට තිබේ. ඇතැම් අර්ථකථනයන් සමඟ එකඟ නොවන රණවැල්ල ඒවා සඳහා නව අර්ථයන් දැක්වීම ද සිදු කොට තිබේ. එවැනි ආකාරයේ අර්ථනිරූපණයන් වශයෙන් පරණවිතාන මහතා විසින් ඉදිරිපත් කොට ඇති, 'වහර ල විදවි', 'මලමඬුලු', 'වැරියන්', 'දෙ බිසෙවැ දි', 'වැන්ද වදාළ', 'එක්තැන් සමියෙන්', 'ජිනපටි සතරිය කම' යනා දී වචනයන් සැලකිය හැකි ය. ඒ සඳහා 'වහර ල විදවි යන්න විහාරල සලාක කැප්පවී' යන්නත්, 'මලමඬුලු යන්නෙන් මලය රට නොව එ කල පැවති ප්‍රධාන පරිපාලන ඒකකයක්', 'වැරියන් යනු අලින් මිස කම්කරුවන් නොවන බවත්', 'දෙ බිසෙවැ දා යනු අභිශේක දෙකකින් උපන් යන්න මිස අභිශේක දෙකක් ලැබූ තැනැත්තිය නොවන බවත්', 'වැඳ වදාළ යන්නෙන් ප්‍රකාශ කොට දැන්වූ යන අර්ථය මිස වැද නමස්කාර කොට යන්න නොවන බව ද, රණවැල්ල විසින් අර්ථගන්වා තිබේ. පුරාතන ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය සහ සමාජ තත්ත්වය යන විෂය පථය රණවැල්ල විසින් වඩාත් අවධානයෙන් යුක්තව අධ්‍යයනය කරන ලද පර්යේෂණ ක්ෂේත්‍රයක් වශයෙන් ඉහතින් ද දක්වන ලදී. ඒ අනුව ඔහු විසින් මේ සුවිශේෂී ඒකකයේ දී, ඔහු විසින් කරුණු ගෙනහැර දක්වන කරුණු බොහෝ විට සමකාලීන අවධීන් නියෝජනය කරනු ලබන ශිලා ලේඛනයන්හි අන්තර්ගත කරුණු ය. ඇතැම් අවස්ථාවක දී ඔහු විසින් සාහිත්‍ය මූලාශ්‍රයන්හි දැක්වෙන තොරතරුවල දෝෂසහගත අන්වේක්ෂණයන් ශිලා ලේඛනයන්හි අඩංගු තොරතරු මඟින් නිවැරදිකොට දක්ව යි. 'අනුරාධපුර රාජ්‍යයේ දේශපාලන හා පරිපාලන සංවිධානය' යන පර්යේෂණ ලිපිය පරීක්ෂාවට ලක් කිරීමේ දී, මෙහි සඳහන් කරන ලද ප්‍රවේශයන් පිළිබඳව පැහැදිලිව හඳුනාගත හැකි ය. එහි දී අනුරාධපුර යුගයේ දී දේශපාලන අධිකාරිය තුළ සිටි නිලධාරීන් පිළිබඳව නිවැරදි වශයෙන් ශිලා ලේඛන උපයෝගී කරගනිමින් සඳහන් කරනු ලබන අතර, ඇතැම් තැනෙක දී පරණවිතාන මහතා විසින් එකී නිලධාරීන් සම්බන්ධව සිදු කරනු ලබන පැහැදිලි කිරීම්හි සදොස්තැන් වඩාත් නිරවද්‍ය ආකාරයෙන් පැහැදිලි කිරීම ද සිදු කරනු ලබ යි. උදාහරණයක් වශයෙන් අනුරාධපුර අවධියේ දී රාජ්‍ය

භාණ්ඩාගාරය භාරව සිටි මහලේ යන උසස් නිලධාරියා රජෙකු යටතේ සේවයෙහි නියුතුව සිටි මහාලේඛක වශයෙන් දක්වන ලද අතර, රජෙකුට සිටියේ එවැනි එක් මහලේවරයෙකු පමණක් බව ද සඳහන් කර යි. නමුත් රණවැල්ල තර්ක කර සිටින්නේ, භාණ්ඩාගාරය භාරව සිටි නිලධාරියා භාණ්ඩාගාරය භාරව සිටි බඩගරික වශයෙන් හඳුන්වනු ලැබූ බවත්, රජෙකු යටතේ මහලේවරුන් කිහිපදෙනෙක් ම සේවයේ යෙදී සිටි අවස්ථාවන් පිළිබඳව IV කාශ්‍යප රජු ගේ (ක්‍රි. ව. 898-914) රජු ගේ ශිලා ලිපිවලින් ඒ ආකාරයේ මහලේවරු දසදෙනෙකු හෝ එකොළොස්දෙනෙකු සිටි බවත් අනාවරණය වන බව යි (රණවැල්ල 2007: 153; Epigraphia Zeylanica, Vol II, No 4. P.16-17; Vol Iv, No 22. p. 183).

පුරාතන අනුරාධපුරයේ ආර්ථික ක්‍රමය යටතේ බදු වර්ග ගණාවක් පිළිබඳව ශිලා ලේඛන මූලාශ්‍රයේ සඳහන් වන අතර, ඒ බදු අයකරන ලද්දේ කුමක් සඳහා ද සහා ඒවායේ නිරුක්තීන් පිළිබඳව පරණවිතාන සඳහන් කරනු ලබන ඇතැම් ප්‍රකාශයන් හෝ අර්ථ නිරූපණයන් ද රණවැල්ල විසින් ප්‍රශ්නකොට තිබේ. ඒ අනුව, අනුරාධපුර අවධියේ දී වඩාත් ජනප්‍රියත්වයට පත් වූ බද්දක් වන මතෙර මජ්බක/ මතෙර මජ්බකපති නම් වූ බද්ද පරණවිතාන හඳුන්වා ඇත්තේ, ඇළ මාර්ගවලින් අල්ලාගනු ලැබූ මසුන් සඳහා ඒවා අයිතිකරුවන්ට හිමිකම් කියූ බද්දක් බව යි. නමුත් රණවැල්ල දක්වන්නේ, බහුල වශයෙන් ම මේ බද්ද බෞද්ධ භික්ෂූන් වහන්සේලා සහ ආගමික වතාවත් වෙනුවෙන් පූජා කරනු ලැබූ නිසා පරණවිතාන මහතා ගේ අදහස සමඟ එකඟ විය නොහැකි බවත්, මතෙර යන වචනය මාතෘකා යන සංස්කෘත වචනයට සමාන පැරණි වදනක් වූ මාතිර යන්න බව පෙනෙන බවත් ය (රණවැල්ල 2007: 164).

අනෙක් අතට වංසකතාවන්හි සඳහන් වන ඇතැම් සාධක ශිලා ලේඛන මූලාශ්‍රයන් මඟින් සනාතවන බව රණවැල්ල විසින් මනාව ඉදිරිපත් කරයි. ඇතැම් තැනෙක දී පරණවිතාන විසින් සාහිත්‍ය මූලාශ්‍රයන්හි සඳහන්වන තොරතරු ශිලා ලේඛනයන්හි සමඟ සමපාත නොවන බව දක්වා ප්‍රතික්ශේප කර තිබෙන අවස්ථා ද ඇත. නමුත්

රණවැල්ල විසින් ඒ අපැහැදිලි තත්ත්වයන් මනාව පිරිපහදු කොට ඉදිරිපත් කර තිබීම ද සාහිත්‍ය මූලාශ්‍රය සහ අභිලේඛ මූලාශ්‍රය යන මූලාශ්‍රයන් ද්විත්වය පිළිබඳ ඔහු ගේ පරිඥානය විශද කරන බව පෙන්නුම් කරන්නකි. එවැනි එක් අවස්ථාවක් වශයෙන්, ධාතුසේන රජු (ක්‍රි. ව. 459-477) විසින් කරවන සාලවාන විහාරය (මහාවංසය පරි 38ඃ ගාථා, 49) පිහිටි ප්‍රදේශය පිළිබඳ ඇති මතවාදය සැලකිය හැකි ය. ධාතුසේන අවධියෙන් වසර 200කට පමණ පසුව රුහුණේ පාලකයෙකු වූ පළමුවන දප්පුල රජු විසින් (ක්‍රි. ව. 659) මේ නමින් යුත් විහාරයක් රෝහණයේ ඉදි කළ බව මහාවසංයේ ම සඳහන් වේ[2] (මහාවංසය පරි 43ඃ ගාථා, 45). නමුත් මේ පළමු දප්පුල විසින් කළ සාලවාහණ විහාරයේ රුහුණේ පිහිටා තිබූ බව රණවැල්ල දක්වයි (රණවැල්ල 2016ඃ 42). නමුත් පුත්තලම දිස්ත්‍රික්කයේ විරන්දගොඩ හෙවත් විළඳගොඩ නමින් හඳුන්වනු ලබන පැරණි විහාරයක I සේන රජු (ක්‍රි. ව. 853-887) රජු ගේ ලිපියක නඳුන්නරු නම් ගමේ පිහිටි සල්වාණා නම් විහාරක් පිළිබඳව සඳහන් වේ (Epigraphia Zeylanica, Vol V, part I, p. 120). මේ විරන්දගොඩ ලිපිය පළමුවරට කිය වූ පරණවිතාන මහතා ධාතුසේන රජු විසින් ඉදිකරන ලද සාලවාන සහ සල්වාණා යනුවෙන් හඳුන්වන ලද්දේ එකම විහාරයක් බව පිළිගත්තත් (ibid.: 122). නමුත් සේන රජු ගේ ලිපියේ සඳහන් විහාරය මහාවංසයේ සඳහන් වන විහාරය නොවන බව පරණවිතාන ගේ මතය යි. එයට හේතුව වශයෙන් ඔහු සඳහන් කරන්නේ, විරඳගොඩ පිහිටියේ රෝහණයේ නවන බව ය. නමුත් කළාඔය රුහුණේ උතුරු සීමාවේ කොටසක් බවට සනාථ කොට පෙන්වන රණවැල්ල විළඥගොඩ නැතිනම් විරන්ඥගොඩ පිහිටි සාලවාන විහාරය ධාතුසේන රජු විසින් ඉදි කරන ලද විහාරය වශයෙන් පිළිගත හැකි යයි පෙන්වා දෙයි.

මේ සල්වාණා විරන්දගොඩ පිහිටි සල්වාණා විහාරය රෝහණ රාජ්‍යයට අයත් වූ බවට තවදුරටත් ශිලා ලේඛන සාධක

2. "...තමා නම් ඇති සාලවාණ විහාරය ද පිරිවෙන් වෙහෙර ද එසේ ම කතරගම ද කරවීය' (මහාවංසය පරි 43ඃ ගාථා, 45).

උපයෝගී කරගනිමින් රණාවැල්ල විසින් සනාථ කර පෙන්වා දෙනු ලබයි. ඒ අනුව කළදගවි නකර නම් ස්ථානයේ වාසය කළ අහලය නම් ඇමතියෙකු විසින් බටහිර මුහුදුතීරයේ තැනවූ අහල නම් වූ වැවකින් තමාට ලැබුණු බොජකපති නම් උදකප්‍රාප්ත බද්ද භාතිකතිස්ස රජු ගේ (ක්‍රි. ව. 22-7) බාල සොහොයුරා වූ යුවරාජ මහානාග (මහාදාඨික මහානාග) කුමරු සමඟ ඉදිකරන ලද අගලි පවත නම් චෛත්‍යට පූජාකරන ලද බව කලාඔය ආසන්නයෙන් හමු වූ තුඹුල්ලේගලින් හමු වූ භාතික තිස්ස රජු ගේ ශිලා ලේඛනයක දැක්වේ (Inscription of Ceylon Vol II, Part I, No 11, p. 13-14). කළදලවි යනුවෙන් මෙහි දී හඳුන්වා ඇත්තේ දිගාවැව රට බව දක්වන රණාවැල්ල (රණාවැල්ල 2016: 45) එය රුහුණේ පිහිටි බව දක්ව යි. මේ අනුව රුහුණේ පුරාණ සල්වාණා විහාරය වශයෙන් හඳුනාගනු ලබන විරන්දගොඩ පිහිටා ඇත්තේ තුඹුල්ලේගලට සැතපුම් පහළවක් පමණ බටහිරින් බවත්, ඉහතින් සඳහන් කළ මහනක අගළ පවත නම් ස්තූපය කලාඔයට දකුණින් එහි මෝය අසළ බටහිර වෙළර ආසන්නයේ බව ය. මෙහිදී රණාවැල්ල ශිලා ලේඛන මූලාශ්‍රය උපයුක්ත කරගනිමින් මඩකලපු දිස්ත්‍රික්කය සහ කලාඔයේ දකුණු ඉවුර අසබඩ ප්‍රදේශය පුරාතන රෝහණ දේශයට අයත් බව ද දක්වයි (එම).

අභිලේඛන අධ්‍යයනයේ දී රණාවැල්ල ගේ විශේෂ අවධානය යොම වූයේ ක්‍රි. ව. 8 වන සියවසේ සිට ඊට පශ්චාත්කාලීන අවදීන්ට අයත් අත්තාණි ශිලා ලේඛන කෙරෙහි ය. මේ ශිලා ලේඛන උපයෝගී කරගනිමින් ඔහු විසින් රෝහණ රාජ්‍යයේ දේශපාලනික, ආර්ථික සහ සමාජීය ඉතිහාසය පිළිබඳවත් අනුරාධපුර යුගය සම්බන්ධයෙනුත් ඔහු විසින් පර්යේෂණය කරමින් රචනා කරන ලද The Inscriptions of Äp Kitagbo and Kings Sena I, Sena II and Udaya II කෘතිය ඔස්සේ ඔහු ගේ තත් විෂය ක්ෂේත්‍රය තුළ දක්වන ලද ප්‍රාමාණිකත්වය මොනවට විෂද කරනු ලබ යි.

ලිපියේ ප්‍රවේශයේ දී සඳහන් කර තිබෙන ආකාරයට, ඉතිහාසඥයෙකු ගේ කාර්යභාරය පිළිබඳව ප්‍රංශ ජාතික වෝල්ටෙයාර්

විසින් දක්වන අදහස සිරිමල් රණවැල්ල විෂයෙහි වැදගත් වන්නේ එහි සඳහන් කරන ලද මූලික කරුණු ද්විත්වයට අනුව යමින් නිවැරදි ඉතිහාසයක් පිළිබඳව ශ්‍රී ලාංකේයන් ඉදිරියේ ගෙනහැරපෑමට ඔහු විසින් දක්වන ලද ප්‍රෝත්සාහය හේතුවෙනි. ඉතිහාසඥයෙකු වූ රණවැල්ල සිය ශාස්ත්‍රීය ආවේෂණයේ දී පුරාවිද්‍යාඥයෙකු ගේ කාර්යභාරය ඉටු කරන ලද්දේ අභිලේඛන ක්ෂේත්‍රය කේන්ද්‍ර කරගනිමින් ය. තුලනාත්මක දෘෂ්ටියකින් සහ විවේචනාත්මක දෘෂ්ටිය යටතේ ඔහු විසින් අතීත මානව ඉතිහාස අර්ථ දැක්වීමේ කාර්යය මනා සංයමයෙකින් සහ විචක්ෂණශීලී ස්වරූපයෙන් ගෙනහැර දැක්වූවා ය. ඒ සඳහා ඔහු සතු වූ විචක්ෂණශීලී ඉවසීම ඍෂිවරයෙකු හා සමාන විය. ඉතිහාස කරුණු විකෘතිතාවයෙන් දැක්වීම නොඉවසූ රණවැල්ලයන් අභිලේඛන මූලාශ්‍ර ඔස්සේ ඉතිහාසයේ දුරවබෝධ තැන්, නිරවද්‍ය විය යුතු තැන් පිළිබඳව සාධක සහිතව සනාත කර දැක්වීම සිදු කරන ලදී. ඉතිහාසඥයෙකුට පොත්වල පළ කළ ශිලා ලේඛන ඇසුරින් තම ශාස්ත්‍රීය අධ්‍යයනයන් කළ හැකි ය. නමුත්, නිරවද්‍ය ආකාරයෙන් ශිලා ලේඛණයන් කියවීම සිදු කළ නොහැකි ය. මන්දයත් ඒ සඳහා ප්‍රතිචීන භාෂාන්තර ඥානය කෙසේ වෙතත්, ප්‍රාචීන භාෂාන්තර ඥානය මොනවට ප්‍රගුණ කළ යුතු හෙයිනි. මහාචාර්ය පරණවිතානගෙන් පසු ශ්‍රී ලාංකේය අභිලේඛන කියවා නිවැරදි අර්ථවිවරණයක් ඉදිරිපත් කළෝ මහචාර්ය සිරිමල් රණවැල්ල නම් වූ ධීමතුන්ම විනා අනෙකෙකු නොවේ. ශිලා ලේඛන/ අභිලේඛන මාධ්‍යය උපයෝගී කරගනිමින් සාමාන්‍ය ජන සමාජය වෙත අතීත ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික සහ දේශපාලනික ස්වරූපය දැනගැනීමට මාවත සළසා දුන් මහැදුරු රණවැල්ලයන් සතු තවත් සුවිශේෂී ලක්ෂණයක් වූයේ සිය ලේඛනයන් ඔස්සේ නිරවද්‍ය සිංහල ලේඛන රීතියත්, අක්ෂර රීතියත් අනුගමනය කිරීම සහ එම රීතීන් ආරක්ෂා කිරීමට නිරන්තරයෙන් දරන ලද උත්සාහය යි.


## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය



1. කිරිබමුණේ, සිරිමා, (1972), ***'පරණවිතාන මහතා ඉතිහාසඥයෙකු වශයෙන්',*** රණවීර ගුණවර්ධන සහ ජිනදාස ලියනරත්න, (සංස්). සෙනරත් පරණවිතානඃ නූතන ශාස්ත්‍රඥයෙකු ගේ ශාස්ත්‍රීය පර්යේෂණ පිළිබඳ විචාරාත්මක විග්‍රහයක්, කොළඹඃ සංස්කෘතික ප්‍රකාශන සමාගම.
2. ***මහාවංසය,*** (2008), හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත (සංස්), නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
3. රණවැල්ල, සිරිමල්., (2016), ***රෝහණ රාජ්‍යයේ ඉතිහාසය,*** කොළඹඃ එස්. ගොඩගේ සහ සමාගම.
4. **උරුමයක ආවර්ජන,** (2007), *'අනුරාධපුර රාජ්‍යයේ දේශපාලන හා පරිපාලන සංවිධාන'*, ආර්. එල්. එච්. ගුණවර්ධන, එස්. පද්මනාදන් සහ එම්. රෝහණදීර, පූර්ව නූතන ශ්‍රී ලංකාවේ ඉතිහාස ශාස්ත්‍රවේදීත්වය, කොළඹඃ මධ්‍යම සංස්කෘතික අරමුදල.
5. රණවැල්ල, සිරිමල්., (2004), ***සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය,*** කොළඹඃ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.
6. Bronowski, J & Mazlish, B. (1963), **The Western Intellectual Tradition,** Harmondsworth: Penguin.
7. **Epigraphia Zeylanica, Vol II,** (1928), D. M. De. Z. Wickramasinghe (ED), London: Oxford University Press.
8. **Epigraphia Zeylanica, Vol IV,** (1943), S. Paranavitana (ED). London: Oxford University Press.
9. **Epigraphia Zeylanica, Vol V,** part I. (1955), S. Paranavitana (ED). Colombo: Government Press
10. **Inscription of Ceylon, Vol II, Part I,** (1983), S. Paranavitana (ED). Colombo: Department of Archaeology.
11. Ranawella, Sirimal, (1999), **The Inscriptions of Äp Kitagbo and Kings Sena I, Sena II and Udaya II,** Dehiwela: Sridevi Printers (Pvt) Ltd.

2.

# උපග්‍රන්ථය


## මහාචාර්ය සිරිමල් රණවැල්ලයන්ගේ අමුද්‍රිත ශාස්ත්‍රීය ලිපියකින් උපුටා ගත් කොටසක්...







**ආචාර්ය උපාධිය (Ph.D) ලබාගත් අවස්ථාව**



විවාහ මංගල්‍ය ඡායාරූපය



පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය සමග

## මහාචාර්ය සිරිමල් රණවැල්ලයන්
## සම්මානයෙන් පිදුම් ලැබූ වගයි...







රාජකිය ආසියාතික සංගමය
විසින් පිළිගන්වන ලද
ස්වර්ණ මුද්‍රිකාව



ජාතික උරුමයන් පිළිබඳ
අමාත්‍යාංශයෙන් පිරිනමන ලද
උරුම ප්‍රසාද ප්‍රණාම සම්මානය



රුහුණ විශ්වවිද්‍යාලයීය ආදි විද්‍යාර්ථීන්ගේ කොළඹ සංගමයේ උපහාරය



අසිරිමත් කෝට්ටේ ග්‍රන්ථය ඇගයුමට ලක් වූ අයුරු



149 වැනි පොලිස් දිනයේ දී පොලිස්පතිවරයා විසින් පිරිනමන ලද උපහාර තිළිණය




කැලණිය විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථීන්ගේ උපහාරය






**රාජකීය ආසියතික සංගමය විසින් පිළිගන්වන ලද රන් පදක්කම**



**රුහුණ විශ්වවිද්‍යාලයීය ආදි විද්‍යාර්ථීන්ගේ කොළඹ සංගමයේ නායකයින් මහචාර්ය රණවැල්ලයන්ගේ සුව දුක් විමසමින්...**

**බස්නාහිර පළාත් සෞන්දර්යය නිකේතනයේ දී
2016 ජනවාරි 9 වැනි දින පැවැති රුහුණ විශ්වවිද්‍යාලයීය
ආදි විද්‍යාර්ථීන්ගේ කොළඹ සංගමයේ වාර්ෂික මහා සභා
රැස්වීමේ දී මහාචාර්ය රණවැල්ලයන්ට හරසර....**



















**මහාචාර්ය සිරිමල් රණවැල්ලයන් විසින් රචිත ග්‍රන්ථ කිහිපයක්**




ARCHAEOLOGICAL SURVEY OF CEYLON
INSCRIPTIONS OF CEYLON
VOLUME V, PART II
PUBLISHED BY THE DEPARTMENT OF ARCHAEOLOGY
SRI LANKA.
2004


ARCHAEOLOGICAL SURVEY OF CEYLON
INSCRIPTIONS OF CEYLON
VOLUME V, PART 1
PUBLISHED BY THE DEPARTMENT OF ARCHAEOLOGY
SRI LANKA.
2001


ARCHAELOGICAL SURVEY OF CEYLON
INSCRIPTIONS OF CEYLON
Volume VII
PUBLISHED BY THE DEPARTMENT OF ARCHAEOLOGY
SRI LANKA

ARCHAEOLOGICAL SURVEY OF CEYLON


# INSCRIPTIONS OF CEYLON


VOLUME V, PART 1

CONTAINING PILLAR, SLAB AND ROCK INSCRIPTIONS
FROM 815 AD TO 923 AD

EDITED BY
**SIRIMAL RANAWELLA**
B.A. (Hons.) Ceylon, Ph.D.(London)

2001
PUBLISHED BY THE DEPARTMENT OF ARCHAEOLOGY
SRI LANKA


ARCHAEOLOGICAL SURVEY OF CEYLON
INSCRIPTIONS OF CEYLON
VOLUME V. PART I
EDITED BY
SIRIMAL RANAWELLA
ARCHAEOLOGICAL SURVEY OF CEYLON
INSCRIPTIONS OF CEYLON
Volume VII
PUBLISHED BY THE DEPARTMENT OF ARCHAEOLOGY
SRI LANKA
සිරිමල් රණවැල්ල
මායා රට ඉතිහාසය


Grantha.lk
පොළොන්නරු යුගයේ
ශ්‍රී ලංකා සිතියම
සිරිමල් රණවැල්ල
මායා රට ඉතිහාසය
(අඹන් ගඟ)
මහවැලි
ගඟ
කැලණිය
බෙන්තොට
ගිම්තොට
වැලිගම
තිස්සමහාරාම
මහානාගකුල
කතරගම

# අන්තරාවලෝකන

ශාස්ත්‍රීය ග්‍රන්ථ මාලා 01

මහාචාර්ය සිරිමල් රණවැල්ල උපහාර කලාපය

ISBN 978-624-5553-02-0

ප්‍රකාශනය
සංස්කෘතික කේන්ද්‍රය රුහුණ විශ්වවිද්‍යාලය

9 786245 553020